
dinamina.lk
@dinaminanews

# දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත


ශ්‍රී බුඩ වර්ෂ 2564ක් වූ බිනර පුර ජලවක ලත් ශනි දින | කාණ්ඩය 111 පත්‍රය 212 පිටු 16 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 22 වැනිදා සෙනසුරාදා

කොවිඩ් ව්‍යාප්තිය




# රනිල් සහ සගයෝ ජනපති කොමිසමෙන් කල් ඉල්ලති



රෝෂන් තුෂාර

රාජපක්ෂවරුන්ට හා රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව පැමිණිලි යොමු කර නඩු පවරා දේශපාලන පළි ගැනීම් කළේ යැයි කියන 'දූෂණ විරෝධී කමිටුව' ගැන කරුණු ඉදිරිපත් කිරීමට කාලය ලබා දෙන්නැයි හිටපු අගමැතිවරයා හා යහපාලන හිටපු මැති ඇමැතිවරු දේශපාලන පළි ගැනීම් පිළිබඳ විශේෂ විමර්ශන ජනාධිපති කොමිසන් සභාවෙන් ඊයේ (21) ඉල්ලා සිටියහ. පිට 02

ඡායාරූප - හිරන්ත ගුණතිලක

# ඉදිරි මාස දෙකේදී නව රාජ්‍ය සේවකයෝ 161,000ක්

ස්වර්ණා විජේකෝන්, මහින්ද අලුත්ගෙදර, සන්ධ්‍යා කරුණාරත්න



ඉදිරි මාස දෙකක කාලය තුළදී නව සේවකයන් ලෙස එක්ලක්ෂ හැට එක්දහසක පිරිසක් රාජ්‍ය සේවයට එක් වන බව සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන, රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (21) ප්‍රකාශ කළේය.

උපාධිධාරීන්ට රැකියා ලබා දෙන වැඩපිළිවෙළ යටතේ උපාධිධාරීන් 61,000කට රැකියා ලබාදෙන අතර අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ ප්‍රතිඵල යටතේ තවත් ලක්ෂයක් රාජ්‍ය සේවයට එක් වන බව ද ඇමතිවරයා පැවැසීය. පිට 02

# සැප්තැම්බර් 2 දා සිට පාසල් පෙ.ව. 7.30 සිට ප.ව. 1.30 දක්වා

සිතාරා සේනානි

කොවිඩ් වසංගතය හේතුවෙන් තිවාඩු ලබා දී යළි ආරම්භ කැරුණු රජයේ පාසල් හා අනුමත පෞද්ගලික පාසල්වල 10,11,12,13 ශ්‍රේණි සඳහා දැනට ක්‍රියාත්මක පාසල් කාලය එළඹෙන සැප්තැම්බර් 02 වැනි බදාදා සිට පෙරවරු 7.30 සිට පස්වරු 1.30 තෙක් පැවැත්වීමට තීරණය කොට ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සියලු පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අධ්‍යාපන ලේකම්වරුන්, පළාත් සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, පරිවේණාධිපතිවරුන් සහ සියලු පාසල්වල විදුහල්පතිවරුන් වෙත උපදෙස් දී ඇත.

ඒ අනුව, පාසල්වල 10,11,12 සහ 13 ශ්‍රේණි සඳහා අගෝස්තු මස අවසන් වන තෙක් පමණක් පෙරවරු 7.30 සිට පස්වරු 3.30 දක්වා පාසල් පැවැත්වේ.

# උපාධිධාරීන් 60,000කට පත්වීම් දෙන්න කැබිනට් අනුමැතිය ලැබුණා



ඇමැති, සභානායක දිනේෂ් ගුණවර්ධන

ස්වර්ණා විජේකෝන්, මහින්ද අලුත්ගෙදර, සන්ධ්‍යා කරුණාරත්න

උපාධිධාරීන් 60,000කට පත්වීම් ලබාදීම වෙනුවෙන් කැබිනට් අනුමැතිය ලැබී ඇතැයි විදේශ සබඳතා ඇමැති, සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (21) ප්‍රකාශ කළේය.

උපාධිධාරීන් රැකියා ගත කිරීමේ වැඩසටහන යටතේ අයදුම්පත් 91764ක් ලැබී තිබුණු බවත් එම පිරිස අතරින් 59556ක් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ලෙස හඳුනාගෙන තිබුණු බවත් සභානායකවරයා සඳහන් කළේය. පිට 02

# මත්ද්‍රව්‍ය ජාවාරමුන්ගේ ප්‍රධාන මාර්ගය දක්ෂිණ අධිවේගයලු

බුද්ධි තොරතුරු අනාවරණය කරයි

චන්ද්‍රිකා පෙරේරා

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මත්ද්‍රව්‍ය ප්‍රවාහන කටයුතුවලදී සිය ප්‍රධාන භූමාර්ග මාර්ගයක් ලෙස දක්ෂිණ අධිවේගී මාර්ගය යොදා ගන්නා බවට බුද්ධි අංශ තොරතුරු මගින් අනාවරණය කර තිබේ. පිට 02

# ඔස්ට්‍රේලියා අගමැතිගෙන් අගමැති මහින්දට සුබ පැතුම්

මහ මැතිවරණයෙන් ලද විජයග්‍රහණය පිළිබඳ ඔස්ට්‍රේලියානු අගමැති ස්කොට් මොරිසන් මහතා ඊයේ (21) පෙරවරුවේ අගමැති මහින්ද රාජපක්ෂ මහතාට සුබ පැතුම් එක් කළේය. පිට 02

# ජනපතිගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඡන්දයකින් තොරව සම්මතයි

ස්වර්ණා විජේකෝන්, මහින්ද අලුත්ගෙදර, සන්ධ්‍යා කරුණාරත්න

නව වැනි පාර්ලිමේන්තුවේ මංගල සභාවාරය ආරම්භ කරමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය ඡන්ද විමසීමකින් තොරව පාර්ලිමේන්තුවේ දී ඊයේ (21) සම්මත විය. පිට 02

# ඇමැති ඩලස් සමාව ඉල්ලයි

ස්වර්ණා විජේකෝන්, මහින්ද අලුත්ගෙදර, සන්ධ්‍යා කරුණාරත්න පිට 02

# විදුලිය විසන්ධි වුණේ අත්වැරැදීමකින්

පිට 02

අතිරේක සමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ) ආචාර්ය සුසන්ත පෙරේරා

වනාතවිල්ලුව සමූහ කේ.ප්‍රියංකර කළුපහන

# බෙල්ලන්විල ඇසළ පෙරහර අද

ජනතා සහභාගිත්වයක් නෑ

සුභාෂිණී සේනානායක සහ බෙරලැස්ගමුව සමූහ පිට 02

# නව ව්‍යවස්ථාව සැකසීමට අදහස් හා යෝජනා දෙන්න ශ්‍රීලනිපයෙන් විද්වත් කමිටුවක්

අනුර ප්‍රේමලාල්

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා සිය පක්ෂයෙන් ද අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විද්වත් කමිටුවක් පත් කර තිබේ. පිට 02

# මාලි රාජ්‍යය සාමාන්‍ය අතට

චන්න පද්මශාන්ත,

පසුගිය අඟහරුවාද (18) ද මාලි රාජ්‍යයේ ඇති වූ හමුදා කැරැල්ලෙන් අනතුරුව රට නැවත සන්සුන් තත්ත්වයට හැරෙමින් ඇතැයි එහි සිටින අපගේ ආරංචි මාර්ග වාර්තා කරයි. ජනාධිපති ඊබ්‍රහිම් බවුබකර් කෙයිටාගේ ආණ්ඩුව බලයෙන් පහ කිරීමට මහජන ගැලවීම සඳහා වූ ජාතික කමිටුව (CNSP) මෙහෙය වූ මේ හමුදා කැරැල්ලෙන් අනතුරුව පිට 02

# නව වැනි පාර්ලිමේන්තුවේ පළමු සභා වාරයට කාරක සභාව පත් කෙරේ

ස්වර්ණා විජේකෝන්, මහින්ද අලුත්ගෙදර, සන්ධ්‍යා කරුණාරත්න

නව වැනි පාර්ලිමේන්තුවේ පළමු වැනි සභාවාරය වෙනුවෙන් පාර්ලිමේන්තු කාරක සභාව සඳහා සාමාජිකයන් පත්කර ඇත. පිට 02

# හොරුන්ට දඬුවම් නොකළ නිසා ජනතාව අපට දඬුවම් දුන්නා

මංගල සමරවීර

දූෂිතයන්ට දඬුවම් කිරීමට 2015 වසරේදී ජනතාව ජනවරමක් ලබා දුන් නමුත් එම වගකීම නිසි ලෙස ඉටු නොවීම හේතුවෙන් මෙවර මැතිවරණයේදී ජනතාව දඬුවම් කළ බව හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතා ඊයේ (21) පැවැසීය. පිට 02

# 'රජවාසල' රට පුරාම

සුභාෂිණී සේනානායක

රාජ්‍ය සහ රාජ්‍ය අනුබද්ධිත ආයතනවල නිෂ්පාදන එකම ස්ථානයකදී මිලදී ගැනීමට හැකි වන සේ 'රජවාසල' නමින් වෙළෙඳසල් ක්‍රමයක් රට පුරා ස්ථාපිත කිරීමට වෙළෙඳ අමාත්‍යාංශයේ අවධානය යොමුව තිබේ.

දිස්ත්‍රික්ක 22 නියෝජනය වන පරිදි මෙම රජවාසල වෙළෙඳසල් ක්‍රමය රට පුරා ස්ථාපිත කිරීමට නියමිත අතර පාරිභෝගික ජනතාවට එකම වහලක් යට සිට සිය අවශ්‍යතා ඉටු කර දීම එමගින් අරමුණු කරන බවත් වෙළෙඳ අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා ප්‍රකාශ කළේය. පිට 02

# විග්නේශ්වරන්ගේ කථාවේ අනිසි කරුණු හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න

මනූෂ නානායක්කාර

ස්වර්ණා විජේකෝන්, මහින්ද අලුත්ගෙදර, සන්ධ්‍යා කරුණාරත්න

නව වැනි පාර්ලිමේන්තුවේ මංගල සභාවාරය අමතමින් උතුරු පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී සී. වී. විග්නේශ්වරන් මහතා පෙරේදා (20) පාර්ලිමේන්තුවේදී සිදු කළ ප්‍රකාශයේ ඇතැම් කරුණු හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස සමගි ජනබලවේගය පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර මහතා ඊයේ (21) කථානායකවරයාගෙන් ඉල්ලීමක් කළේය. පිට 02

# මත්ද්‍රව්‍ය වැටලීම් ගැන සොයන්න පොලිස්පතිගෙන් කමිටුවක්

සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත

මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ පසුගිය දිනවල සිදු කරන ලද වැටලීම් සම්බන්ධයෙන් සොයා බැලීමට වැඩ බලන පොලිස්පතිවරයා විසින් කමිටුවක් පත් කර තිබේ.

මෙම කමිටුවට මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා, එම කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා සහ පොලිස් නීති කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා ඇතුළු පිරිසක් පත් කර ඇති අතර ඔවුන්ට නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගන්නා ලෙස වැඩ බලන පොලිස්පතිවරයා දැනුම් දී ඇත. පිට 02

# ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරු ඩිලාන් - කැටගොඩ

ස්වර්ණා විජේකෝන්, මහින්ද අලුත්ගෙදර, සන්ධ්‍යා කරුණාරත්න




ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරුන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ඩිලාන් පෙරේරා, මහතා හා ජයන්ත කැටගොඩ මහතා පත් කරනු ලැබ ඇත. පිට 02

# එජාප ප්‍රතිසංවිධාන ගැන සරසවි ඇදුරෝ අවදියෙන්

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අවධානයෙන් සිටින බව විශ්වවිද්‍යාල ආචාර්යවරු පිරිසක් එම පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා වෙත ඊයේ (21) අවධාරණය කළහ.

වයඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය අමින්ද මෙත්සිරි මහතා ඇතුළු ආචාර්යවරුන් පිරිසක් සිරිකොත පක්ෂ මූලස්ථානයේදී රනිල් වික්‍රමසිංහ මහතා හමු වී ඒ බව සඳහන් කරමින් ඊයේ ලිපියක් භාර දුන් අතර එයින් ඔවුන් අවධාරණය කර ඇත්තේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන්නේ දේශපාලන පක්ෂ රැකුණොත් පමණක් බැවින් ප්‍රබල දේශපාලන පක්ෂයක් වන එක්සත් ජාතික පක්ෂය ප්‍රතිසංවිධානය කර රැක ගත යුතු බවයි.

පක්ෂයක් රැඳී ඇත්තේ නායකත්වයේ ක්‍රියා කලාපය මත බවත් ප්‍රතිසංවිධානය කිරීමේදී පක්ෂ නායකත්වයද ඊට ඇතුළත් විය යුතු බවද ආචාර්යවරු පෙන්වා දෙති. පිට 02

වරකාගේ සිතුවම



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
2 මුල් පිටුව

# බොහෝ ප්‍රදේශවලට ඉදිරියේ වැසි නෑ

**උපාලි කරුණාරත්න**

රට පුරා බොහෝ ප්‍රදේශවල ඉදිරි දින හයහතේ වැසි රහිත කාලගුණයක් බලාපොරොත්තු විය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පැවසීය.

එමෙන්ම බස්නාහිර, සබරගමු, මධ්‍යම පළාත් සහ ගාල්ල, මාතර දිස්ත්‍රික්කයන්හි සිහින් වැසි බලාපොරොත්තු විය හැකි බවත්, රට වටා මුහුදේ වැසි රහිත කාලගුණ තත්ත්වයක් පවතින බවත් කාර්යයේ නියුතු කාලගුණ විද්‍යාඥ මලිත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළේය.

විශේෂයෙන් කන්කසන්තුරේ, මන්නාරම හරහා පුත්තලම දක්වා සහ මාතර, හම්බන්තොට හරහා පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශ ඉදිරි දින කීපයේදී සුළගේ වේගය පැයට කි. මී 50-55 දක්වා වැඩිවිය හැකි යැයි ද කීය.

දැනට පවත්න තත්ත්වය අනුව පවතින කාලගුණ තත්ත්වයේ වෙනස්වීමක් මෙම මස අග දී බලාපොරොත්තු විය හැකි බවද මලිත් ප්‍රනාන්දු මහතා පැවසීය.

උතුරු මැද සහ වයඹ පළාත්වලත් හම්බන්තොට ත්‍රිකුණාමලය සහ මාතලේ දිස්ත්‍රික්කවල සහ මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලත් විටින් විට හමන පැයට කි.මී 40 දක්වා තරමක තද සුළං ඇතිවිය හැක.

# ලොව වටා කොරෝනා

# කැනඩාව 24 වැනි තැනට

## ආසාදිතයෝ 123,873යි

## මරණ 9,054යි

## 110,288ක් සුවය ලබති



**බුද්ධි කරුණාරත්න**

ලෝකයේ කොරෝනා ආසාදිතයන් ගණන අනුව 24 වැනි ස්ථානයේ පවතින්නේ ලොව සමෘද්ධිමත් රටක් වන කැනඩාවයි.

එරටින් කොරෝනා ආසාදිතයන් 123,873ක්, කොරෝනා මරණ 9,054ක් සහ සුවය ලැබීම් 110,288ක් වාර්තා වේ.

එරටින් මුල්ම කොරෝනා රෝගියා වාර්තා වූයේ පෙබරවාරි මුල් භාගයේය. මාර්තු අගභාගය වන විට කැනඩාවේ කොරෝනා ආසාදන ප්‍රමාණය වේගයෙන් වැඩි වීමට පටන්ගත්තේය. මැයි 3 වැනි ද වන විට එරටින් වාර්තා වූ වැඩිම කොරෝනා රෝගීන් ගණන වන 2,760කි. මැයි මුල් භාගයෙන් පසු කොරෝනා රෝගීන් වාර්තා වීමේ වේගය අඩු විය. ජූනි 2 වැනි ද වාර්තා වූ 67 එක් දිනකදී හමු වූ අඩුම රෝගීන් ගණනයි. ඊට පසුව ද රෝගීන් 565ක් වාර්තා වූ අතර, ජූලි 20 වැනි ද රෝගීන් 786ක් හමුවිය. ඉන්පසු දිනකට හමුවන රෝගීන් ගණන 700ත් 300ත් අතර උච්ඡාවචනය වෙමින් පවතිණි. අගෝස්තු 20 වැනි ද වන විට රෝගීන් 383ක් වාර්තා විය.

කැනඩාවේ කොවිඩ් රෝගීන් සුවය ලැබීමේ ප්‍රතිශතය සියයට 89කි. මෙය ඉතාම හොඳ තත්ත්වයකි. ජූනි 15ත් 17ත් අතර ක්‍රියාකාරී කොවිඩ් රෝගීන් ගණන විශාල ලෙස පහත වැටිණි. වර්තමානය වන විට එරට කොවිඩ් රෝගීන් සිටින්නේ 4,531ක් පමණි.

කැනඩාවේ කොවිඩ් මරණයක් මුලින්ම වාර්තා වූයේ මාර්තු 9 වැනි දය. අප්‍රේල් මුල් භාගයේ දී එය වේගයෙන් වර්ධනය වීමට පටන් ගත්තේය. මැයි 1 වැනි ද එය කිසියම් උච්ඡස්ථානයකට එනම් 230ක් දක්වා වැඩි වී අඩු වීමට පටන්ගත් අතර, මැයි 30 වැනි ද 94ක් වූ එය මැයි 31 වැනි ද උපරිමය වූ 222 දක්වා වැඩි විය. ජූනි අගභාගයේ අවම රෝගීන් ගණනක් වාර්තා වූ අතර, එයින් පසු එරට කොවිඩ් මරණ අනුපාතය ඉතාම අඩු මට්ටමකට පත් විය. අගෝස්තු 20 වැනි ද එරටින් වාර්තා වූයේ මරණ 5ක් පමණි.



# බස්නාහිර පළාතේ හදිසි වැටලීමකින් නීත්විරෝධී භාණ්ඩ රැසක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

බස්නාහිර පළාතේ දිනක් තුළ සිදු කළ වැටලීම්වලින් විවිධ වැරැදි වලට සම්බන්ධ සැකකරුවන් 330ක් සහ හෙරොයින්, ගංජා ඇතුළු මත්ද්‍රව්‍ය විශාල තොගයක් අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත්වී තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, දේශබන්ධු තෙන්නකෝන් මහතාගේ නියෝග හා උපදෙස් පරිදි පෙරේද (20) උදේ 6.00 සිට ඊයේ (21) උදේ 5.00 දක්වා කාලය තුළ විශේෂ වැටලීම් සිදුකර මෙම අත්අඩංගුවට ගැනීම් සිදු කර ඇත.

ඒ අනුව හෙරොයින් වැටලීම් 138කදී සැකකරුවන් 138ක් සමග හෙරොයින් ග්‍රෑම් 200 මිලි ග්‍රෑම් 289ක්, ගංජා ග්‍රෑම් 258 මිලි ග්‍රෑම් 238ක් සමග සැකකරුවන්71ක්, නීති විරෝධී මත්පැන් බෝතල් 386ක් සමග සැකකරුවන් 78ක්, ගෝඩා ලීටර් බැරල් 18ක් සමග සැකකරුවන් 12ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 253ක් සමග සැකරුවන් 10ක් අත්අඩංගුවට ගෙන ඇති අතර ගංජා මිශ්‍ර මාවා, මදන මෝදක ගුලි, දුම් කුඩු, රා, නීති විරෝධී සිගරට් සමග සැකකරුවන් 14ක් අත්අඩංගුවට ගෙන තිබේ.

ඊට අමතරව කොච්චිකඩේ පොලිස් වසමේදී නීති විරෝධී සම්බාහන මධ්‍යස්ථාන 02ක් වටලා ගණිකා සේවයේ යෙදීම සම්බන්ධයෙන් සැකකාරියන් 07 දෙනකු ද අත්අඩංගුවට ගෙන ඇත.

# මූල්‍ය අක්‍රමිකතා චෝදනාවකට හෝමාගම සභාපතිගේ ධුරය අත්හිටුවන්නැයි ඉල්ලූ පෙත්සම විභාගයට

**නෙල්කා මැදගෙදර**

අඩු ආදායම්ලාභීන්ට සෙවිලි තහඩු බෙදා දීමේදී මූල්‍ය අක්‍රමිකතාවයක් කර ඇති හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපති සම්පත් චමින්ද ජයසිංහගේ ධුරය අත්හිටුවන ලෙස ඉල්ලා ගොනු කළ රිට් පෙත්සමක් විභාගයට ගැනීමට අවසර දුන් කොළඹ මහාධිකරණ විනිසුරු ප්‍රදීප් හෙට්ටිආරච්චි මහතා, ලබන ඔක්තෝබර් මස 06 වන දින අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස බස්නාහිර පළාත් ආණ්ඩුකාර රොෂාන් ගුණතිලක මහතා ඇතුළු වගඋත්තරකරුවන් හයදෙනකුට නියෝග කරමින් ඊයේ (21) නොතීසි නිකුත් කළේය.

හෝමාගම බදු ගෙවන්නන්ගේ සංගමයේ සභාපති ගමගේ විජේරත්න විසින් මෙම පෙත්සම ගොනු කර තිබිණි.

හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපති සම්පත් චමින්ද ජයසිංහ, එහි ලේකම්වරයා, එම ප්‍රාදේශීය සභාව, බස්නාහිර පළාත් පාලන කොමසාරිස්වරයා, පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ දිස්ත්‍රික්කය) යන අය මෙහි සෙසු වගඋත්තරකරුවෝ වෙති.

ප්‍රාදේශීය සභා රීති අනුව ප්‍රාදේශීය සභාවේ අරමුදල්වල සුරක්ෂිතභාවය සහ එම අරමුදල් වැය කිරීම පිළිබඳව සභාපතිවරයා පෞද්ගලික වශයෙන් ද මුදල්මය වශයෙන් ද වගකිවයුතු බව පෙත්සම්කරු විසින් පෙන්වා දී තිබේ.

හෝමාගම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන්ට බෙදා දීම සඳහා එම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සෙවිලි තහඩු 1040 ක් මිලදී ගෙන ඇති බව සඳහන් කෙරිණි.

විශාල තොගයක් මිලදී ගැනීමේදී වෙළෙඳ පොළේ පවතින මිලට වඩා අඩු මිලකට මිලදී ගත හැකි වුවද මෙම තහඩු මිලදී ගැනීමේදී සාමාන්‍ය මිලට වඩා රුපියල් තුන්සිය අසූවක් ( 380/-) එක් සෙවිලි තහඩුවක් මිලදී ගැනීමට වැය කර ඇතැයි පෙත්සම්කරු විසින් පෙන්වා දී තිබිණි.

තත්ත්වයෙන් උසස් මිල අධික සෙවිලි තහඩු මිලදී ගන්නා බවට ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට දන්වා ඒ සඳහා අනුමැතිය ගත් ප්‍රාදේශීය සභා සභාපතිවරයා, සැබැවින්ම මිලදී ගෙන ඇත්තේ තත්ත්වයෙන් අඩු සෙවිලි තහඩු බව පෙත්සම්කරු සඳහන් කර තිබිණි.

එම සෙවිලි තහඩුවක් රුපියල් 1200කට සාමාන්‍යයෙන් අලෙවි වුවත්, ඒ සඳහා රුපියල් 2480 ක් ගෙවීමට සිය අභිමතය පරිදි සභාපතිවරයා කටයුතු කර ඇති අතර, එමගින් ප්‍රාදේශීය සභාවට විශාල මූල්‍යමය පාඩුවක් කර ඇති බව ද පෙත්සම මගින් පෙන්වා දී තිබිණි.

සිය පෞද්ගලික ලාභය සඳහා සභාවේ මුදල් අවභාවිතා කර ඇති සභාපතිවරයා, එම තහඩු මිලදී ගැනීමට අදාළ චෙක්පත් නිකුත් කර ඇති 2020.01.22 දිනට කිහිප දිනකට පසුව විදේශගතවී ඇති බව ද පෙත්සම්කරු අධිකරණයට පෙන්වා දී තිබේ.

මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට මෙන්ම බස්නාහිර පළාතේ හිටපු ආණ්ඩුකාරවරියට පැමිණිලි කළ බව ද පෙත්සම්කරු සඳහන් කර සිටී.

මෙකී අයථා ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ධුරය අත්හිටුවා පරීක්ෂණයක් පවත්වන ලෙස ද එම පරීක්ෂණයෙන් අනතුරුව ඔහු එම ධුරයෙන් ඉවත් කිරීම සඳහා නියෝග කරන මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ද පෙත්සම්කරු අධිකරණයෙන් ඉල්ලා ඇත.

නීතිඥ වටගල මහතා පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටියේය.

# කෘෂිකර්මාන්තය නංවන්න ජාතික වැඩපිළිවෙළක් තනනවා

● ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ

**ඉන්ද්‍රාණි තෝරදෙනිය**

කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකසා එය ඉදිරි දෙසතිය තුළ ජනතාවට දැනගැනීමට සළස්වනවා යැයි, කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය. ඒ මහතා එසේ පැවසුයේ ඊයේ(21) පෙරවරුවේ ගන්නෝරුව කෘෂිකර්ම පර්යේෂණායතනයේදි පැවති නිලධාරි හමුවෙන් පසු මාධ්‍යයට අදහස් දක්වමිනි.

එහිදි ඒ මහතා මෙසේද කීය. මෙම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වශයෙන් වැඩ භාරගත් පසු, දින නවයක් අමාත්‍යාංශයේ ඇති අංශයන්හි අධ්‍යයනයක යෙදුනා. ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගත්තා. ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය රටේ කෘෂිකර්මාන්තය කෙරෙහි යොමුවි තිබෙනවා.

මේ රටේ නිෂ්පාදන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා විධිමත්ව හා ක්‍රමවත්ව ඉදිරියට ගෙන යායුතුයි. අපට ඉතා ඉහළ කෘෂි තාක්ෂණයක් තිබෙනවා. නමුත් මෙම තාක්ෂණය ගමට යාමේ ප්‍රශ්නයක් තිබෙනවා. රටේ තිබෙන සම්පත් දැනුම උපයෝගී කරගෙන නිලධාරින් සමග සාකච්ඡා කොට මෙය නගා සිටුවිය හැකි විශේෂ වැඩපිළිවෙළක් සකසනවා.

එය ඉදිරි දෙසතිය තුළ ජනතාවට දැනගැනීමට සළස්වනවා. මේ රටේ විශාල මුදලක් වියදම් කරලා අප රටේ නිෂ්පාදනය කළ හැකි බොහෝමයක් ආනයනය කරනවා. ඒවා නතර කිරීමට මේ අංශ සංවර්ධනය කළ යුතුයි. අපි දවසකට අමෙරිකන් ඩොලර් බිලියනයක කිරි ආනයනය කරනවා. මෙරට කිරි නිෂ්පාදනය 35% ක් පමණයි. අපි මේ ආනයනයන් අවම කර ගැනීමට විධිමත් සැලැස්මක් ඔස්සේ ඉදිරියට යා යුතු යැයි ද අමාත්‍යවරයා වැඩිදුරටත් පැවසීය.

# සතොස සේවකයන් දේශපාලනයේ යෙදවීම ඇමැති ජොන්ස්ටන්ට එරෙහි නඩුව සැප්. 11ට කල් යයි

**සිරන්ජනි කුමාරි**

සතොස ආයතනයේ සේවකයන් දේශපාලන කටයුතුවල යොදවා ගත්තේ යැයි පවසමින් අල්ලස් කොමිසම අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ඇතුළු විත්තිකරුවන් තුන්දෙනකුට එරෙහිව කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩුව යළි කැඳවීම සැප්තැම්බර් මස 11 වැනි දිනට කල් තැබීමට ප්‍රධාන මහෙස්ත්‍රාත් ලංකා ජයරත්න මෙණෙවිය ඊයේ (21) නියෝග කළාය.

සිද්ධියට අදාළ නඩුව ඊයේ යළි කැඳවූ අතර විත්තිකරුවන් වන අමාත්‍ය ජොනස්ටන් ප්‍රනාන්දු, එරාජ් ප්‍රනාන්දු ඇතුළු විත්තිකරුවෝ තිදෙනා අධිකරණය හමුවේ පෙනී සිටියහ.

විත්තිකරුවන්ට එරෙහිව මෙම නඩුව 2015 වසරේ අල්ලස් කොමිසම අධිකරණය හමුවේ ගොනු කළ අතර, නඩුවේ සාක්කි විභාගයට දින නියම කිරීමට මේදින නඩුව යළි කැඳවීමට නියමිතය.

2010 වසරේ සිට 2014 වසර දක්වා කාලසීමාවේ වෙළෙඳ අමාත්‍යවරයා ලෙස කටයුතු කරමින් ස.තො.ස ආයතනයේ සේවකයන් එකසිය පනස් තුන්දෙනෙක් ඔවුන්ගේ නීත්‍යානුකූල රාජකාරිවලින් ඉවත් කර දේශපාලන ක්‍රියාකාරකම් සඳහා යෙදවීමෙන් රජයට රුපියල් කෝටි හතරක පාඩුවක් සිදු කළේ යැයි චෝදනා කොට ඉකුත් රජය සමයේ අල්ලස් කොමිසම එවක වෙළෙඳ අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, සහ ස.තො.ස ආයතනයේ හිටපු සභාපති එරාජ් ප්‍රනාන්දු සහ තවත් අයකුට එරෙහිව මෙම නඩුව කොළඹ මහෙස්ත්‍රාත් ප්‍රධාන අධිකරණය හමුවේ ගොනු කර තිබිණි.

# විශාලම මත්ද්‍රව්‍ය වැටලීම ගැන නීතිපති උපදෙස් ලබාගන්නැයි මත්ද්‍රව්‍ය නාශක අධ්‍යක්ෂකවරයාට කොටුව මහේස්ත්‍රාත්ගෙන් නියෝග

**සුභාෂිණී සේනානායක**

රුපියල් මිලියන 2945ක් වටිනා හෙරොයින් කිලෝ 294.490ක් අත්අඩංගුවට ගැනීමේ සිද්ධිය සම්බන්ධයෙන් නිතිපතිවරයාගේ උපදෙස් විමසා විමර්ශන ප්‍රගතිය ඉදිරි දින අධිකරණයට දැනුම් දෙන ලෙස කොළඹ මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ අධ්‍යක්ෂකවරයාට කොටුව මහේස්ත්‍රාත් රංග දිසානායක මහතා ඊයේ (21) නියෝග කළේය.

ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගත් විශාලතම හෙරෝයින් තොගය වන මෙම සිද්ධියට අදළව වැටලීම් සිදු කළ සහ විමර්ශන සිදු කළ මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධාරින් පිරිසක් යම් අයථා ක්‍රියාවන්ට සම්බන්ධ බවට අත්අඩංගුවට ගැනිමක් සිදු කර ඇති බැවින් මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන්ද අයථා ක්‍රියා සිදුව ඇති බවට සැකයක් මතුවන බැවින්ද මෙම විමර්ශණ නැවත විධිමත් අයුරින් සිදු කරන ලෙස සැකකරුවන් දෙදෙනා වෙනුවෙන් පෙනි සිටි නිතිඥවරයා අධිකරණයෙන් ඉකුත් නඩු දින සිදු කළ ඉල්ලිමට අනුව මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය සිදු කළේය.

එමෙන්ම මෙම සිද්ධියට අදළව අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගර ගතකර සිටින සැකකරුවන් දෙදෙනා තවදුරටත් ලබන සැප්තැම්බර් මස 04 වනද දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් රංග දිසානායක මහතා ඊයේ (21) නියෝග කළේය.

ස්කයිප් තාක්ෂණය ඔස්සේ බූස්ස බන්ධනාගාරයේ සිටි සැකකරුවන් දෙදෙනා නිරීක්ෂනය කළ මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය සිදු කළ අතර මෙලෙස රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කෙරුණේ මොහොමඩ් බසීර්, මොහොමඩ් අජ්මීර් සහ මොහොමඩ් රිලා අහමඩ් රිස්නි නැමැති සැකකරුවන් දෙදෙනෙකි.

මෙම සැකකරුවන් දෙදෙනා මේ වනවිට රඳවා ඇත්තේ පාතාල සාමාජිකයන් සමග බව ඔවුන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා අධිකරණයට දන්වා සිටි අතර එහිදී ඔවුන් රඳවා සිටීම සම්බන්ධයෙන් විශේෂ හේතුවක් ඇද්ද යන්න ඉදිරි දින අධිකරණයට වාර්තා කරන ලෙස මහේස්ත්‍රාත්වරයා බන්ධනාගාර අධිකාරිවරයාට දැනුම් දුන්නේය.

එමෙන්ම මෙම සිද්ධියට අදළ නඩු භාණ්ඩ වන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පත්ව ඇති බවත්, ඒ සම්බන්දයෙන් නීතිපති උපදෙස් ලබා ගන්නා බවත්, මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය අධිකරණයට දැනුම් දුන්නේය.

මෙම සිද්ධියට අදළව මේ වන විට අත්අඩංගුවට ගෙන සිටින මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධාරියකු වන පොලිස් පරීක්ෂක උදර යන අය මත්ද්‍රව්‍ය ජාවාරම් සිදු කර ඇති බවට ඔහු සම්බන්ධයෙන් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින නඩුවකදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනාවරණය කර ඇති බවත් ඒ අනුව ඔහු මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදී ඇති බවටත් අධිකරණයට සැකකරුවන් වෙනුවෙන් කරුණු දැක්වූ නිතීඥ බුද්ධික ජයසිංහ මහතා මෙම සැකකරුවන් මෙම සිද්ධියට සම්බන්ධ නැති බවත් කියා සිටියේය.

මෙහිදී අධිකරණයට කරුණු දක්වමින් නිතිඥවරයා මෙසේද කියා සිටියේය.

මෙම සිද්ධියට අදළව සැකකරුවන් ලෙස නම් කර සිටින සුමන් ෂේන් අහමඩ් හුසේන්, ඇන්තනි මාෂල් මොරිල්, මොහොමඩ් ෂෙයික් බ්‍රිෂ්, ජයසුමන සුජීව ද සොයිසා, මාකන් අබ්දුල්ලා රහීම් යන අයවළුන් අත්අඩංගුවට ගැනීමට නියමිත බව පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය අධිකරණයට දන්වා සිටියේය.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සහ පොලිස් විශේෂ බලකාය එක්ව මේ හෙරොයින් තොගය අත්අඩංගුවට ගෙන ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 2945ක් වන අතර කොළඹ, කොල්ලුපිටියේ සුපිරි වෙළෙඳ සංකීර්ණයකදී අත්අඩංගුවට ගත් හෙරොයින් තොගය කිලෝ 294.490කි.

### ඇ නැ ත්ත

වැල නොකැඩීම මත් කුඩු ආයුද අල්ලා
නඩු බඩු ලෙසට ඒ ඔක්කොම ගෙනැවිල්ලා
පරෙස්සමට තැබූ තැන් වෙත නෙත දල්ලා
පෙනුනා තිබුණු හැටි පිටතට ඇවිදිල්ලා

නිල දරුවන් ගිහින් රහසේ හොර පාරේ
හැසිරිණි කළු සල්ලි හොයමින් අවිචාරේ
වැටුපට ඉටු නොකර කටයුතු තම බාරේ
හැසිරෙන අයට එළැඹෙයි හිරගෙයි වාරේ!

**රටේමුල්ලේ මුදන්නායක**

### ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත



### ගැහැණි කාව්‍ය

රනිල් සිරිකොතේ ඉහළම පුටුවේ හිඳ සිනා සලා
දශක ගණනකට පස්සේ ඉතිහාසය වෙනස් කළා
යූඇන්පිය මැති සබයෙන් අතු ගෑවුණු විදිය බලා
ලංකා ඉතිහාස පොතෙත් සිටියි පුරාවතක් වෙලා



ගැහැණි නෝනා

# ඇවන්ගාඩ් සිද්ධියට වගඋත්තරකරුවකු කර පළ වූ මාධ්‍ය වාර්තා ගැන ශානි දැනසිටියේ නෑ

## වික්ටර් වික්‍රමසිංහ කියයි

**රෝෂන් තුෂාර**

ඇවන්ගාඩ් සිද්ධිය පිළිබඳ සී.අයි.ඩී ය වසර හතරක් විමර්ශනය කළ ද රක්නා ලංකා සභාපති එහි වගඋත්තරකරුවකු කර මාධ්‍ය වාර්තා පළ වූ කරුණ පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා දැන නොසිටි බව

මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (21) පැවැසීය.

'රක්නා ලංකා සභාපති වික්ටර් සමරවීර මහතා අත්අඩංගුවට ගැනීමට නියමිත බවට මාධ්‍යවල විශාල ප්‍රචාර ගියා. මේ ගැන අහන්න මමත්, වික්ටර් සමරවීරත් සී.අයි.ඩී යේ ශානි අබේසේකර මහතා ළඟට ගියා. ශානි අබේසේකර මහතා ඇහුවා' 'ඇයි ආවේ? මම ඒ ගැන දන්නේ නැහැ' යනුවෙන් පැවසූ බව වික්ටර් වික්‍රමසිංහ මහතා සාක්ෂි ලබා දෙමින් පැවැසීය.

එම ප්‍රකාශයෙන් පසුව ශානි අබේසේකර මහතා විසින් සී.අයි.ඩී යේ සෙනරත් අළුත්ගේ නිලධාරියාට ඔවුන්ව යොමු කළ බවත්, ඉන් පසුව වික්ටර් සමරවීර මහතා ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට රාත්‍රී 7.30ට පමණ ඉදිරිපත් කර රිමාන්ඩ් කළ බවත් පැවැසීය.

සෙනරත් අළුත්ගේ පොලිස් නිලධාරියා ඊයේ කොමිසම හමුවේ පෙනී සිටි අතර, එදින සිය රාජකාරිය නිසි පරිදි කළ බවට සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසමින් පැවැසීය.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 22 වැනිදා සෙනසුරාදා

# ජාතික ප්‍රතිපත්තිය!

ජනාධිපතිවරයා රාජාසන කතාව ඔස්සේ ඉදිරිපත් කළ ජාතික ප්‍රතිපත්ති මාලාව කෙරෙහි කාගේත් අවධානය යොමු වී ඇත. එම ප්‍රතිපත්ති මාලාව අනාගත ශ්‍රී ලංකාව ගොඩනගන සමාජ - ආර්ථික හා දේශපාලනික පදනම ලෙස අර්ථ ගැන්විය හැකිය. සංක්ෂිප්ත ලෙස ඉදිරිපත් කළ ප්‍රතිපත්ති මාලාව නිරවුල්ය. රටේ ජනී - ජනයාට පහසුවෙන්ම අවබෝධ වන සුළුය. මේ ප්‍රතිපත්ති මාලාවෙහි ඉලක්කය ඵලදායී පුරවැසියෙක්, තෘප්තිමත් පවුලක්, ගුණ ගරුක සමාජයක් හා සෞභාග්‍යවත් රාජ්‍යයක් ගොඩනැඟීම බව ද ජනාධිපතිවරයා පෙන්වා දෙයි. ඊට අදාළ ක්‍රියාන්විතය ජයග්‍රහණය කරා ගෙන යෑම සඳහා දේශපාලන අධිකාරිය, නිලධාරි පැලැන්තිය සේම රට වැසියා ද උපරිම දායකත්වය ලබා දිය යුතුව තිබේ.

එකම රටක් හා එකම නීතියක් යන්න ජනාධිපතිවරයාගේ නියමය වී තිබේ. ඒ මඟින් බිහි කරනු ලබන්නේ සමාන අයිතීන්ගෙන් යුතු සාධාරණ රාජ්‍යයකි. එය බිහි කිරීම සඳහා ව්‍යවස්ථා වෙනසක් සිදු කළ යුතු බව ද රාජ්‍ය නායකයා සඳහන් කර ඇත. පවතින ව්‍යවස්ථාවේ ඇති නිෂේධනීය ලක්ෂණ ගැන සේම 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ ඇති දුර්වලතා ගැන ද දීර්ඝ වශයෙන් සාකච්ඡා වී ඇත. මහජනයාට ඒ ගැන හොඳ වැටහීමක් ඇති බව තේරුම් ගත හැකිය. ජනාධිපතිවරණයේදී මෙන්ම මහ මැතිවරණයේදී ද ව්‍යවස්ථා වෙනසකට අවශ්‍ය ජනවරම ජනාධිපතිවරයාට හා ආණ්ඩුවට ලැබී තිබේ.

රටේ රාජ්‍ය අංශය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා කියා සිටි වැදගත් ප්‍රකාශ කිහිපයක් ඇත. දූෂණයට, නාස්තියට හා වංචාවට තරාතිරම නොබලා දඬුවම් දීම, ආයතනවලට අතිරේක සේවක මණ්ඩල බඳවා ගැනීම නවතා දැමීම, ඉලක්ක ඉටු කර ගත නොහැකි ආයතනවල වෙනස්කම් ඇති කිරීම හා සුදුස්සාට සුදුසු තැන ලබා දීම ඒ අතර, ප්‍රධාන වෙයි. මෙය පොදු නීතියක් හැටියට ක්‍රියාත්මක වුවහොත් රාජ්‍ය අංශය ඵලදායී සේවාවක් බවට පත් කළ හැකිය. රාජ්‍ය අංශයට ඉබාගාතේ දුවන්න ඉඩ දීම සුදුසු දෙයක් නොවේ. එලෙසම රජයේ ආයතන දේශපාලන කාර්යාල බවට පත්වීම ද සුදුසු නැත. කිසිදු දේශපාලන බලපෑමකින් තොරව රාජ්‍ය ආයතන පවත්වා ගැනීම නායකයාගේ අරමුණ වී තිබේ.

අප මෙතෙක් දැක ඇත්තේ දේශපාලන හයිය මත රාජ්‍ය සේවයෙහි ඉහළ පුටු හොබවන නිලධාරි පැලැන්තියකි. ජනාධිපතිවරයා එය වෙනස් කළේ ආයතනවල ඉහළ නිලධාරීන් පත් කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කිරීම මඟින්ය. රාජ්‍ය අංශයේ පාඩු ලබන ආයතන විශාල ගණනක් ඇත. එම ආයතන පාඩු ලබන්නේ දූෂණය - නාස්තිය හා වංචාව නිසාය. දේශපාලන සබඳතා සහිත ඉහළ නිලධාරීන් නාස්තියට බිය වන්නේ නැත. වංචාවට බිය වන්නේ නැත. දේශපාලනය හා දූෂණය අතර සම්බන්ධයක් පවතී. එම සම්බන්ධය බිඳ දැමීමෙන් හා වංචනික නිලධාරීන්ට තරා - තිරම නොබලා දඬුවම් දීමෙන් මේ ක්‍රමය වෙනස් කළ හැකිය.

රාජාසන කතාවෙන් හෙළිදරව් වන තවත් වැදගත් සාධකයක් තිබේ. එනම්: රටේ සෑම අංශයක් කෙරෙහිම ජනාධිපතිවරයාගේ අවධානය යොමු වී ඇති බවය. ඉඩම් අයිතිය පිළිබඳ සංකීර්ණ ගැටලුවක් මහජනයාට තිබේ. පානීය ජල අවශ්‍යතා සපුරා ගත නොහැකි දරු පවුල් ගණනාවක් ද රට තුළ සිටිති. වාරිමාර්ග පද්ධතියේ දුර්වලතා නිසා ප්‍රදේශ ගණනාවක කෘෂිකර්මය අඩාළ වී ඇත. කටුපොල් වගාව ශ්‍රී ලංකාවට බරපතළ හානියක් සිදු කර ඇත. මේවාට දෙන ස්ථාවර විසඳුම් ජනාධිපතිවරයා පැහැදිලිව සඳහන් කළේය. කටු පොල් වගාව අත්හිටුවා ඇත. සෑම දරු පවුලකටම ඉඩමක අයිතිය ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙයි. ඉදිරි පස් වසර තුළදී රටේ ජල අවශ්‍යතා සපිරීමට පියවර ගනී.

රටේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන කෘෂිකර්මයට නිසි තැන දීමට පියවර ගෙන තිබේ. පොල් වගාව යළි සක්‍රිය කිරීමට පියවර ගනී. නැවත පොල් වගාවට ආධාර හා අනුග්‍රහය ලබා දීමට තීන්දු කර ඇත. රබර් වගාව සම්බන්ධයෙන් සේම රබර් ආශ්‍රිත නිෂ්පාදන කෙරෙහි ද රජයේ අවධානය යොමු වී තිබේ. සුළු අපනයන භෝග වගාව කෙරෙහි රජය සිය විශේෂ අවධානය යොමු කර ඇත. ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිට ම කුළු බඩු අපනයනය සම්බන්ධයෙන් කීර්ති නාමයක් දිනා සිටි රාජ්‍යයෙකි. රටේ දේශගුණය, භූ-විෂමතාව මෙන් ම අනෙකුත් පාරිසරික සාධක ද සුළු අපනයන භෝග වගාවට හිතකරය. ඉන් උපරිම ඵල නෙළා ගැනීමට ක්‍රමවේද සැලැසීම ඉතා වැදගත්ය.

ජනාධිපතිවරයා සිය කතාවෙන් පෙන්වා දුන්නේ දේශීය ව්‍යවසායකයා හා සුළු කර්මාන්තකරුවා කෙරෙහි රජයේ විශේෂ අවධානය යොමු වී ඇති බවය. රටේ ආර්ථිකයේ ප්‍රධාන ගතිකය වන්නේ සුළු කර්මාන්ත හා ව්‍යාපාර යැයි කියන්නට පුළුවන. පසුගිය කාලය පුරා අනුගමනය කළ වැරැදි ප්‍රතිපත්ති නිසා ඇතැම් සුළු කර්මාන්ත වැසී ගියේය. ව්‍යාපාරිකයා දුර්මුඛ විය. මේ තත්ත්වය වෙනස් කළ යුතුය. ව්‍යාපාරිකයාට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීමට බැංකු පද්ධතිය සූදානම් කර ඇත. එය ආර්ථික හා මූල්‍ය ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වෙනසකට හේතු - සාධක වෙයි. ව්‍යාපාර දියුණු වන විට රැකියා පිළිබඳ ගැටලු ද ඉබේම විසඳෙයි.

රටේ සියලු පුරවැසියන්ගේ අපේක්ෂාව වන්නේ යහපත් හා දියුණු රාජ්‍යයකි. එහි දියුණුව ආර්ථික වශයෙන් පමණක් නොව: සමාජමය වශයෙන් ද පැවැතිය යුතුය. ගුණ ගරුක සමාජයක් යන්න ජනාධිපතිවරයාගේ තේමා පාඨයක් බවට පත් වී ඇත. යහපත් සමාජයක පාතාලය ක්‍රියාත්මක වන්නේ නැත. මත්ද්‍රව්‍ය ජාවාරම පවතින්නේ නැත. ඒ දෙකටම අවශ්‍ය ප්‍රතිකර්ම රජය හඳුන්වා දී ඇත. ජනාධිපතිවරයා සිය දේශනය අවසන් කළේ "මගේ රටට ආදරෙයි. මගේ රට ගැන ආඩම්බරයි" යනුවෙන්ය. එය රටේ සියලු පුරවැසියන්ට දුන් මහඟු ආදර්ශයකි.

දිල්රුගෙ සීවිද

| | |
|---|---|
| තව පස් වසරකින් කරළිය වෙත | එන්න |
| හිතමින් නොහැක මින් පසු සැඟවී | ඉන්න |
| ජනපති නියමයන් ඕනෑ | පිළිගන්න |
| ගරු මැතිවරුනි ජනතාවට කන් | දෙන්න |



## අඩපණ වූ ව්‍යාපාර යළි නැංවීමට

# සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද ණය යෝජනා ක්‍රමය

- ● රු. කෝටි 15,000ක් පිරිනැමීමට ඇස්තමේන්තු කර ඇත
- ● මේ වන විට රු. කෝටි 10,000ක් අනුමතයි
- ● රු. කෝටි 5,900ක් දැනටමත් දීලා
- ● තවත් රු. කෝටි 5,000ක් සඳහා වහාම අයදුම් කරන්න

කොවිඩ්-19 ගෝලීය වසංගතය හේතු කොටගෙන රටෙහි සියලු ආර්ථික කටයුතු අකර්මණ්‍ය වූ අතර සාමාන්‍ය ජන ජීවිතයද අවුල් වියවුල් තත්ත්වයකට පත් විය. නිෂ්පාදන ක්‍රියාවලිය මුළුමනින්ම අඩපණ විය. දළ දේශීය නිෂ්පාදිතයට ඉහළම දායකත්වයක් දක්වන හා ශ්‍රමබලකායෙන් වැඩි පිරිසක් සේවා නියුක්තව සිටින ස්වයං රැකියා, තනි පුද්ගල ව්‍යාපාර ද ඇතුළත්ව සියලු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තව දුරටත් පවත්වාගෙන යා නොහැකි තත්ත්වයකට පත් විය. සේවකයන්ගේ රැකියා අහිමි වීමේ අවදානමක් පැවැති අතර බොහෝ ව්‍යාපාරවලට සේවක වැටුප් පවා ගෙවාගත නොහැකි දැඩි අර්බුදකාරී තත්ත්වයකට මුහුණපෑමට සිදු විය. කෙසේ වෙතත් රටෙහි සමස්ත ක්‍රියාවලියටත්, සේවා නියුක්තියටත් කොරෝනා වසංගතය නිසා ඇති විය හැකි පීඩනය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජයේ උපදෙස් මත ප්‍රතිපත්තිමය වශයෙන් නිවැරදි ක්‍රියාමාර්ග නොගන්නට අප රටට මේ වන විටත් දරුණු ආර්ථික අවපාතයකට මුලපුරන්නට සිදු වන්නට ඉඩ තිබිණි.

## ■ සහනාධාර පැකේජය


අඩපණ වූ ව්‍යාපාර යළි නගාසිටුවීමට සහ ඒවා නැවත ආර්ථිකයේ සක්‍රිය කොටස්කරුවන් බවට පත් කිරීම සඳහා රජය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයවීම මත පුළුල් පරාසයක් දක්වා විහිදුණු මූල්‍ය සහනාධාර පැකේජයක් හඳුන්වාදෙන ලදී. කොරෝනා ව්‍යසනයෙන් මිදී නැවත මෙරට ව්‍යාපාරික ක්ෂේත්‍රය පණගැන්වීමට, අහිමි වූ රැකියා අවස්ථා යළි උදාකිරීමට සහ සමස්ත ආර්ථිකය යළිත් ප්‍රකෘතිමත්ව ඉදිරියට ගෙනයාමට රජය යෝජනා කළ මූල්‍යාධාර සහන පැකේජය "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය යෝජනා ක්‍රමය" නම් විය. මේ ණය යෝජනා ක්‍රමය මඟින් රටේ කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා යන අංශ තුනේ වී, එළවළු, පළතුරු ඇතුළු භෝග වගා, තේ, පොල්, රබර් වැනි වැවිලි ක්ෂේත්‍ර, ධීවර හා ජල සම්පත්, පශු සම්පත් ඇතුළු කෘෂිකර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත නගාසිටුවීමට ණය ආධාර සැපයේ. ඊට අමතරව කර්මාන්ත අංශයේ ඇඟලුම්, ඉදිකිරීම් , විදුලි ඉංජිනේරු, රසායනික ද්‍රව්‍ය නිපැයුම්, සම් හා රබර් ආශ්‍රිත නිපැයුම්, මුද්‍රණ කටයුතු සහ කර්මාන්ත අංශයේ සියලු සේවාවල නිරත වූවන්ට මේ ණය යෝජනා ක්‍රම මඟින් නැඟීසිටීමට අතදීම සිදු කෙරේ. එපමණක් නොව සේවා අංශයේ සංචාරක, සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ, වෙළෙඳාම, සංග්‍රහශීලි කටයුතු, ප්‍රවාහන, සෞඛ්‍ය ආරාක්ෂිත සේවා, ආහාර, ක්‍රීඩා හා විනෝද කටයුතු, අධ්‍යාපන උපකාරක පන්ති, රූපලාවණ්‍ය කටයුතු ඇතුළු අනෙකුත් සියලු සේවාවන්හි යෙදී සිට කොවිඩ්-19න් බිඳ වැටුණු ව්‍යාපාරිකයන්ට යළි ශක්තිමත්ව නැඟී සිටමට සඳහා මෙම ණය යෝජනා ක්‍රමයෙන් උපකාර සැලසීම මහ බැංකුවේ අරමුණය.

මේ වසරේ මාර්තු සහ අප්‍රේල් මාසවල දැඩි වශයෙන් ව්‍යාපාර අඩපණ වූ පිරිසට යළි නැඟී සිටීම සඳහා වාර්ෂිකව 4%ක් වැනි ඉතා අඩු පොලී අනුපාත යටතේ කඩිනමින් ණය මුදල් ප්‍රදානය කිරීම ඉලක්ක කොට තිබිණි. මෙලෙස ලබාදෙන ණය මුදල් යොදගෙන එම ව්‍යාපාර යළි නගා සිටුවාගැනීමට අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සැපයීම කොවිඩ්-19 පුනරුද ණය යෝජනා ක්‍රමයේ අරමුණයි.

ව්‍යාපාරවලට මුහුණ දීමට සිදු වූ ව්‍යසනය හේතුවෙන් සේවකයන්ගේ වැටුප් හා වේතන ගෙවීම්, ජල බිල්පත්, විදුලි බිල්පත්, ගොඩනැඟිලි කුලී ගෙවීම, සේවක අර්ථසාධක අරමුදල් (EPF), සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් (ETF) වැනි ව්‍යාපාරිකයින් විසින් බාහිර පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් ගෙවීම, කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම ඇතුළු පසුගිය මාර්තු අප්‍රේල් මාස දෙකෙහි සියලු කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට ඉඩ කඩ විවර කර දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මේ සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සම්බන්ධයෙන් යහපත් තීන්දු තීරණ ගනු ලැබූ අතර ඒ මඟින් වැටුණු ව්‍යාපාරිකයන්ට අවශ්‍ය ණය කඩිනමින් ලබාදීමට අරමුදල් සපයන ලදී. මුලින් රුපියල් බිලියන පනහක් හෙවත් රුපියල් කෝටි පන්දහක් මීට වෙන් කෙරිණ. පසුව මේ මුදල රුපියල් බිලියන එකසිය පනහක් හෙවත් රුපියල් කෝටි පහළොස්දහසක් දක්වා වැඩි කරනු ලැබිණ.

මේ විශාල මුදල මෙරට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ක්‍රියාත්මක විශේෂිත බලපත්‍රලාභී වාණිජ බැංකු සහ විශේෂිත බලපත්‍රලාභී සංවර්ධන බැංකු විසි නවයක් හරහා ගනුදෙනුකරුවන්ට ලබාදීමට පහසුකම් සපයාදෙන ලදී.

විශේෂ ලක්ෂණය වූයේ, මෙම කාරක ප්‍රාග්ධන ණය රුපියල් මිලියන විසි පහක උපරිමයකට යටත්ව ලබාදීමට මුලින් තීරණය කළ ද පසුව එය රුපියල් මිලියන පනහ දක්වා වැඩි කිරීමය. ණය මුදල ආපසු ගෙවිය යුතු අවුරුදු දෙකකින් එනම් මාස විසි හතරකිනි. එසේම ණය මුදල ලබාගත් දින සිට මාස හයක් යන තුරු ණය ආපසු ගෙවීමට අවශ්‍ය නොවන ලෙස සහන කාලයක් ද ලබා දී තිබේ. මෙම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය තුළින් ප්‍රතිලාභ ලබාගැනීමට අපේක්ෂා කරන ව්‍යාපාරිකයින් තම ඉල්ලුම් පත් මුලින් කී මූල්‍ය ආයතන විසි නවයෙන් කුමකට හෝ ඉදිරිපත් කළ යුතුය. පසුව ඒවා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තු වෙත යොමු කෙරේ. එලෙස ලැබෙන අයදුම්පත් අනුමත කොට නැවත මූල කී ආයතනය වෙත කඩිනමින් යොමු කොට ණය මුදල් ගනුදෙනුකරුවන්ට ලබාදීම සිදු කෙරේ.



ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සම්මානිත මහාචාර්ය, දේශමාන්‍ය ඩබ්. ඩී. ලක්ෂ්මන්



ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති එච්.ඒ. කරුණාරත්න



ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.එස්.කේ. ධර්මවර්ධන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට ලැබුණු අයදුම්පත් අනුමත කොට යැවීමෙන් පසු ගනුදෙනුකරුවන්ට බැංකු මඟින් කඩිනමින් ණය සපයන අතර ඒවාට අවශ්‍ය මුදල් බැංකුවලට මහබැංකුවෙන් ලබා දෙනු ලැබේ. මීට අමතරව නැවත වතාවක් ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවසායකයන්ට තවදුරටත් කඩිනමින් ණය ලබාදීම ඉලක්ක කොට මෙම ණය යෝජනා ක්‍රමය පුළුල් කරන ලදී. ඒ අනුව බැංකු විසින් තම ගනුදෙනුකරුවන් වන ව්‍යාපාරික ප්‍රජාවගේ කඩිනම් ණය අවශ්‍යතා අනුව සුදුසු ලේඛනයක් සකස්කොට මහබැංකුවේ අනුමැතිය සඳහා යොමු කරයි. මහබැංකුව අනුමැතිය ලබාදී දිනක් ඇතුළත ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදල් ලබාගැනීමට පහසුකම් සපයා ඇත.

මේ යටතේද ගනුදෙනුකරුවන්ට කඩිනමින් ණය ලබාදෙන අතර එහිදී තවත් එක් කරුණක් මහබැංකුවට අවබෝධ විය. එය නම් ඇතැම් ණය ඉල්ලුම්කරුවන්ට ණය ලබාගැනීමේදී ඇප සුරැකුම් ලබාදීමේ අපහසුතාව මතුවී තිබීමයි. එකී හේතුවෙන් ණය ලබාගැනීමට නොහැකිව අසරණව සිටි ගනුදෙනුකරුවන්ට සහනයක් සැලසීමේ අරමුණින් පොලී සහනාධාරයට අමතරව ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ද ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ ණය මුදල් ආපසු ගෙවීමේ අවදානම සැලකිල්ලට ගෙන සියයට පනහත් අසූවත් අතර ඇප සුරැකුමක් ලබාදීමට මහ බැංකුව පියවර ගත්තේය.

සියයට හතරක් වැනි පොලී අනුපාතයකට ව්‍යාපාරිකයන්ට ණය ලබාදීමට බැංකු පද්ධතියට හැකියාවක් නොමැත. මන්ද ඔවුන් අරමුදල් සපයාගනුයේ ද තැන්පතු සඳහා වැඩි පොලියක් ගෙවමිනි. එපමණක් නොව පරිපාලන වියදම්ද දැරීමට මූල්‍ය ආයතනවලට සිදු වේ. මේ බව හැඳිනගත් මහබැංකුව විසින් බැංකු පද්ධතිය ලබාදෙන සියයට හතරේ ණය සඳහා අමතරව සියයට පහක් බැංකුවලට ගෙවීමට පියවර ගනු ලැබීය.

එලෙස කොවිඩ් - 19 ගෝලීය වසංගතයෙන් අඩපණ වූ ව්‍යාපාර නගාසිටුවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 4%ක් තරම් අඩු පොලී අනුපාතයක් යටතේ "සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද ණය යෝජනා ක්‍රමය" 1, 2, 3 අදියර ලෙස මේ වන විට ක්‍රියාත්මකය. මේ වන විට ප්‍රතිලාභීන් 36500කගේ ණය ඉල්ලුම්පත්වලට රුපියල් බිලියන 100ක් නැතිනම් රුපියල් කෝටි 10000ක ණය මුදලක් අනුමත කොට ඇත. මේ විශාල මුදලින් මේ වන විට රුපියල් බිලියන 59ක් නැතිනම් රුපියල් කෝටි 5900ක් ප්‍රතිලාභීන් 30000කට බැංකු මඟින් ලබා දී ඇත. මෙය ක්‍රියාත්මක වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් උපදෙස් මතය. ලංකා බැංකුව සහ කොමර්ෂල් බැංකුව විසින් මේ වන විට ඉන් වැඩිම මුදලක් පිරිනැමීමට කටයුතු කර තිබේ.

## ■ ව්‍යාපාර බලගැන්වීම

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මෙම මුදල් ලබාදීම මඟින් යළි පණගැන්වීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, සහ අගමැති හා මුදල් ඇමැති මහින්ද රාජපක්ෂ මහතාගේ අරමුණ වී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාර බලගැන්වීමට ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ලෙසද, පොලී සහනාධාර සහ ඇප ආවරණ ණය යෝජනා ක්‍රම ලෙස, ගනුදෙනුකරුවන්ට මෙම ණය ලබාගැනීමට පහසුකම් සපයා ඇත. කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රම යටතේ ණය ලබාගැනීමට ඉල්ලුම් කරන අයදුම්කරුවන්ගෙන් අයැදුම්පත් බාරගැනීම ලබන අගෝස්තු මස 31 දක්වා දීර්ඝ කොට ඇත.

මේ අන්දමට රටේ ආර්ථිකය බලගැන්වීමට ලබාදෙන දිරිදීම් ප්‍රයෝජනයට ගනිමින් ඉදිරියට ඒමට කටයුතු කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව සමස්ත ව්‍යාපාරික ප්‍රජාවට ආරාධනා කර සිටී. එය පිළිගෙන ශක්තිමත්ව නැඟී සිටීමට මෙරට ව්‍යාපාරික ප්‍රජාව සමත් වේ නම් එය සෞභාග්‍යයේ ඉදිරි දැක්ම සාර්ථක වීමට සපයන සුවිසල්ම ශක්තිය වේ.

මෙලෙස කඩිනමින් ණය යෝජනා ක්‍රම ඇති කර ආර්ථික පුනර්ජීවනය ළඟා කර ගැනීමේ මූලික අපේක්ෂාව ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය හා ශ්‍රී ලංකා මහබැංකුව සමඟ එක්ව කටයුතුකරන බැංකු ආයතන බෙහෙවින් අගය කළ යුතු මට්ටමේ සහයෝගයක් දක්වමින් සිටී. මෙම ක්‍රියාවලිය අවසානයේදී අපේක්ෂිත ආර්ථික පුනර්ජීවනය රට තුළ ඇති වනු ඇතැයි ශ්‍රී ලංකා මහබැංකුව තරයේ විශ්වාස කරයි.

**ජයසිරි මුණසිංහ**
**ඡායාරූපය - නිරෝෂන් බටේපොල**





# නව රජයේ පළමු පාර්ලිමේන්තු සැසියේ විශේෂ අවස්ථා

නව රජයේ පළමු පාර්ලිමේන්තු සැසිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (20) පැවැත්විණි. එම පළමු සැසියෙන් පසුව පැවැති තේ පැන් සංග්‍රහය අතරතුර දී කැමරා ඇසට හසු වූ සුවිශේෂ අවස්ථා කිහිපයක් මෙසේ ය.

















ඡායාරූප - ජනාධිපති මාධ්‍ය අංශය

## ජල ගැලීම්වලින් තොර කොළඹ නගරයක්

# මුතුවැල්ල ගංවතුර පාලන උමං මගේ වැඩ අවසන්

**චන්දිමා කරුණාරත්න**

කොළඹ අගනගරය ආශ්‍රිත ප්‍රදේශයන්හි ඇති වන ජල ගැලීම් හේතුවෙන් සිදු වන අහිතකර භෞතික හා සාමාජීය, ආර්ථික බලපෑම අවම කිරීම සඳහා උතුරු කොළඹ නව මුතුවැල්ල ගංවතුර පාලන උමං මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ඊයේ (21) සමාප්ත කෙරිණි.

එම උතුරු කොළඹ නවමුතුවැල්ල භූගත උමං මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2019 වර්ෂයේදී ආරම්භ විය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන මේ දැවැන්තම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම්, නැවත පදිංචි කිරීම් සඳහා සමස්ත පිරිවැය රුපියල් මිලියන 3450කි.

'කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය' නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක් වේ. මේ ව්‍යාපෘතියේ මුළු වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 321ක් වන අතර එයින් ඇමරිකන් ඩොලර් මිලියන 213ක් ලෝක බැංකුවෙන් සහනදායී ණය පදනම මත ලැබෙන අතර ශ්‍රී ලංකා රජය එම ව්‍යාපෘතියට ඇමරිකන් ඩොලර් මිලියන 108ක් ආයෝජනය කර තිබේ.

උතුරු කොළඹ ප්‍රදේශයේ ඇතිවන ගංවතුර තත්ත්වය පාලනය කිරීම සඳහා අලුත් මාවත ප්‍රධාන ඇළ මාර්ගයට සම්බන්ධ කර ආරම්භ වන මේ උමං මාර්ගය නව මුතුවැල්ල ප්‍රදේශය හරහා භූගතව ගමන් කර මුතුවැල්ල ධීවර වරාය අසලින් මුහුදට විවෘත වේ. විෂ්කම්භය මීටර් 03ක් වන මේ උමං මාර්ගයේ ඇතුළත ඝන කොන්ක්‍රීට් ආස්තරීකරණයකින් සමන්විත වන අතර උමගේ දිග මීටර් 778කි. උමග ආරම්භක කොටස කෙටි විවෘත ඇළ මාර්ගයක් ලෙස ඉදිවනු ඇත. ඉන්පසුව භූගත උමං මාර්ගයක් ලෙස තත්පරයකට ජලය ලීටර් 15,000ක් මුහුදට මුදා හැරිය හැකිය.

නවමුතුවැල්ල උමගේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා වන මූලික ශක්‍යතා අධ්‍යයන කටයුතු හා සැලසුම් 2018 වසරේදී ආරම්භ කළ අතර ඉදිකිරීම් කටයුතු පළපුරුදු විදේශීය සමාගමක් වන චයිනා පෙට්‍රෝලියම් පයිප් ලයින් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් සහ ඉදිකිරීම් අධීක්ෂණය යූෂින් ඉංජිනියරින් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් සිදු කරනු ලැබිණි. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව යටතේ මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.






මේ ව්‍යාපෘතිය සඳහා නව මුතුවැල්ල අලුත් මාවත ග්‍රාම නිලධාරී වසමේ ජීවත්වන පවුල් දැනුවත් කර ඇති අතර පවුල් 150කට අයත් ඉඩම් හෙක්ටයාර් 1.719 ක ප්‍රමාණයක් රජයට පවරාගෙන මේ උමග ඉදි කෙරිණි. ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලියේදී නිවාස හා ඉඩම් අහිමිවූවන්ට නිවාස හා වන්දි ගෙවීමට රුපියල් මිලියන 647ක පිරිවැයක් දරා ඇත. නිවාස අහිමි වූ පවුල් 63කට මෙත්සඳ සෙවන නිවාස සංකීර්ණයෙන් නිවාස ලබාදීමට මීට වසර දෙකකට පෙර නැවත පදිංචිකිරීම් අවසන් කර ඇත.

කොළඹ අගනගර කලාපයේ පවතින වැසි ජලය නිසා ඇතිවන ජල ගැලීම් දුෂ්කරතා අවම කර නාගරික යටිතල පහසුකම් නැංවීම හා පළාත් පාලන ආයතනවල හැකියාවන් වර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙට දැනටමත් වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවමින් සිටි. ඒවාගේම කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් උප ව්‍යාපෘති 55ක් ක්‍රියාවට නැංවෙන අතර ඉන් උප ව්‍යාපෘති 45ක් මේ වන විට නිමා කර ඇත. මේ නිමාකර ඇති ව්‍යාපෘති අතර ගාලු පාර හා ආර්.එල්.ද. මැල් මාවත ප්‍රතිසංස්කරණය, කොළඹ නගර ශාලා චතුරස්‍රයේ ආදර්ශ කලාපය සංවර්ධනය, බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානය සංවර්ධනය හා කාක දූපත වෙරළ උද්‍යානයේ නවීකරණයන් සිදු කළ ව්‍යාපෘති අතර ප්‍රධාන වේ.

දැනට ක්‍රියාවට නැංවෙන ව්‍යාපෘති 10 අතුරින් කොළඹ තදසන්න ප්‍රදේශවල ගංවතුර අවම කිරීම සඳහා ක්‍රියාත්මක කොලොන්නාව හා මාදිවෙල නැගෙනහිර ජල හැරවුම් ඇළ මාර්ග නවීකරණය කිරීම, අඹතලේ, ශාන්ත සෙබස්තියන් උතුර හා දකුණ පොම්පාගාර ඉදිකිරීම ආදිය ඇතුළත් වේ. මෙයට සමගාමීව මීටර් 1100ක් වන ප්‍රධාන උමං මාර්ගයකින් හා මීටර් 2500ක් වන අතුරු උමං මාර්ග තුනකින් සමන්විත ටොරිංටන් ප්‍රධාන උමං මාර්ගය කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාල ප්‍රදේශයෙන් ආරම්භ වී බෞද්ධාලෝක මාවත ඔස්සේ ගමන් කර බම්බලපිටිය වෙරළ තීරයෙන් මුහුදට වැටේ.

නව මුතුවැල්ල උමං මාර්ගය ඉදිකිරීමෙන් පසුව කාලාන්තරයක් පැවැති ජල ගැලීම් පාලනයට ස්ථිර විසඳුමක් ලැබෙන අතර කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිවලට ජල ගැලීම් වලින් තොර කොළඹ නගරයක් ඇති කිරීමට හැකි වේ.

මේ අවස්ථාවට රාජ්‍ය ඇමැති නාලක ගොඩහේවා සහ පා.ම. ප්‍රේමනාත් සී. දොලවත්ත මහත්වරු සහභාගි වූහ.

**ඡායාරූප - රංජිත් අසංක**

---

## රටේ අභිවෘද්ධියට ගැළපෙන නව ව්‍යවස්ථාවකට සහාය දෙන්න

### › බෙල්ලන්විල රාජමහා විහාරාධිපති බෙල්ලන්විල ධම්මරතන නාහිමි

**සුභාෂිණී සේනානායක, බොරලැස්ගමුව සමූහ**

රටට ගැළපෙන රටේ අභිවෘද්ධියට ගැළපෙන නව ව්‍යවස්ථාවක් සාදා ගැනීමට සහාය වන ලෙස බෙල්ලන්විල රාජමහා විහාරාධිපති ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නාහිමියෝ විපක්ෂයෙන් සහ රටේ සමස්ත ජනතාවගෙන් ඉල්ලා සිටිති.

විරුද්ධ පක්ෂය හැමදාමත් කුහකත්වයෙන් කතා කරනවා වෙනුවට අවංකව මේ කාරණය පිළිබඳව තේරුම් ගත යුතු බවත් නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට සහාය දෙමින් රට සුරක්ෂිත කිරීමට එක් වන ලෙසත් උන්වහන්සේ විපක්ෂයෙන් ඉල්ලා සිටිති.

ඒ සඳහා වර්තමාන රජයට ශක්තිය ධෛර්ය ඇති බව රාජාසන කතාවෙන් පැහැදිලි වෙන බව පවසන උන්වහන්සේ ඊට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට තමන් වහන්සේ සහ මේ රටේ මහා සංඝරත්නයේ ආශිර්වාදය පුද කරන බවත් රාජාසන කතාවේ සඳහන් කළ පරිදි හැකිතාක් ඉක්මනින් 19 වැනි සංශෝධනය වෙනස් කර නව සංශෝධනයක් ගෙන එමින් නව ව්‍යවස්ථාවක් සකස් කරනු ඇතැයි තමන් වහන්සේ විශ්වාස කරන බවත් කියා සිටියහ.

ඒකීය රටක් එකම නීතියක් යන සංකල්පය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ අවධානය රාජාසන කතාවේදී අනාවරණය වුණා. එක රටක් එක නීතියක් සංකල්පය මේ රටේ හැමදාමත් තිබුණා. මහා සංඝරත්නය මෙන්ම රටට ආදරය කරන නායකයන් සහ ජාතීන් ද මේ ගැන කතා කළා. නමුත් මේ කාර්යයට කෙලින්ම කතා කර කටයුතු කරන්න කිසිදු නායකයෙක් ඉදිරිපත් වුණේ නැහැ. එක පළාතකට ගිහින් එක් කතාවක් සහ තවත් පළාතකට ගිහින් තවත් කතාවක් කියන්න අපේ රටේ නායකයන් කටයුතු කළා. ජනාධිපතිතුමා පැහැදිලිව එක රටක් එක නීතියක් සංකල්පය බව පැහැදිලිවම කියනවා. ඒක මේ රටේ ජනතාවට වැදගත්. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා අපේ රට පසුගිය වසර හතර හමාර තුළ බරපතළ ලෙස විනාශයකට පත් වුණා. පසුගිය පාලන කාලය හොරකම, වංචාව මෙන්ම දූෂණය වර්ධනය වූ යුගයක්. 19 වැනි ව්‍යවස්ථාව අතිශයින්ම දුර්වල ව්‍යවස්ථාවක්. හැකිතාක් ඉක්මනින් එය වෙනස් කළ යුතුයි.

---

## ජනපතිගේ ප්‍රතිපත්තිය යථාර්ථයක් කිරීම මහජන නියෝජිතයන්ගේ යුතුකමයි

### › බහිරවකන්දේ ශ්‍රී මහා බෝධි විහාරාධිපති යටවත්තේ ධම්මානන්ද නාහිමි

**අසේල කුරුළුවංශ**

රටේ ඒකීයභාවය සුරක්ෂිත කරමින් සියලු ජනකොටස්වල සහාය ඇතිව රට ගොඩනගන ප්‍රායෝගික වැඩපිළිවෙළ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අන්තර්ගත බවත් මහජන ඡන්දයෙන් තේරීපත් වූ මහජන නියෝජිතයන් සියලු දෙනාගේ යුතුකම හා වගකීම රට තුළ එය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා අවංකව කැපවීම බවත් මහනුවර බහිරවකන්ද ශ්‍රී මහා බෝධි විහාරාධිපති, ශාස්ත්‍රපති යටවත්තේ ධම්මානන්ද නාහිමියෝ පවසති.

ජනපති ඉදිරිපත් කළේ රට දිනවන වැඩපිළිවෙළක් මිස පක්ෂයක් හෝ පුද්ගලයකු වැජඹෙන වැඩපිළිවෙළක් නොවන බවත් මේ නිසා ආණ්ඩු පක්ෂය පමණක් නොව විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ සහාය ද ඒ සඳහා ලබා දිය යුතු බවත් ජනපතිතුමන් පවසන පරිදි දැන් රටේ පක්ෂ හා විපක්ෂ ලෙස දෙකොටසක් සිටිය නොහැකි බවත් උන්වහන්සේ කීහ.

බහිරවකන්ද ශ්‍රී මහා බෝධි විහාරස්ථානයේදී මාධ්‍ය හමුවක් පවත්මින් පෙරේදා (20) ධම්මානන්ද නාහිමියෝ මේ බව ප්‍රකාශ කළහ.

පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන ආරක්ෂා කිරීමටත්, බෞද්ධ උරුමය රැක ගැනීමටත් විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීම අගය කරන බවද විහාරාධිපති හිමියෝ පැවැසූහ.

අමාත්‍යාංශවලට ලබා දී තිබෙන ඉලක්ක සපුරනවා ද නැද්ද යන්න සම්බන්ධව අධීක්ෂණයක් සිදු කිරීම ඉතා යහපත් පියවරක් බවත් ඉලක්කයක් ඇතිව වැඩ කිරීමේදී තමන්ටම තමන් පිළිබඳව නිසි තක්සේරුවක් කළ හැකි බවත් කී උන්වහන්සේ අයාලේ යමින් තිබූ රට දැන් නිවැරදි මාර්ගයට යොමුව තිබෙන බව ද අවධාරණය කළහ.

---

## දේශපාලන පළි ගැනීම් පිළිබඳ විශේෂ විමර්ශන ජනාධිපති කොමිසම

### ඇවන්ගාඩ් විමර්ශනයට වසර 4යි

## රක්නා ලංකා සභාපති සම්බන්ධ බව සීඅයිඩී අධ්‍යක්ෂ දන්නේ නෑ

### › වික්ටර් වික්‍රමසිංහ සාක්ෂි දෙයි

**රෝෂන් තුෂාර**

ඇවන්ගාඩ් සිද්ධිය පිළිබඳව සී.අයි.ඩීය වසර හතරක් විමර්ශනය කළ ද රක්නා ලංකා සභාපති එහි වගඋත්තරකරුවකු කර මාධ්‍ය වාර්තා පළ වූ කරුණ පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා දැන නොසිටි බව වික්ටර් වික්‍රමසිංහ මහතා දේශපාලන පළි ගැනීම් පිළිබඳ කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (21) පැවැසීය.

"රක්නා ලංකා සභාපති වික්ටර් සමරවීර මහතා අත්අඩංගුවට ගැනීමට නියමිත බවට මාධ්‍යවල විශාල ප්‍රචාර ගියා. මේ ගැන අහන්න මමත්, වික්ටර් සමරවීරත් සී.අයි.ඩී යේ ශානි අබේසේකර මහතා ළඟට ගියා. ශානි අබේසේකර මහතා ඇහුවා. ඇයි ආවේ? මම ඒ ගැන දන්නේ නැහැ" කියා පැවසූ බව වික්ටර් වික්‍රමසිංහ මහතා සාක්ෂි දෙමින් කියා සිටියේය.

එම ප්‍රකාශයෙන් පසුව ශානි අබේසේකර මහතා විසින් සී.අයි.ඩීයේ සෙනරත් අළුත්ගේ නිලධාරියාට ඔවුන්ව යොමු කළ බවත්, ඉන් පසුව වික්ටර් සමරවීර මහතා ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට රාත්‍රී 7.30ට පමණ ඉදිරිපත් කර රිමාන්ඩ් කළ බවත් පැවසීය.

සෙනරත් අළුත්ගේ පොලිස් නිලධාරියා ඊයේ කොමිසම හමුවේ පෙනී සිටි අතර, එදින සිය රාජකාරිය නිසි පරිදි කළ බවට සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසමින් ප්‍රකාශ කළේය.

## දිවි නැගුම දූෂණ ගැන පැමිණිලි කළේ නැහැ කිසිදු දීමනාවක් නැතුව එළියට දැම්මා

### › හිටපු 'දිවි නැගුම' අධ්‍යක්ෂ

**රෝෂන් තුෂාර**

දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අක්‍රමිකතා පිළිබඳව තමන් දූෂණ විරෝධී කමිටුවට හෝ පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයට පැමිණිල්ලක් නොකළ බව හිටපු දිවිනැගුම අධ්‍යක්ෂ හේවාහැටගේ සුමනපාල මහතා ඊයේ (21) දේශපාලන පළි ගැනීම් පිළිබඳ විශේෂ විමර්ශන ජනාධිපති කොමිසම හමුවේ පෙනී සිටිමින් පැවසීය.

තමන් මාස දෙකක තාවකාලික වැඩ බලන දිවිනැගුම අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ බවත් පැවසූ සුමනපාල මහතා, තමන් සිදු කළ එකම දෙය නම් එවකට ඇමැතිවරයාගේ හා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුදැනුම මත පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට දිවි නැගුම දෙපාර්තමේන්තුවට ඇතුළු වීමට අවසර දීම පමණක් බව ප්‍රකාශ කළේය.

හිටපු දිවි නැගුම අධ්‍යක්ෂ සුමනපාල මහතාගේ පැමිණිල්ලක් මත නඩු පවරා දේශපාලන පළිගැනීමක් කළේ යැයි සඳහන් කරමින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතා පැවරූ පැමිණිල්ලේ වගඋත්තරකරුවකු ලෙස පෙනී සිටිමින් සුමනපාල මහතා එසේ පැවසීය.

වගඋත්තරකාර සුමනපාල මහතා දිවිනැගුම අධ්‍යක්ෂවරයාව සිටි මාස දෙකක කාලය තුළ සිදු කළ රාජකාරි කටයුතු පිළිබඳව ලිපි ගොනුවක් ද කොමිසමට ඉදිරිපත් කළේය.

**කොමිසමේ සභාපති** - ඔබට යමක් කීමට ඇත්නම් එය සාක්ෂියක් ලෙස ඉදිරිපත් කරන්න පුළුවන්. ඔබ තමයි මේ පැමිණිල්ල කර තිබෙනවා කියන්වා.

**සුමනපාල මහතා** - මම දන්නේ නැහැ ස්වාමීනි. මම මාස දෙකයි සේවය කළේ තාවකාලිකව, වැඩ බලන පදනම මත. මම කළ එකම දෙය තමයි එවකට ඇමැතිගේ හා ලේකම්ගේ අනුදැනුම මත දිවි නැගුම දෙපාර්තමේන්තුවට එෆ්.සී.අයි.ඩීයට ඇතුළට එන්න දීපු එක. දීමනාවක්වත් නැතුව මාව එළියට දැම්මා.

**කොමිසම** - ඔය කරුණ පොලිස් කටඋත්තරයක් ලෙස අද ලබා දෙන්න. ඉදිරි දිනයේදී ඔබේ කරුණු කොමිසමට ඉදිරිපත් කරන්න පුළුවන්.

---

## භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ වැරදි සොයන්න ඇමැති නියමයෙන් ත්‍රිපුද්ගල කමිටුවක්



**අමෝදා ජයමහ**

භූ විද්‍යා හා පතල් කාර්යාංශය හොර ගුහාවක් යැයි සඳහන් කරමින් එම ආයතනයේ සභාපතිවරයා විසින් කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් තමන් පූර්ණ අවධානය යොමු කර ඇති බවත් ඒ සඳහා විමර්ශනයක් සිදු කිරීමට ත්‍රිපුද්ගල කමිටුවක් පත් කල බවත් පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා ප්‍රකාශ කළේ ය.

අමාත්‍යංශ අතිරේක ලේකම් වන වෛද්‍ය අනිල් ජාසිංම මහතා මේ සම්බන්ධව එක දිනක් තුළ මූලික විමර්ශණ වාර්තාවක් සකස් කරනු ලැබ ඇති අතර එම මූලික විමර්ශන වාර්තාව අමාත්‍යවරයා වෙත ඊයේ (21) භාර දෙනු ලැබී ය.

පරිසර අමාත්‍යාංශයේ ඊයේ (21) පැවැති මාධ්‍ය සාකච්ඡාවක් අමතමින් අමාත්‍යවරයා මේ බව පැවසී ය.

වැඩිදුර අදහස් දැක් වූ අමාත්‍යවරයා මෙසේ ද කී ය. මේ කමිටුවේ සභාපතිවරයා වශයෙන් රාජ්‍ය පරිපාලන පළාත් සභා අමාත්‍යාංශයේ නිලධාරියෙක් ද, පරිසර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙක් හා අභ්‍යන්තර විගණන නිලධාරියෙක් ද වෙනවා. දූෂිත පුද්ගලයන් කවුරුන් වුව ද තරාතිරම නො බලා ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනවා. රාජ්‍ය ආයතන සියල්ල වංචාවෙන් දූෂණයෙන් තොර ස්ථාන බවට පත් කිරීම සඳහා රජයේ වැඩපිළිවෙළට අනුව මේ කමිටු විමර්ශන වාර්තාව සති දෙකක් තුළ මට ලබා දීමට කටයුතු කරන්න උපදෙස් දෙනවා. මීට සම්බන්ධ කිසියම් පුද්ගලයෙක්, පාර්ශ්වයක් හෝ කණ්ඩායමක් වගකිව යුතු බව හෙළිවුව හොත් ඔවුන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගන්න පසුබට වන්නේ නෑ. මාධ්‍යවේදීන් වන ඔබත් එක්ක මේ කටයුතු සහයෝගයෙන් කර ගැනීමේ අවශ්‍යතාවය අපට තියෙනවා. ප්‍රධාන වශයෙන්ම පරිසරය සමඟ කටයුතු කරන කොට මාධ්‍ය මගින් විශාල මෙහෙවරක් කළ හැකියි. විවිධ සිද්ධීන් පිළිබඳව වරින් වර චෝදනා එල්ල වෙනවා. යෝජනා ද ඉදිරිපත් වෙනවා. අපි බොහොම කඩිනමින් වැඩ කරන්න බලාපොරොත්තු වෙනවා. අපට එල්ල වී තිබෙන චෝදනා පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීම අවශ්‍යයි. ආයතන තුළ වංචා දූෂණ වනවා කියා මාධ්‍යවල පළ වුවත් අවශ්‍ය වන්නේ මේ ආයතන පිරිසිදු ආයතන බවට, වංචාවෙන් දූෂණයෙන් ආයතන බවට පත් කරන්නයි.

**ජයාරූපය - හිරන්ත ගුණතිලක**

---

## 'ඉටුකම' කොවිඩ් 19 අරමුදල මිලියන 1567 ඉක්මවයි

ආයතනිකව හා පෞද්ගලිකව ලැබෙන පරිත්‍යාග හා සෘජු තැන්පතු සමග 'ඉටුකම' කොවිඩ් 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ ශේෂය රුපියල් මිලියන 1567 ඉක්මවා තිබේ.

ධනුක නදිරංග මහතා රුපියල් 2,500ක්, නීතිඥ එස්. කේ. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා රුපියල් 50,000ක්, එල්. එන්. කේ. පී. ජයකොඩි මහතා රුපියල් 1,000ක් සහ ඩබ්ලිව්. ඩී. දෙව්දුනු චාමිකර පුතු රුපියල් 603ක් අරමුදලට පරිත්‍යාග කළහ. අදාළ පරිත්‍යාග අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ජනාධිපති කාර්යාලයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත භාරදෙන ලදී.

කොරියාවේ සිට පැමිණි ශ්‍රී ලාංකිකයන් පිරිසක් රුපියල් 112,800ක්, ඩබ්ලිව්. සිසිර ගුණතිලක මහතා රුපියල් 25,000ක්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය රුපියල් 473,870.82ක්, ප්‍රියන්ත කළුබෝවිලගේ මහතා රුපියල් 15,000ක්, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 696,297.01ක්, ශ්‍රී ලංකා ජාතික රෝහලේ විශේෂඥ වෛද්‍ය කේ. දිසානායක මහත්මිය රුපියල් 177,000ක්, මුදල් කොමිෂන් සභාවේ සභාපති යූ.එච්. පලිහක්කාර මහතා රුපියල් 50,000ක් සහ මුදල් කොමිෂන් සභාවේ සාමාජික වී. කනගසභාපති මහතා රුපියල් 50,000ක් අරමුදලට පරිත්‍යාග කර තිබේ.

දැන් ඉටුකම කොවිඩ් - 19සෞඛ්‍යය හා සමාජ ආරක්ෂණ අරමුදලේ ශේෂය රුපියල් 1,567,551,476.66කි.

දෙස් විදෙස් පරිත්‍යාගශීලීහු ගිණුමට දායක වී සිටිති. චෙක් පත් හෝ ටෙලි ග්‍රාෆ් සම්ප්‍රේෂණ මගින් මෙන්ම www. itukama. lk වෙබ් අඩවිය ඔස්සේ හෝ #207#අමතා අරමුදලට දායකවිය හැකි. දුරකථන අංක 076-0700700/ 011-2320880/ 011-2354340/ 011 - 2424012 ඇමතීමෙන් වැඩි විස්තර දැන ගත හැක.

---

## පාකිස්තාන මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශකගේ සේවය අගයයි

නික්ම යන පකිස්තාන මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් සජාඩ් අලී මහතා ඊයේ (21) දින උදෑසන යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා හමුවූ අතර එහිදී, කර්නල් සජාඩ් අලී මහතා ශ්‍රී ලංකාව තුළ සේවය කළ කාලය තුළ සිය මතකයන් මෙන්ම වසර ගණනාවක් තිස්සේ ත්‍රිවිධ හමුදාව සමඟ පැවති මිත්‍රශීලී සබඳතාවයන් ද යළි ආවර්ජනය කළේය.

2009 මැයි මාසයට පෙර වන්නි ප්‍රදේශයේ පැවති මානුෂීය මෙහෙයුම්වල තීරණාත්මක අවස්ථාවන්වලදී පාකිස්තාන හමුදාව ලබා දුන් සහයෝගය පිළිබඳව සුහද හමුව අතරතුරදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා සිහිපත් කළේය. යුද්ධ හමුදාධිපතිවරයා අසල්වාසි රටක් ලෙස ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට අඛණ්ඩ පුහුණු අවස්ථා සහ පහසුකම් සැලසීම පිළිබඳව සිය කෘතඥතාවය මෙන්ම ඒ මහතාගේ අනාගත අපේක්ෂාවන් වෙනුවෙන් සිය සුභාශිංසනයක් ද පළ කළේය.

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට පාකිස්තාන හමුදාවේ උපරිම සහයෝගය ලබාදෙන බවට සහතික වූ කර්නල් සජ්ජාඩ් අලි මහතා ශ්‍රී ලංකාවේ කොවිඩ් - 19 වෛරසය පාලනය කිරීම සඳහා යුද්ධ හමුදාධිපතිවරයා දැක්වූ කැපවීම සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් අතර එලදායී සේවා සබඳතා පවත්වාගෙන යාම වෙනුවෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා



සිදුකළ අනුපමේය මෙහෙවර පිළිබඳව සිය කෘතඥතාවය පළ කළේය. අන්‍යෝන්‍ය සුහදත්වය හා අවබෝධය තවදුරටත් ශක්තිමත් කරමින් දෙපාර්ශවය අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදු කෙරිණි.

---

## කටුපොල් වගාව තහනම් කිරීම ජනපති ගත් දූරදර්ශී තීරණයක්

### › රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

**අනුර ප්‍රේමලාල්**

කටුපොල් වගාව තහනම් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ගත් දූරදර්ශී තීරණය ඉතාම ඉහළින් ඇගයීමට ලක් කරන බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාවේ සිදු වන මරණවලින් 75%ක් ඇතිවන්නේ දියවැඩියාව, පිළිකා, හෘදරෝග, අධිරුධිර පීඩනය වැනි බෝනොවන රෝග නිසාවෙන් බව ද ඊට ජනතාව පෙළඹී සිටින අසුභ ආහාර සංස්කෘතිය නිසා බව පෙන්වා දෙන එම සංගමය මේ නිසාම අපගෙන් ගිලිහෙන පාරම්පරික ඥානය ජනගත කිරීමේ අරමුණින් පොල්තෙල් වෙනුවෙට කටුපොල් තෙල් (පාම් තෙල්) ඇතුළු විවිධ තෙල්වර්ග භාවිතයෙන් සිදුවන සෞඛ්‍ය හා පාරිසරික හානිය පිළිබඳ සම්මන්ත්‍රණයක්ද විෂයට අදාල විද්වතුන්ගේ සහභාගිත්වයෙන් ඉකුත් (15) පැවැත්වීමට කටයුතු යොදා තිබිණි. නැවතත් පාරම්පරික ආහාර රටාවට ජනතාව පුරුදු කරවන ලෙස මෙන්ම වස විසෙන් තොර සුරක්ෂිත ආහාර රටාවක් තහවුරු කරන නීති සම්පාදනය කරන ලෙසට ද එම සංගමය ඉල්ලීමක් කර සිටී. ලොවම වෙලා ගත් කොවිඩ් 19 නව කොරෝනා වසංගතය ද අපට බෝ නොවන රෝග වසංගතයේ බරපතලකම පිළිබඳ කියාදෙන පාඩම නම් කොවිඩ් මරණවලින් 96%කට හේතුව් ඇත්තේ බෝ නොවන රෝගයකින් පෙළීමයි. බෝවන රෝගවලට වඩා වර්තමානයේ බෝනොවන රෝග වසංගතයක් බවට පත්ව ඇති බව එම සංගමය පෙන්වා දෙයි.

---

## අගනුවර ප්‍රසිද්ධ පාසලක සිසුවා පැදවූ ජීප් රියට හමුදා නිලධාරියා යට වෙයි

### සති 3ක් ගියත් පොලීසිය නිහඬයි

අගනුවර ප්‍රසිද්ධ පාසලක සිසුවකු පැදවූ සුඛෝපභෝගී ජීප් රථයකට යටවීමෙන් යතුරුපැදියක ගමන් ගත් යුද හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු බරපතළ තුවාල ලැබ කළුබෝවිල රෝහලේ සති තුනකට අධික කාලයක් නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියත් කිරුළපන පොලිසිය විසින් මේ වනතුරු සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර නැතැයි තුවාලකරුගේ පාර්ශ්වය චෝදනා කරයි.

කොළඹ බේස්ලයින් පාරේ කිරුළපන හයිලෙවල් පාරට ආසන්නව ඉකුත් ජූලි 24 වැනිදා දහවල් 1.15ට පමණ මේ අනතුර සිදුව ඇති අතර සුඛෝපභෝගී ජීප් රථයෙන් අධික වේගයෙන් පැමිණ ඇති සැකකාර පාසල් සිසුවා විසින් යතුරුපැදියේ පිටුපසින් හප්පා ඇතැයි ද වාර්තා වේ. අසල සීසීටීවී කැමරාවල ද එම අනතුර සහිත දර්ශන තිබී ඇති බවත් වාර්තා වේ.

තුවාල ලැබූ බන්දුල ජයරත්න නමැති යුද හමුදා නිලධාරියා මේ වන විට අධික තුවාල සහිතව ඉතාමත් අසරණව එක් පාදයක් සිව්පොළකින් කැඩී සැත්කම් කීපයකට යොමුකිරීමට නියමිතව ඇති බවත් වාර්තා වේ. සැකකාර ශිෂ්‍යයාගේ පාර්ශ්වයෙන් මේ වනතුරු කිසිවකු තුවාලකරුගේ සුවදුක් විමසීමට හෝ පැමිණ නැතැයි ද සිද්ධියට අදාළ කිරුළපන පොලිසිය මේ අනතුර අධිකරණය හමුවට ඉදිරිපත් කර නැතැයි ද තුවාලකරුගේ පාර්ශ්වය චෝදනා කරයි.

මේ සම්බන්ධයෙන් කිරුළපන පොලිසියේ ස්ථානාධිපතිවරයාගෙන් කරන ලද විමසීමකදී හෙතෙම කියා සිටියේ සැකකාර ශිෂ්‍යයා පොලිස් ඇප පිට නිදහස් කර ඇති බවත්, ඉදිරියේදී සැකකරුට එරෙහිව නඩු පැවරීමට ක්‍රියා කරන බවයි.

# අනාගතය උකසට නොතබා
# රාජ්‍ය සේවය ගොඩනැඟීම



මූල්‍ය හා ආර්ථික විශ්ලේෂක
ආනන්ද අමරවංශ

> කඩා හැලෙන රාජ්‍ය අංශය ගොඩ ගැනීමට නම් කළ යුතුව පවතින්නේ පවත්නා රාජ්‍ය ව්‍යාපාර හා ආයතන වසා දැමීම නොව, ඒවා දේශපාලනයෙන් හා අවිධිමත් පාලනයෙන් මුදාගෙන මූල්‍ය සම්පත් නිසි ලෙස හැසිරවීම හා වෘත්තීය කළමනාකාරිත්වයන් එම ආයතන හා මෙහයුම් ආයතනවල ස්ථාපිත කිරීමය. රාජ්‍ය අංශය සඳහා වැඩි වශයෙන් වෘත්තිකයන් බිහි කිරීම හා බඳවා ගැනීමත් ඔවුන්ට ස්වාධීනව වැඩ කළ හැකි පරිසරයක් බිහි කිරීම හා ප්‍රතිපත්තිමය වශයෙන් නිසි ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමත් අප්‍රබුද්ධ දේශපාලනඥයන්ගේ අණසකට ඔවුන් යටත් නොකිරීමත් මේ සඳහා ඉටු විය යුතු ප්‍රමුඛ කාර්යයන් වේ.

රාජ්‍ය ව්‍යවසාය බිඳ වැටීම හා රාජ්‍ය මූල්‍ය අර්බුදය මෑත කාලයේ අප රට තුළ අත් දුටු ආර්ථික පරිහානියේ ලක්ෂණයකි. මෙහි පරිපාකය කරා මේ වන විට අප ළඟා වෙමින් සිටින අතර එහි වගකීම පැවරෙන්නේ කවුරුන් වෙතද? එහි රාජ්‍ය සේවකයන්ගේ හා දේශපාලනඥයන්ගේ භූමිකාව කුමක්ද?

අද රාජ්‍ය සේවකයා කටයුතු කරන්නේ අකාර්යක්ෂම හා යල්පැනගිය පරිපාලන රටාවක් සහිත ක්‍රම වේදයන්ගෙන් යුතු අසංවිධිත හා අවකළමනාකරණ බලපෑම් සහිත රාමුවකය. මෙය ගොඩනැගී ඇත්තේ ඔවුන්ගෙන්ම නොව රාජ්‍ය ප්‍රතිපත්ති, දේශපාලන වාසි පිණිස කරන ලද මූලික ප්‍රතිසංස්කරණ හා ඒ අනුව වෙනස් නොවුණ පරිපාලන ක්‍රමවේද හා අවකළමනාකරණ ක්‍රියාකාරකම් මත වන අතර අසංවිධිතව සිදුවන අසම්මත දේශපාලන බලපෑම්වල අනිටු විපාක එය වඩාත් උග්‍ර කර ඇත. ඒ සඳහා ඇති පිළියම කුමක් ද?

අප රටේ දේශපාලන ආයතනික රටාව වෙනස් වූද පරිපාලන ව්‍යුහය තවමත් සැකසී ඇත්තේ නිදහසට පෙර පැවති වෙස්මිනිස්ටර් රාමුව ඇතුළතය. වෙස්මිනිස්ටර් පදනමේ දේශපාලන ව්‍යුහයේ ප්‍රධාන කුලුනු ත්‍රිත්වය වන්නේ ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණයයි. මේවායේ එකිනෙකට අනන්‍ය වූ කාර්ය භාරයන් පවතින අතර එකිනෙකට ආවේණික වූ බලයක් හා නිදහසක් ද ඒවාට ඇත. ඒ අනුව ආර්ථික හා මූල්‍ය කළමනාකරණය හා පරිපාලනය විධායක කාර්යයක් වූ අතර දේශපාලනඥයන් ඒවාට සම්බන්ධ වූයේ සීමා සහිතවය. මෙම විධායක කාර්ය බෙහෙවින් වෘත්තීය වන අතර ව්‍යවස්ථාදායකය එසේ වූයේ නැත. ඒ නිසා ව්‍යවස්ථාදායක බලයෙන් විධායකය මැඩපැවැත්වීම සිදු කිරීම අසීරු විය.

## ප්‍රතිසංවිධාන

1978 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයෙන් පසු ශ්‍රී ලංකාව මෙම දේශපාලන පදනමින් ඉවත් වූ අතර ඒ වෙනුවට ප්‍රංශ ක්‍රමය වූ විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දුන්නේය. මේ ක්‍රමය අනුව ජනාධිපති, විධායකයේ මෙන්ම අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියාද විය. එහිදී විධායක බලය වඩ වඩාත් දේශපාලකයන් අතට පත්වූ අතර බල තුලනය විනාශ වී සිවිල් පරිපාලනය දේශපාලනීකරණය වී එහි ප්‍රධානියාද දේශපාලන හිතවතෙක් විය. බොහෝ රාජ්‍ය ව්‍යවසායන්ද රේඛීය අමාත්‍යංශ හරහා මෙම පාලනයට යටත් විය.

වර්තමානයට ගැළපෙන පරිදි සිවිල් සේවාවේ වෙනසක් මෙහි දී සිදු නොවුණ අතර වෙස්ට්මිනිස්ටර් ක්‍රමය තුළම එය තව දුරටත් නීති රෙගුලාසි මත සිරගත විය. රටේ ආර්ථික හා මූල්‍ය කළමනාකරණයට අවශ්‍ය ව්‍යවස්ථාමය ප්‍රතිසංවිධාන ගැන කිසිවකු උත්තන්දු වූයේද නැත. මෙහි දී සිදු විය යුතු වෙනස්කම් වූයේ ප්‍රමිතගත ක්‍රම හා විධි අනුව වෘත්තීය පිරිසක් විසින් රාජ්‍ය යන්ත්‍රණය මෙහෙයවනු පිණිස ප්‍රතිසංවිධානයන් කිරීමය.

ව්‍යවස්ථාදායකය දේශපාලනීකරණය වන නමුත් පරිපාලනය එසේ විය යුතු නැත. පරිපාලනය සඳහා දේශපාලනය සම්බන්ධ විය යුත්තේ පටු සීමාවක් හරහාය. වස්ථාදායකය විසින් අනුමත කරන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පරිපාලනයෙන් බලාපොරොත්තු වන අතර, සාමූහික හා ස්ථිර ප්‍රතිපත්ති රාමුව සකසා බලධාරි කිරීමෙත් හා එය ක්‍රියාත්මක කිරීමේ වගකීම පරිපාලකයන් වූ රාජ්‍ය සේවකයන් වෙත පැවරීමෙන් පසුව ස්වාධීනව එය ඉටුකිරීම සඳහා අවස්ථාව ඔවුන්ට ලබා දිය යුතුය. එම නෛතික රාමුව තුළ ප්‍රමිතිගත තත්ත්වයන්ට අනුව ක්‍රියාත්මක වීම හා වාර්තාකරණය ඔවුන්ගේ වගකීම හා වගවීම වන අතර, සමාලෝචනය හා පසුවිපරම් කිරීම නිසි තොරතුරු මත හා විධිමත් සීමාවන් තුළ සිදු කිරීම දේශපාලන අධිකාරීන්ගෙන් බලාපොරොත්තු වේ. පරිපාලකයා දේශපාලනඥයකු වීම හෝ දේශපාලනඥයා පරිපාලකයකු වී කටයුතු කිරීමට යාමෙන් මේ සුමට ක්‍රියාවලිය අර්බුදයකට ලක්වේ. කිසිදු ප්‍රමිතියකට නැති දේශපාලන රටාවක සිටිමින් ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය නොසළකා පරිපාලනයට හා ආයතන කළමනාකරණයට ඇඟිලි ගැසීමට යැමෙන් දේශපාලනඥයා කරන්නේ හිතු මතයට රාජ්‍ය පාලනය අයාලයේ යන තත්වයකට පත් කිරීමය.

නිසි පුද්ගලයන් නිසි ලෙස ස්ථානගත නොවීම, වෘත්තීයමය ප්‍රවේශයක් රාජ්‍ය අංශයේ ස්ථාපිත නොවීම, ස්ථිර හා ජාතික ප්‍රතිපත්ති ව්‍යවස්ථාගත නොවීම, ප්‍රමිතිගත ක්‍රමවේදවලින් නිසි තොරතුරු වාර්තාකරණයක් නැතිවීම හා තීරණ අවධිමත් වීම, මූල්‍ය කාර්ය සාධනයේ විනිවිදභාවයක් නොවීම, වෘත්තීය උපදේශනයන් නොගෙන වැරදි දේශපාලන තීරණයන් මත අසීමිත ලෙස අනාගතය උකසට තබා, වර්තමානය නඩත්තු කරන, රාජ්‍ය අංශ බිඳ වැටීම යනාදිය දිගින් දිගටම සිදු විය. කාලයක් පුරා වර්ධනය වූ මෙම ව්‍යසනකාරී තත්වයේ සමස්ත ප්‍රතිඵලය වී ඇත්තේ රාජ්‍ය අංශයේ බිඳ වැටීමයි. මනා කළමනාකාරිත්වයක් නොමැතිවීම මත සිදුවිය හැකි අනිටු ප්‍රතිඵලය හා එයට යම් තරමකින් හෝ පිටිවහලක් විය හැකි කරුණු ම විසින්ම මෙවැනි පුවත්පත් ලිපි මගින් වරින් වර පෙන්වා දී ඇත. වරෙක මා පෙන්වා දුන්නේ පරිපාලනය දේශපාලනීයකරණයවීමෙන් කළමනාකාරිත්වය පස්සදෙරින් පැන යන බවය. දැන් කීමට ඇත්තේ එය පැනගොස් ඇති බවය. මෙය රාජ්‍ය ව්‍යාපාර ක්ෂේත්‍රයේ වැඩි වශයෙන් සිදුව ඇති අතර අනෙකුත් අංශයන්වලද අනුගත කළමනාකාරිත්වය ස්ථාපිත කිරීම වැලැකීමට එය හේතුවක් වී ඇත.

රාජ්‍ය ව්‍යවසාය ඇතුළු සියලු රාජ්‍ය ආයතන, ඒවා වානිජමය වුවද නැතද, වර්තමාන විගණන පනතට යටත් පාර්ලිමේන්තුවට වගකියන හා භාණ්ඩාගාර අධීක්ෂණයට ද යටත් සංවිධාන වේ. කොතරම් පුළුල් ජාතික වපසරියක අධීක්ෂණයකට, පසු විපරමකට හා විගණනයකට ප්‍රතිපාදන තිබුණ ද රාජ්‍ය ආයතන සුමගට ගමන් නොකිරීම කණගාටුවට කරුණකි.

නිරන්තරයෙන් ලැබිය යුතු මූල්‍ය හා කාර්ය සාධන තොරතුරු නිසි කලට ලබා ගැනීමට අසමත්ව තිබීමත් ඒවා ලැබුණත් නිසි තීරණ ගැනීමට නිර්ණායකයන් නොතිබීමත් ප්‍රධාන ගැටලුවක් වශයෙන් මෙහිදී අවධාරණයට ගැනේ. දැනට මෙම තොරතුරු කාලීනව ලැබෙන්නේ 520කටත් වැඩි ආයතන සංඛ්‍යාවකින් 11%කට ආසන්න ප්‍රමාණයකින් බව නිරීක්ෂණ තොරතුරු හෙළි කරයි. මෙම ප්‍රමාණයෙනුත් නිසි ලෙස වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන්නේ 20%ක් පමණි. එය මුළු රාජ්‍ය ව්‍යවසායන්ගෙන් 2% පමණ වන බැවින් මෙහි බැරෑරුම්කම වටහා ගත හැකිය.

පාඩු ලබන එහෙත් උපාය මාර්ගික වශයෙන් වැඩි වැදගත්කමක් ඇති රාජ්‍ය ව්‍යාපාරවල සමස්ත අලාභය මෑත කාලයේ රුපියල් බිලියන 80 ඉක්මවන බව පෙනී යයි. එය මුළු රාජ්‍ය ආදායමින් 4.3% ක ප්‍රමාණයකි. වර්ෂයක් පාසා මෙම අලාභයන්ගේ වර්ධනයක් මිස අඩුවක් දක්නට නොලැබේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, විදුලි බල මණ්ඩලය ගුවන් හා ප්‍රවාහන සේවා පාඩු ලබන ආයතන අතරින් ප්‍රධාන වේ. මේවා උපයෝගී සේවා වීමද විශේෂත්වයකි. ඛනිජ තෙල් නීති ගත සංස්ථාවේ ස්කන්ධය ඉක්මවා වගකීම් වාර්තාවේ. සමාගම් බවට පත් කළ රාජ්‍ය ව්‍යාපාර සඳහා ද නිසි ලෙස භාණ්ඩාගාර පාලනයක් හෝ අය-වැය පාලනයක් නැති නිසා පාර්ලිමේන්තු වගවීමෙන් ද මිදී අවකළමනාකරණයන්ට ලක් වෙමින් පවතී.

රාජ්‍ය අංශයට වැටෙන ව්‍යාපාර හා වානිජමය කාර්යය මෙම කතිකාවේදී වඩාත් අවධාරණයට ලක් කළ යුතු අතර කාර්යක්ෂමතාව හා ඵලදායකත්වය අපේක්ෂා කරමින් හා සාධාරණ ලාභයක් ලබමින් ජනතාවට සේවයක් කිරීමට බිහි කළ නමුත් ව්‍යාපාර පදනමක් ඇති මෙම ආයතන අලාභ ලබන්නේ කෙසේ ද යන්න මෙහි දී ප්‍රශ්නගත වන අතර අලාභ මත පෞද්ගලීකරණය කිරීම, මහජන ව්‍යාපාරවලින් රජය බැහැරවීම හෝ ජනතාවගේ බදු මුදල්වලින් ඒවා නඩත්තු කිරීම හැර වෙනත් විකල්පයක් ඒ සඳහා නොවන්නේද? යන්න විමසීමට ලක් විය යුතුය.

රාජ්‍ය සංස්ථා වෙළෙඳපොළ මගින් මෙහෙයවනු ලැබුවද නිසි ක්‍රමවේදවලින් ඒවා පාර්ලිමේන්තුවේ අධීක්ෂණයට ලක් විය යුතුය. වෙස්ට්මිනිස්ටර් ආකෘතියේ මොරිසොනියන් සංකල්පය ඔස්සේ රාජ්‍ය ආයතන සංස්ථාගතවූ අතර එහි ලක්ෂණය වූයේ රාජ්‍ය සංස්ථාවන්ට සමාජීය (ජනතා) මුහුණුවරක් දීමත් එහි දෛනික කළමනාකාරිත්ව කටයුතු කරගෙන යැමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉඩ සලසා දීමත්ය. ඇමරිකා එක්සත් ජනපද ජනාධිපතිවරයෙකු වූ රූස්වෙල්ඩ් පැවසූ පරිදි සංස්ථාවක් රාජ්‍යය බලයෙන් වෙලාගෙන ඇතත් පෞද්ගලික ආයතනයක නම්‍යතාවය හා නිරුක්තිය පවතී. එහිදී වැදගත් වන්නේ කළමනාකාරිත්වයයි. ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද රාජ්‍ය සංස්ථාවන්ටද ඒවා පොදු නම් පෞද්ගලීකරණයට ඒවා ලක්වන්නේ ඇයි? අපගේ සංස්ථාවල බොහෝ විට කළමනාකාරිත්ව නම්‍යතාවයක් නොමැති අතර, දේශපාලන නැඹුරුව හා අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සුදුසුකම් ලත් කළමනාකරුවන් පත් නොවීම හා රාජ්‍ය බලයෙන් නොව දේශපාලන බලයෙන් ඒවා වෙළාගෙන තිබීම මත දෛනික කළමනාකාරිත්වය ගිලිහී ඇත. මේ නිසාම රාජ්‍ය බලයේ නියෝජිතයා වූ මධ්‍යගත පාලන අධිකාරිය සමග පැවැති සම්බන්ධතාවයද දුරස්ථවෙමින් මූල්‍ය විනය හා පරමාර්ථ සාධනය ද බිඳ වැටී ඇත.

## සංස්ථා පරමාර්ථ

රාජ්‍ය සංස්ථා ලංකාවට හඳුන්වා දුන්නේ 1950 දීය. ගුණසේනද සොයිසා හා ලෝක බැංකුව විසින් දෙන ලද වාර්තාවක් පසුබිම් කරගෙන වාණිජමය කාර්යයන් සඳහා වඩා ස්වාධීන බවට වූ පිළිගැනීම මත ලංකාවේ සංස්ථා බිහි විය. මොරිසෝන් සංකල්පය තුළ අමාත්‍යංශය හා අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථා පාලනයට ඉහළින් සිටියද මෙම විභේදයෙන් හට ගත් විෂමතාවය ඒකරාශී කිරීමට මධ්‍යම පාලන අධිකාරියක් වශයෙන් මහා භාණ්ඩාගාරයට ඒ සඳහා ඇතුළත්වීමට පසුව සිදු විය. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නමින් වූ වෙනම ඒකකයක් මගින් භාණ්ඩාගාර අධීක්ෂණයට සංස්ථා හා වාණිජමය කාර්ය නතුවූයේ ඒ අයුරිනි.

මේ අනුව පාර්ලිමේන්තුව වෙනුවෙන් සංස්ථාවන් අධීක්ෂණය කිරීමේ බලයක් මහා භාණ්ඩාගාරය වෙත පැවරී ඇති බව නොරහසකි. ඒ හැර සංස්ථා සම්බන්ධයෙන් තීරණ ගැනීම අවස්ථා කීපයක් යටතේ බෙදී තිබිණි. එනම්;

බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය - අමාත්‍ය මණ්ඩලය

මිල ප්‍රතිපත්තිය - රේඛීය අමාත්‍යංශය

ආයෝජන - මුදල් අමාත්‍යංශය

කෙසේ වෙතත් පෞද්ගලික ආයතනයක පැවතිය යුතු නම්‍යතාව මෙම ව්‍යුහය තුළ රාජ්‍ය සංස්ථාවන්ට ලැබුණේද යන්න ප්‍රශ්නගතය. එහෙත් එවැනි ව්‍යුහයක් අවශ්‍ය වූයේ සංස්ථා පිහිටුවීමේදී අත් කර ගැනීමට අපේක්ෂා කළ අනෙක් පරමාර්ථ නිසාය. මෙම පරමාර්ථ පහත සඳහන් ආර්ථික කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉවහල් කරගෙන තිබිණි.

- ආදායම් ප්‍රතිව්‍යාප්තිය
- ප්‍රාදේශීය සංවර්ධනය
- සාධාරණ මිලකරණය
- රැකියා සම්පාදනය

මෙයින් පෙනී යන පැහැදිලි කරුණක් නම් පෞද්ගලික ආයතනයක පවතින නම්‍යතාවයට වඩා ප්‍රමාණ කළ නොහැකි පරමාර්ථ රාශියක් ඔස්සේ සංස්ථා අගය කළ යුතුවූ බවයි. එහෙත් මූල්‍යමය සම්පත් නාස්තියකින් හෝ අරපරෙස්සම් රහිත ක්‍රමයකින් හෝ අසමතුලිත ක්‍රමයකින් ඉහත පරමාර්ථ ඉටු කර ගැනීමක් කිසිසේත් අදහස් කෙළේ නැත. ලාභ උපරිමය ඒකායන පරමාර්ථයක් නොවුවද වියදම් අවමය එහි වාණිජ පරමාර්ථයක් විය යුතුව තිබිණි.

## භාණ්ඩාගාර පාලනය

රාජ්‍ය ව්‍යාපාර ආදායම ඒකාබද්ධ අරමුදලට බැර නොවුණද එම මුදල් අධීක්ෂණය කිරීමේ වගකීමක් 1971 අංක 38 දරණ මුදල් පනතේ 8(3) වගන්තිය මගින් මහා භාණ්ඩාගාරයට ලැබේ. පාර්ලිමේන්තුව මගින් අනුමත කර රාජ්‍ය ව්‍යවසායන් වෙත දෙනු ලබන මුදල් නිසි ලෙස හා ඵලදායි ලෙස යොදවනු ලබන බවට එම ආයතන විසින් පාර්ලිමේන්තුවට වග කිව යුතුය. මුදල් නිකුත් කිරීම වියදමක් වශයෙන් වාර්තා කිරීම නොව එයින් ජනිත වූ වත්කම් හා සේවා සාධනය සලකා පසු විපරම් මත වාර්තාකරණය විය යුතුය.

භාණ්ඩාගාරය පෙනී සිටින්නේ පාර්ලිමේන්තුව හෙවත් ජනතාවට ඉටු විය යුතු වගවීම අධීක්ෂණය කරන හා එය ඉටු කරන බවට වග බලා ගන්නා මුරකරුවෙකු ලෙසටය. පාර්ලිමේන්තුව විසින් රාජ්‍ය සංස්ථා හා ව්‍යාපාර පිළිබඳ කටයුතු සමාලෝචනය කරනු ලැබුව ද එයට ප්‍රථම ඒවා අධීක්ෂණය කිරීම නිර්දේශ ලබාදීම හා විශ්ලේෂණාත්මක තොරතුරු පාර්ලිමේන්තුවට ලබාදෙන බවට වගබලා ගැනීමේ වගකීමක් මහා භාණ්ඩාගාරය සතුවේ.

මෙම ව්‍යුහය තුළ සිදුවිය යුතු ක්‍රියාදමය රාජ්‍ය ව්‍යාපාර හා සංස්ථාවල නම්‍යතාවය, ඵලදායිතාවය හා මූල්‍ය කාර්යක්ෂමතාවය ඇති කරවන ආකාරයෙන් සිදුවූ බවක් නොපෙනේ. රේඛීය අමාත්‍යංශ හරහා ක්‍රියාත්මක වූයේ හුදු පරිපාලනයයි. එයින් බැහැරව දේශපාලන වෙළා ගැනීම් මත තීරණ ගැනුණු අතර භාණ්ඩාගාර පාලනයද එයට නතුවීමට සිදුවීමෙන් ක්‍රියාත්මක වී ඇත්තේ නාමික මෙහෙයුමක් පමණි. වෘත්තීය මෙහෙයුමක් නැමතිවීමේ ප්‍රතිඵලය වී ඇත්තේ ඒවායේ පාලනය නිසි කළමනාකාරිත්වයෙන් බැහැරවීම මත ඵලදායිතාව හීන වීමය.

## ශ්‍රිතය මෙහෙයුම්

රාජ්‍ය ව්‍යාපාර බොහෝ දුරට වාණිජමය ස්වරූපයකින් ක්‍රියාත්මක විය යුතුය. සීමිත සම්පත් භාණ්ඩ හා සේවා බවට පත්කොට එනම් අගයන් එකතුකොට වෙළෙඳපොළට යැවීම ඒවායේ ප්‍රධාන හා සරල පරමාර්ථය වේ. මෙහිදී කරුණු කීපයක් පිළිබඳ වගකිව යුත්තන්ගේ සැලකිල්ල යොමු විය යුතුය. සම්පත් පරිවර්තන ශ්‍රිතය එහි පළමුවැන්නයි. එය අවම වියදමකින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වශයෙන් සරලව හඳුන්වා දිය හැකිය.

මූල්‍ය කළමනාකරණ ශ්‍රිතය දෙවැනි කරුණයි. ආයතනික කාර්යයන් හා නිෂ්පාදනය සඳහා ස්වයං මූල්‍යනය ඇති කිරීම අදහස වන අතර රාජ්‍ය ව්‍යාපාර බිඳ වැටීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම කරුණ පිළිබඳ වගකීම හරිහැටි ඉටු නොවීමයි. රාජ්‍ය මූල්‍ය අර්බුදය උග්‍රවීමට දින දින අලාභ ලබන රාජ්‍ය ව්‍යාපාර හේතුවක් වන අතර ඒවා පෞද්ගලීකරණය කිරීමටද එය ප්‍රබල සාධකයක් වේ. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණයේ හා සැලසුම්වල දුර්වලතාවය මෙයට හේතුව බව වගකිව යුත්තන් අමතක කර ඇත.

සමාජ සංවර්ධන ශ්‍රිතය හා පාරිභෝගික ආරක්ෂණයය තෙවැනි කරුණ වන අතර පෞද්ගලික අංශය විසින් උපරිම නොකරන කාර්යයක් වශයෙන් ද එය හඳුන්වා දිය හැකිය. වෙස්මිනිස්ටර් ආකෘතියේ මූල නාභිය වශයෙන් අප දකින්නේ නීති හා රෙගුලාසි මගින් රජයේ කාර්යයන් පවත්වාගෙන යාමයි. හුදු පරිපාලනය, නීති හා රෙගුලාසි මත පදනම් විය හැකිවුවද රාජ්‍ය ව්‍යාපාර පිහිටුවීමේ මූලික අරමුණ කළමනාකාරිත්වය පිළිබඳ ස්වාධීනතාවක් ලබාදීම හා ඒ මගින් සාධනීය මෙහෙයුමක් ඇති කිරීමයි. එය හුදු පරිපාලනයකට හෝ දේශපාලන අරමුණකට යටපත් කිරීම පිළිගත නොහැකිය.

ඒකාකාරී පරමාර්ථ උදෙසා යටත් විජිත යුගයේ සැකසූ පරිපාලන රෙගුලාසි විවිධ ශ්‍රිතයන්ගෙන් මෙහෙය වනු ලබන ආයතන හා කාර්ය සඳහා සුදුසු වන්නේ නැත. අවශ්‍ය වන්නේ අවස්ථානුකූල ප්‍රමිතිගත නිර්නායකයන්ය. ඒවා යොදාගත හැක්කේ වෘත්තීය වශයෙන් නිපුනත්වයක් ඇති අයටය.

## අධීක්ෂණ මෙහෙයුම්

මෙහයුම් අධිකාරියක් කළමනාකාරිත්ව දෘෂ්ටියෙන් නොව පරිපාලන දෘෂ්ටියෙන් කටයුතු කරන්නේ නම් මුළු ක්‍රියාදමයෙන්ම කළමනාකාරිත්වය ගිලිහී යයි. රාජ්‍ය ව්‍යාපාර පමණක් නොව රාජ්‍ය මූල්‍ය මෙහයුම් ක්‍රියාදමයම බිඳ වැටීමට බලපෑ කරුණක් වන්නේ එයයි. හුදු පරිපාලනයට දේශපාලනය එකතු වූ විට කළමනාකාරිත්වය පස්ස දෙරින් පැනයෑම වැළක්විය නොහැකිය. යල් පැන ගිය නීති රෙගුලාසිවලින් තොරව මූල්‍ය සම්පත් හා ඒවා මෙහෙය වන ආයතන කළමනාකාරිත්වයකට ලක් කළ හැකි හා වගකීම් දැරිය හැකි වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් දේශපාලනීකරණ අරමුණු ඉක්මවා ජාතික අවශ්‍යතා අනුව කටයුතු කළ හැකි ස්වාධින මූල්‍ය හා රාජ්‍ය ව්‍යාපාර මෙහයුම් ඒකකයක අවශ්‍යතාවය අපට දැනෙන්නේ මෙවන් තත්වයක් යටතේය. රාජ්‍ය ව්‍යාපාරවල ඵල රහිත අධීක්ෂකයෙක් වශයෙන් භාණ්ඩාගාර ක්‍රියාදමය මෙතෙක් පැවතියද එය එසේම විය යුතු නොවේ. අමාත්‍යංශ හරහා හෝ ඍජුව වෘත්තියමය මෙහයුම හා අධීක්ෂණය මෙම මෙහයුම් ඒකකයට සම්බන්ධ කළ හැකිය. භාණ්ඩාගාර මෙහයුම් නියෝජිතයන් බලතල (mandate) සහිතව තීරණ ගැනීමේ හැකියාවක් ඇති වෘත්තීය මූල්‍ය කළමනාකරුවන් විය යුතුය.

මේ අනුව කඩා හැලෙන රාජ්‍ය අංශය ගොඩ ගැනීමට නම් කළ යුතුව පවතින්නේ පවත්නා රාජ්‍ය ව්‍යාපාර හා ආයතන වසා දැමීම නොව ඒවා දේශපාලනයෙන් හා අවිධිමත් පාලනයෙන් මුදාගෙන මූල්‍ය සම්පත් නිසි ලෙස හැසිරවීම හා වෘත්තීය කළමනාකාරිත්වයන් එම ආයතන හා මෙහයුම් ආයතනවල ස්ථාපිත කිරීමය. රාජ්‍ය අංශයට වැඩි වශයෙන් වෘත්තිකයන් බිහි කිරීම හා බඳවා ගැනීමත් ඔවුන්ට ස්වාධීනව වැඩ කළ හැකි පරිසරයක් බිහි කිරීම හා ප්‍රතිපත්තිමය වශයෙන් නිසි ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමත් අප්‍රබුද්ධ දේශපාලනඥයන්ගේ අණසකට ඔවුන් යටත් නොකිරීමත් මේ සඳහා ඉටුවිය යුතු ප්‍රමුඛ කාර්යයන් වේ.



# ‘ඡන්දය දුන් නොදුන් සැමට සාධාරණව වැඩ කර, ජනපති දෑත් ශක්තිමත් කරන්න’

## වස්කඩුවේ මහින්දවංශ නාහිමි ඇමැති රෝහිතට සෙත් පතමින් ඉල්ලයි

**කළුතර මධ්‍යම විශේෂ සහ වාද්දුව සංවාරක**

ජනතාව ඇති තරම් ආණ්ඩුවට බලය දීල තියෙන්නෙ රටට වැඩ කරන්න.

“ඡන්දය දුන් නොදුන් හැම දෙනාටම සාධාරණව හා අවංකව වැඩ කරන්න. එසේ වැඩ කළොත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ රට හදන වැඩ පිළිවෙළ තව තවත් ශක්තිමත්ව ඉදිරියට යාවි” යයි කළුතර වස්කඩුව රාජගුරු සුභූති රජ මහා විහාරය සහ කොළඹ කොටහේන දීපදූත්ථාරාමය යන විහාරස්ථානවල උභය විහාරාධිපති, සම්බුද්ධ ශාසනෝදය මහා සංඝ සභාවේ මහානායක වස්කඩුවේ මහින්දවංශ නාහිමියෝ ප්‍රකාශ කළහ.

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා වරාය හා නාවික කටයුතු කැබිනට් අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මහතා, උන්වහන්සේව බැහැ දැකීමට, කළුතර වස්කඩුව රාජගුරු ශ්‍රී සුභූති රජ මහා විහාරස්ථානයට ගොස් උන්වහන්සේට වැඳ නමස්කාර කොට ආශිර්වාද ලබා ගැනීමෙන් අනතුරුව මහින්දවංශ හිමියන් විසින් කරන ලද විශේෂ අනුශාසනාවේදී මහින්දවංශ හිමියෝ එසේ ප්‍රකාශ කළහ.

මහින්දවංශ හිමියෝ මෙසේ ද පැවසූහ. 2015 දී මහින්ද රාජපක්ෂ මහත්තයා පැරදිච්ච වෙලාවේදි මහින්ද මහත්තයාව අත්හැරලා දලා බොහෝම විශාල පිරිසක් ඉවත් වෙලා ගියේ එතුමාව තනිකර දමමින්. නමුත් රෝහිත අබේගුණවර්ධන මහත්තයා ඇතුළු තවත් කිහිප දෙනෙක් පමණයි එහෙම මහින්ද මහත්තයාව අත්හැරලා දල නොගියේ. ඔබතුමා දිගටම මහින්ද රාජපක්ෂ මහත්තයාත් එක්ක හිඳිමින් පැරදිච්ච මහින්ද රාජපක්ෂ මහත්තයාට විශාල ශක්තියක් දුන්නා. ඒක මේ මුළු රටම දන්න කාරණයක්. පැත්තෙන් පැත්තට වාසි සඳහා පනින දේශපාලනඥයෙක් නොවෙයි ඔබතුමා. ඔබතුමා හරිම ප්‍රතිපත්ති ගරුකයි. ඊටත් වඩා නිර්භීතයි. ඒ නිසායි ජනතාව ඔබට හරිම ආදරේ.

දැන් ඔබතුමාට ඉතා හොඳ වැදගත් අමාත්‍යංශයක් ලැබිල තියෙනවා. ඒකෙන් ඔබතුමාට පුළුවන් රටට විශාල සේවයක් ඉටු කරන්න. ඔබතුමාට ආණ්ඩුවේ හොඳම කැබිනට් අමාත්‍ය තනතුරක් ලබාදීම, කළුතර ජනතාවට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් කරන ලද ගෞරවයක් හැටියටයි මහා සංඝරත්නය දකින්නේ. ඔබතුමාට ඡන්දය දුන් නොදුන් හැම දෙනාටම සාධාරණව සේවය කරන්න කියලයි අපි ඉල්ලා සිටින්නේ.

කළුතර දිස්ත්‍රික්කයේත් උසස් පෙළ හොඳට සමත් වෙලා රැකියා නැති තරුණ තරුණියෝ දහස් ගණනක් ඉන්නවා. දැන් ඔබතුමාට පුළුවනි ඒ අය ගැනත් බලන්න.

කළුතර ප්‍රාදේශීය සභාවේ පොදුජන පෙරමුණු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වන මනෝජ් කුමාර සිල්වා, රොෂාන් අබේගුණවර්ධන , සරත් කුමාර යන මහත්වරුන් ඇතුළු ඒ මහතාගේ ආධාරකරුවන් පිරිසක් ද මේ අවස්ථාවට සහභාගි වූහ.



වස්කඩුවේ මහින්දවංශ නාහිමියෝ වරාය හා නාවික කටයුතු අමාත්‍ය, රෝහිත අබේගුණවර්ධන මහතාට සෙත්පතා පිරිත් නූලක් ගැට ගැසූ අවස්ථාව. *ඡායාරූපය –කළුතර මධ්‍යම විශේෂ*



ටවර් හෝල් පදනම විසින් “ප්‍රේක්ෂක රංගකලා ” වේදිකා නාට්‍ය වැඩ සටහන ආරම්භ කරමින් එල්ෆින්ස්ටන් රඟහලේදී පැවැත්වූ අවස්ථාවේ අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සෙනරත් මහතා පොල් තෙල් පහන් දල්වන අයුරු. ටවර් හෝල් පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ඩග්ලස් සිරිවර්ධන සහ අධ්‍යක්ෂක හාසිම් ඕමර් යන මහත්වරු මෙහි වෙති. *ඡායාරූපය – රුසයික් ෆාරුක්*

# ජනපතිගේ සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන සාර්ථක කර ගැනීමට උපරිම කැපවීමෙන් වැඩ කරනවා

## රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර

**අමෝදා ජයමහ**

ජනතාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කෙරෙහි තැබුවා වූ විශ්වාසය පළුඳු නොකොට ඒ විශ්වාසයත් දිනෙන් දින සැපිරෙන අයුරින් වගකීම් ඉටු කරනව බව ගුදම් පහසුකම්, බහාලුම් අංගණ, වරාය සැපයුම් පහසුකම්, බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර මහතා පැවැසුවේ ය.

වරාය රාජ්‍ය අමාත්‍යංශයේ ඊයේ (21) සිය වැඩ භාර ගනිමින් අමාත්‍යවරයා මේ බව පැවැසීය.

වැඩිදුර අදහස් දැක් වූ රාජ්‍ය අමාත්‍යවරයා මෙසේ ද කීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම අරමුණ කරගනිමින් මේ රාජ්‍ය අමාත්‍යංශය අප වෙත පවරා තිබෙනවා.මේ අමාත්‍යංශය මා වෙත පැවරීම පිළිබඳ පළමුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත සහ අගමැති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රධාන ඇමති මණ්ඩලයටත් මා ස්තුතිවන්ත වෙනවා.මේ අමාත්‍යංශයේ රාජ්‍ය අමාත්‍ය කියන ධූරයේ වගකීම ලෙස මේ රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීමට අප කටයුතු කරනවා.වරාය හා නාවික ක්ෂේත්‍රය මුල් කරගත් නව ඉලක්ක හා සැළසුම් සමුදයකින් සමන්විත වූ වගකීම් බොහෝමයක් මේ අමාත්‍යංශය යටතට පැවරි තිබෙනවා.ඒ අනුව කලාපීය හා ජාතික අවශ්‍යතා මුල් කරගෙන කංකසන්තුරේ,ත්‍රිකුණාමල,ගාල්ල වාරායන් සංවර්ධනය කිරීමත් පෞද්ගලික අංශය දයක කර ගනිමින් ප්‍රතිඅපනයන කර්මාන්ත, ආනායන අපනයන කර්මාන්ත ශක්තිමත් කිරීම සඳහා, පැලියගොඩ, වේයන්ගොඩ රත්මලාන යන ප්‍රදේශයන්හි නව බහාලුම් අංගන කීපයක් ඉදි කිරීමට අප කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මේ රටෙහි ගුදම් ක්ෂේත්‍රය සැලසුම් සහගත ලෙස කළමනාකරණය කිරීමටත්, රේගුව සහ වරාය අතර මනා අන්තර් සම්බන්ධීකරණයත් නිර්මාණය කිරීම යනා දී ලෙස අප අමාත්‍යංශයට පැවරී ඇති ඒ ඒ විශයයන් කැබිනට් අමාත්‍ය රෝහිත අබේගුණවර්දන මහතා සමග එක් වී හොඳින් සිදු කිරීම අපගේ බලාපොරොත්තුවයි. මහමැතිවරණය හරහා සියවසේ අභියෝගාත්මක ජනවරමක් අපට ලබාදුන් ජනතාවගේ විශ්වාසයත් කඩ නො කිරීම අපගේ මූලිකම වගකීමයි.ජනතාව ඒ ආකාරයෙන් අප ගැන තැබුවා වූ එම විශ්වාසය පළුඳු නො කරන බවට අප පොරොන්දු වෙනවා. රටේ අභිවෘද්ධිය වෙනුවෙන් ජනතාවගේ දියුණුව උදෙසා අපට පවරා ඇති වගකීම් ඉටු කිරීමට අප අනිවාර්යෙන් කටයුතු කරනවා.

මේ අවස්ථාව සඳහා වරාය හා නාවික කැබිනට් අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන, බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ද සහභාගී වී සිටියහ.



*ඡයාරූප – හිරන්ත ගුණතිලක*

# ලංකාගම සිට දෙණියායට යන පාර හදද්දී සිංහරාජය වැනසෙන්නේ නැතැයි ගම්වැසියෝ කියති

## පාර හදනවාට එරෙහි පරිසර සංවිධාන නඟන චෝදනාවලට ගම්වැසියන්ගේ විරෝධය



**ටී.එල්.ඒ.පී. හේමපාල - නාගොඩ සමූහ**
**ප්‍රාර්ථනා ලියනගේ - හිනිදුම සමූහ**

සිංහරාජ වනාන්තරය ආශ්‍රිතව දිවෙන ලංකාගම හරහා දෙණියාය දක්වා මාර්ගයේ සංවර්ධන කටයුතු හේතුවෙන් පරිසර හානියක් සිදු වන බවට කරන චෝදනා අසත්‍ය බවත් එම අසත්‍ය ප්‍රචාරයන්ට රැවටී මාර්ගයේ සංවර්ධන කටයුතු නතර නොකරන ලෙස ඉල්ලා සිටිමින් ලංකාගම ගම්වාසීන් නෙළුව නගරයේ විරෝධතා ව්‍යාපාරයක් පවත්වන ලදී.

නෙළුව බස් නැවතුම්පොළ ඉදිරිපිට දී මෙම විරෝධතා ව්‍යාපාරය පැවැත්වුණු අතර ලංකාගම, වාරුකන්දෙණිය, දෙඹගොඩ, වතුගල යනාදී ප්‍රදේශවල ප්‍රදේශවාසීන් පිරිසක් මෙම විරෝධතාව සඳහා රැස්ව සිටියහ. එහිදී මාර්ගයේ සංවර්ධනය කටයුතු සඳහා විරුද්ධ වන පරිසර සංවිධාන සහ මාධ්‍ය නාලිකාවන්ට විරුද්ධව ලියැවුණු විරෝධතා පුවරු ප්‍රදර්ශනය කරමින් විරෝධතාකරුවන් සාමකාමී උද්ඝෝෂණයක නියැළුණු ආකාරය දැකගත හැකි විය.

වසර පන්සියයකටත් වඩා පැරණි මාර්ගයක් වන මෙම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස අවස්ථාවන් කිහිපයදීම ලංකාගම ගම්වාසීන් අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටියද එයට නිසි විසඳුමක් කිසිවෙකුගෙන් ලැබී නොමැති අතර නෙළුව ප්‍රදේශයේ පැවති ජනහමුවකදී ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ගම්වාසීන් කරන ලද ඉල්ලීමකට අනුව ලංකාගම – දෙණියාය මාර්ගය කඩිනමින් සංවර්ධනය කර දෙන බවට ජනපතිතුමන් එහිදී පොරොන්දු විය. .ඒ අනුව පසු ගියදා යුධ හමුදා සාමාජිකයන් පිරිසකගෙන් යුත් කණ්ඩායමක් එම මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා පැමිණ තිබේ.අඩි දහයක පළලකින් යුතු මාර්ගයක් වන මෙම මාර්ගය යළි සංවර්ධනය කිරීමේදී අඩි දෙළහක ප්‍රමාණයට පුළුල් කිරීමට කටයුතු සිදු කර ඇත්තේ මෙම මාර්ගයේ පටු ස්වභාවය හේතුවෙන් සිදුවන මාර්ග අනතුරු අවම කිරීමේ අරමුණෙනි.

නමුත් රාජ්‍ය නොවන පරිසර සංවිධාන කිහිපයක් විසින් ජනාධිපතිතුමන් වෙත ලිපියක් මඟින් දන්වා ඇත්තේ මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු හේතුවෙන් සිංහරාජ වනාන්තරය ආශ්‍රිතව පරිසර හානියක් සිදුවන බවත් මෙම මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සඳහා පරිසර සංවිධානවලින් කිසිඳු අවසරයක් ගෙන නැති බැවින් මෙම මාර්ගය පුළුල් කිරීම නතර කරන ලෙස පරිසර සංවිධාන ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත.

නමුත් ගම්වාසීන් පවසන්නේ මෙම මාර්ගය ඉතාමත් දුෂ්කර මාර්ගයක් බවත් පරිසර සංවිධාන පවසන ආකාරයට පරිසර හානියක් මෙම මාර්ගය සංවර්ධනය කිරීමෙන් සිදු නොවන බවයි. එමෙන්ම ඔවුන් පවසන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම මාර්ගය සංවර්ධනය කිරීමේදී කපා ඉවත් කිරීමට සිදුවන ගස් ප්‍රමාණය පවා සංගණනය කර ඇති බවයි. මාර්ග සංවර්ධන කටයුතු සිදු කරන යුධ හමුදා නිලධාරීන් ද පවසන්නේ මෙම මාර්ගය පුළුල් කිරීමෙන් විශාල වන විනාශයක් සිදු නොවන බවයි.රක්ෂිතයට අදාළ නොවන ගම්වාසීන්ට අයත් ප්‍රවේණි ඉඩම්වලින්ද මෙම මාර්ගය සඳහා කොටස් කැපීමට සිදුවන අතර එම ඉඩම් හිමියන්ගෙන්ද මෙම කටයුතු සඳහා විරෝධතාවක් නොමැති බව ගම්වාසීන් පවසයි. මෙම අසත්‍ය ප්‍රචාරයන් හේතුවෙන් තමන් බොහෝ කාලයක් තිස්සේ බලාපොරොත්තුවෙන් සිටි මෙම මාර්ගයේ සංවර්ධනය නතර කිරීමට ගෙන ඇති තීරණයට විරෝධය පළ කරමින් මෙම උද්ඝෝෂණය සංවිධානය කර තිබිණි.

*ඡායාරූපය – ප්‍රාර්ථනා ලියනගේ හිනිදුම සමූහ*

# තායිලන්තයේ රැඳී සිටි ශ්‍රී ලාංකික 87ක් දිවයිනට

**මහින්ද අලුත්ගෙදර**

කෝවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් තායිලන්තයේ විවිධ නගරවල රැඳී සිටි ශ්‍රී ලාංකිකයන් 87 දෙනෙකු යළි මෙරටට පැමිණ තිබේ.

තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් යූඑල් 403 දරණ ගුවන් යානයෙන් ඊයේ (21) උදෑසන බැංකොක් නුවර සිට ඔවුන් මෙරටට පැමිණියහ.

බෞද්ධ භික්ෂූන් වහන්සේ කිහිප දෙනෙකුද, සිසුන්, කෙටි කාලීන සංචාරක වීසා මත තායිලන්තයට පැමිණ සිටි ශ්‍රී ලාංකිකයන් සහ මානුෂිය අවශ්‍යතා මත පදනම්ව තවත් ලාංකිකයන් කිහිප දෙනෙකුද ඇතුළත් වූ මෙම කණ්ඩායම රැගත් විශේෂ ගුවන් යානය කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට ළඟා වූ අතර, මෙම සියළුම පුද්ගලයන් අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රජය විසින් නම් කරන ලද අනිවාර්ය නිරෝධායන මධ්‍යස්ථාන වෙත ශ්‍රී ලංකා ආරක්ෂක අංශ සහ සෞඛ්‍ය බලධාරීන් විසින් යොමු කෙරිණි.

මෙම විශේෂ ගුවන් යානයේ කොළඹ සිට බැංකොක් දක්වා වූ ගමන් වාරය සඳහා තායි පුරවැසියන් පිරිසක් සහ තායිලන්තයට ඇතුළුවීමට අවසර ලබාගෙන ඇති ශ්‍රී ලාංකිකයන් ද ඇතුලත් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය, ශ්‍රී ලංකාවේ තායිලන්ත තානාපති චූලමනී චාර්ට්සුවන් සහ කොළඹ රාජකීය තායි තානාපති කාර්යාලය විසින් සිදුකර තිබේ.

මෙම ශ්‍රී ලාංකිකයින් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය සහ සහයෝගය කඩිනමින් ලබාදීම වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ කොවිඩ්-19 කාර්ය සාධක බළකාය සහ විදේශ සබඳතා අමාත්‍යාංශයේ කොවිඩ්-19 කෙන්ද්‍රය, විදේශ සබඳතා අමාත්‍යංශයේ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ මහතා, බැංකොක් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පියවර ගෙන තිබෙන අතර ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට සහාය ඉල්ලා, විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් නිර්මාණය කරන ලද 'ශ්‍රී ලංකාව අමතන්න' මාර්ගගත ද්වාරය සහ තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී සිටි මෙම ශ්‍රී ලාංකික කණ්ඩායම නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා තායිලන්තයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ බැංකොක්හි ස්වර්ණභූමි ජාත්‍යන්තර ගුවන්තොටුපළේ කාර්ය මණ්ඩලයේන්ද තානාපති කාර්යාලයට විශිෂ්ට සහයෝගයක් ලබාදී ඇත.



ජාතික ගුවන් සේවයවූ - ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ප්‍රධාන කාර්යාලයේ අලෙවි ප්‍රධානී දිමුතු තෙන්නකෝන් මහතා සහ එහි බැංකොක් කළමණාකරු රීසා යූසුෆ් මහතා සහ කණ්ඩායම වෙත මෙම ක්‍රියාවලිය වෙනුවෙන් ඔවුන් ලබාදුන් සියලු පහසුකම් සහ අඛණ්ඩ සහයෝගය අගය කරන බවද විදේශ සබඳතා අමාත්‍යාංශය පවසයි.

අන්තර් ජාතික සංක්‍රමණිකයන් පිළිබඳ වූ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ (IOM) බැංකොක්හි කලාපීය කාර්යාලයේ අධ්‍යක්ෂ ආචාර්ය නෙනෙට් මෝටස්, සහ 'ස්වේච්ඡාවෙන් නැවත සියරට පැමිණීම සහ ගෙන්වා ගැනීමේ (AVRR) ව්‍යාපෘතිය' යටතේ බාලි ක්‍රියාවලි සාමාජික රටවල් වෙත ලබාදෙන කඩිනම් සහ ත්‍යාගශීලී ප්‍රතිචාර සහ සහයෝගය මේ අවස්ථාවේදී ලබාදීම ද අගය කර තිබේ.

මෙම මස මුලදී, තානාපති කාර්යාලය විසින් සිංගප්පූරුව හරහා, කාම්බෝජයේ නොම් පෙන් නගරයේ සිට ශ්‍රී ලාංකිකයන් කණ්ඩායමක් ද ආපසු ගෙන්වා ගැනීමට ද කටයුතු කර ඇත.

# වත්මනට ගැළපෙන පාසල් විෂය මාලාව නවීකරණයට

## ඉදිරියේ දී කැබිනට් පත්‍රිකාවක් සකසන බව ඇමැති ජී.එල්. කියයි



**සිතාරා සේනානි**

වර්තමානයට ගැළපෙන අයුරින් පාසල් විෂය මාලාව නවීකරණය හා සංවර්ධනය කිරීමට නව කැබිනට් පත්‍රිකාවක් ඉදිරියේ දී සකස් කිරීමට පියවර ගන්නා බව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා සඳහන් කරයි.

දරුවන්ගේ විශ්ලේෂණාත්මක බුද්ධිය, විවේචනාත්මක ව සිතීමට ඔවුන්ට ඇති හැකියාව වර්ධනය කිරීම ප්‍රධාන කරුණක් බව පවසන ඇමැතිවරයා, අධ්‍යාපනය ගවේෂණයක් බවද, එසේ වුවත් පවත්නා අධ්‍යාපන ක්‍රමය ඇතුළත ඒ සඳහා ඉඩ ලැබෙන්නේ අවම මට්ටමකින් වන නිසා දරුවන්ගේ උනන්දුව වැඩිදියුණු වන අයුරින් අධ්‍යාපනයේ ව්‍යුහය සකස් කළ යුතු බවද පවසයි. එසේම එම කාර්යය සියලු දෙනාගේ අදහස් ඇතිව කළ යුතු බවත්, අමාත්‍යාංශ මට්ටමින් අවසාන තීරණ ගැනීමට පෙර විෂයමාලා සංවර්ධනයට අදාළව දීපව්‍යාප්ත මට්ටමින් පුළුල් සංවාදයක් සිදුකරන බවත්, දිස්ත්‍රික් මට්ටමින්. ගුරුවරුන්, මව්පියන්, සිසුන් ආදි ශිෂ්‍ය සංගම්, සිවිල් සංවිධාන සහ ආගමික සංවිධානවල අදහස්, යෝජනා මේ සඳහා වැදගත් වන බවත් ඇමැතිවරයා සඳහන් කරයි.

උසස් පෙළ පන්ති සඳහා විෂයයන් ගණනාවකට පෙළපොත් නොමැතිවීම හේතුවෙන් පැනනැඟී ඇති ගැටලුකාරී තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමුකරන බවද අධ්‍යාපන ඇමැතිවරයා පවසයි.

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා මේ බව පැවසුවේ, මෙරට ප්‍රධාන පාසල් කිහිපයක විදුහල්පතිවරුන් සමඟ අධ්‍යාපන අමාත්‍යාංශයේ පෙරේදා (20) පැවැති විශේෂ සාකච්ඡාවකදීය.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්තමානයේ දී සිදුවිය යුතු‍යැයි අදහස් කරන වෙනස්වීම් සම්බන්ධයෙන් මෙම අවස්ථාවට පැමිණ සිටි විදුහල්පතිවරු අධ්‍යාපන අමාත්‍යවරයා දැනුවත් කළහ.

රැකියා අවස්ථා සම්බන්ධ ප්‍රමුඛතා පිළිබිඹු වන අන්දමින් විෂය නිර්දේශ ප්‍රතිසංශෝධනය විය යුතු ආකාරය පිළිබඳ සිය අදහස් දක්වන මෙන් අමාත්‍යවරයා මෙහිදී විදුහල්පතිවරුන්ට ආරාධනා කළේය. උසස් පෙළ පන්ති සඳහා විෂයයන් ගණනාවකටම පෙළ පොත් නොමැතිවීම හේතුවෙන් පැනනැඟී ඇති ගැටලුකාරී තත්ත්වය ද, ඒ සම්බන්ධයෙන් ගත හැකි ඉදිරි පිළියම් සම්බන්ධයෙන් ද මෙහි දී සාකච්ඡාවට බඳුන් විය.

වෘත්තීය තෝරාගැනීම් පිළිබඳ දැක්මක් සහිතව පාසල්වල උපදේශන සේවාවන් වඩාත් ඵලදායී ආකාරයෙන් සිදු කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳ ද මෙහි දී සාකච්ඡාවට ලක් විය. තව ද රට පුරා පිහිටා ඇති පාසල්වල ඉගැන්වීම් සම්බන්ධ ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා මෙරට ප්‍රමුඛ පෙළේ පාසල්වලින් ලබා ගත හැකි දායකත්වය පිළිබඳ ද අවධානය යොමු කෙරුණු අතර, ඒ සම්බන්ධයෙන් සිය සහයෝගය දක්වන ලෙස අමාත්‍යවරයා විදුහල්පතිවරුන්ගෙන් ඉල්ලා සිටියේය.

අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා ද, කොළඹ ආනන්ද විද්‍යාලය, දේවි බාලිකා විද්‍යාලය, තර්ස්ටන් විද්‍යාලය, ඩී. එස්. සේනානායක විද්‍යාලය, මිලාගිරිය ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය, ලුම්බිණි විද්‍යාලය, ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලය, පාණදුර සුමංගල පිරිමි විද්‍යාලය, නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලය, මිනුවන්ගොඩ නාලන්ද විද්‍යාලය, මහනුවර ධර්මරාජ විද්‍යාලය, ගාල්ල මහින්ද විද්‍යාලය, බටේමුල්ල ජාතික පාසල, කෑගලු බාලිකා විද්‍යාලය, වෙන්නප්පුව ශාන්ත ජෝශප් වාස් විද්‍යාලය, ඉබ්බාගමුව ජාතික පාසල, මාතර සුජාතා බාලිකා විද්‍යාලය, හංවැල්ල රාජසිංහ විද්‍යාලය, හොරණ තක්ෂිලා විද්‍යාලය සහ කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය නියෝජනය කරමින් විදුහල්පතිවරු මේ අවස්ථාවට සහභාගී වූහ.

## අභිනව කථානායකට මහා සංඝරත්නයේ ආශිර්වාදය



නව වැනි පාර්ලිමේන්තුවේ අභිනව කථානායක ලෙස තේරී පත් වූ මහින්ද යාපා අබේවර්ධන මහතාට සෙත් පිරිත් සජ්ඣායනා කර ආශිර්වාද කිරීම සඳහා නාරාහේන්පිට අභයාරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් ප්‍රධාන මහා සංඝරත්නය පාර්ලිමේන්තුව වෙත පෙරේදා (20) වැඩම කළහ.

නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය යෙදී තිබූ පෙරේදා දින පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ හා විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ඒකමතිකත්වයෙන් කථානායක ධුරයට පත් වූ මහින්ද යාපා අබේවර්ධන මහතා මෙරට එකොළොස්වැනි කථානායකවරයා වෙයි.

අබේවර්ධන මහතා, 1983 දී හක්මන ආසනය නියෝජනය කරමින් ප්‍රථම වරට පාර්ලිමේන්තුවට පිවිසි අතර, දශක දෙකකට අධික කාලයක් විවිධ අමාත්‍ය ධුර දරමින් පාර්ලිමේන්තුව නියෝජනය කළේය. මීට අමතරව දකුණු පළාත් මහ ඇමැති ලෙස ද කටයුතු කළ ඒ මහතා මාතර තෙලිජ්ජවිල විදුහලේ සහ රාහුල විදුහලේ කීර්තිමත් ආදි සිසුවෙකි. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය සඳහා කොළඹ විශ්වවිද්‍යාලය තෝරා ගත් ඒ මහතා වෘත්තියෙන් වැවිලිකරුවකු ලෙස කටයුතු කරයි.

## නීත්‍යනුකූලව ගංජා වැවුවොත් රට සල්ලි මෙරටට ගේන්න පුළුවන්

### වැල්ලවාය ප්‍රා.සභා මන්ත්‍රී බලහරුවේ සිරිසුමන හිමි



**වැල්ලවාය විශේෂ - අයි. ආර්. ආර්. ගරුසිංහ**

ආයුර්වේදයේ ගංජවල ගුණ 105ක් තියෙනවා. විදේශ මුදල් අපේ රටට ගෙන්නවා ගැනීමේ මාර්ගයක් කර ගන්න පුළුවන්. ඒ නිසා ගංජා තහනම ඉවත් කළ යුතු යැයි වැල්ලවාය ප්‍රාදේශීය සභා මන්ත්‍රී බලහරුවේ සිරිසුමන හිමියෝ පැවසූහ.

වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. ඩී. හරමානිස් මහතාගේ ප්‍රධානත්වයෙන් වැල්ලවාය ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ පෙරේදා (20) පැවති මාසික රැස්වීමේදී අදහස් දක්වමින් උන්වහන්සේ එසේ කියා සිටියහ.

වැඩි දුරටත් අදහස් දැක්වමින් උන් වහන්සේ මෙසේද කියා සිටියහ. මම හිතන්නේ නෑ කරයි ද කියා. අපේ රටේ දැන් නීතිය ක්‍රියාත්මක වෙන්නේ නෑ. ගංජා තහනම හැදුවේ කවුද? සුද්දෝ. මේක අවලංගු කරන්න බැරිද? පුළුවන්. ඒහෙම කළා නම් මේ රටට සල්ලි එන්නේ නැද්ද? කිරිඇල්ලේ ඤාණවිමල හාමුදුරුවන්ගේ පොත අරගෙන බලන්න. මේක ඖෂධයක්. සුද්ද මේක තහනම් කළේ අමුඩෙයි ගංජයි තිබුණොත් පරාද කරන්න බෑ කියායි.

වල්ලපට්ට තහනම අයින් කර මිනිස්සුන්ගේ අතට සල්ලි එන ක්‍රම හදන්න ඕනේ. එහෙම නැතුව මැටි වළඳක් හදලා විකුණලා, රටක් දියුණු කරන්න බෑ. වේවැල්වලින් භාණ්ඩයක් හදල රටක් දියුණු කරන්න පුළුවන්ද?

මොනරාගල දියුණු කරන්න සියඹලා දිවුල්වලින් පුළුවන්. ඒතරමටම මේ ප්‍රදේශයේ ගස් යට වැටිලා විනාශ වෙලා යනවා. ඒවට මිලක් නෑ. වෙළෙඳපොළක් නෑ. ඒ ආශ්‍රිත කර්මාන්ත ඇති කරන්න පුළුවන් නම්, ප්‍රදේශයට හොඳ ආදායමක් ලැබෙනවා.

## රිය අනතුරු අවම කරන්න ගලේවෙල පොලීසිය තදින් සිටියි

**මාතලේ දිස්ත්‍රික් සමුහ**

වැඩි වෙමින් පවතින රිය අනතුරු අවම කිරීමේ අරමුණෙන් ගලේවෙල පොලීසිය මේවන විට එම පොලිස් බල ප්‍රදේශයේ දැඩි ක්‍රියාමාර්ග ගෙන තිබේ.

මේ අනුව පසුගිය ද සිදු කළ මාර්ග පරීක්ෂාවකදී බීමත්ව වාහන පැද වූ පුද්ගලයන් සිව්දෙනකු අත්අඩංගුවට ගෙන, දඹුල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කෙරිණි.

මෙහිදී පොලීසිය අධිකරණය ඉදිරියේ පැවසුවේ මෙම සැකකරුවන් පරීක්ෂා කරන මොහොතේ, ඔවුන් බීමත්ව සිටි බවයි. එමෙන්ම මොවුන් දෙදෙනකු සන්තකයේ වලංගු රියැදුරු බලපත් ද නොතිබූ බව පොලීසිය වැඩිදුරටත් සඳහන් කළේය. සැකකරුවන් චෝදනාවන්ට වරද පිළිගත් බැවින් මහේස්ත්‍රාත් අයි. එම්. එස්. බී. ඉලංගසිංහ මහතා රුපියල් එක්ලක්ෂ පනස්දහසක දඩයක් නියම කළේය. ඊට අමතරව මෙම රිදුරන්ගෙන් දෙදෙනකුගේ රියැදුරු බලපත් ද මසක කාලයකට අත්හිටුවීය.

මෙසේ මෙම චෝදනාවන්ට වරදකරුවන්වූයේ ගලේවෙල පෙදෙසේ පදිංචිකරුවන් සිව්දෙනෙකි.

ගලේවෙල පොලීසියේ සැරයන් ප්‍රියන්ත මහතා පැමිණිලි මෙහයවීය.

## කොටුවේ පාවෙන වෙළෙඳ සංකීර්ණයේ පිළිසකර වැඩ 24 දා ඇරඹෙයි

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හා අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ උපදෙස් පරිදි කොටුවේ පාවෙන වෙළෙඳ සංකීර්ණයේ (Floating Market) පිළිසකර කිරීමේ කටයුතු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම 24 ද උදේ 8.30ට එම ස්ථානයේ දී ආරම්භ කෙරේ.

පසුගිය වසර 4 1/2 ක කාලයේ කොටුවේ පාවෙන වෙළෙඳ සංකීර්ණයෙහි නිසි පරිදි නඩත්තු කටයුතු සිදු නොවූ නිසා එම වෙළෙඳසල් රැසක් වසා දැමීමට එම වෙළෙඳසල් හිමියන්ට සිදුව තිබේ. ඒ ආකාරයට වෙළෙඳසල් සියයට අසූවක් පමණ වසාදැමීමට සිදු වූ බව එම වෙළෙඳසල් හිමියෝ පැවසූහ.

මීට අමතරව පාවෙන වෙළෙඳසල් තිබෙන ඇළෙහි ජලය අපිරිසුදුවීම නිසා පසුගිය කාලයේ දැඩි පාරිසරික ප්‍රශ්න ද මතුවී ඇත. මෙම සියලු කරුණු ගැන අවධානය යොමු කළ ජනාධිපතිතුමා සහ අගමැතිතුමා නාගරික සංවර්ධන අධිකාරියට උපදෙස් ලබා දුන්නේ කොටුවේ පාවෙන වෙළෙඳ සංකීර්ණය කඩිනමින් පිළිසකර කරන ලෙසයි.

වර්තමාන ජනාධිපති එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව ඉදිකෙරුණු කොටුව පාවෙන වෙළෙඳ සංකීර්ණය විවෘත කළේ 2014 වර්ෂයේ අගෝස්තු 25 වැනි දාය.

## පාකිස්තාන තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් අලී නාවික හමුදාපති හමු වෙයි

**රක්ෂණ ශ්‍රියන්ත**

සිය ධුර කාලය අවසන් කිරීමට නියමිත ශ්‍රී ලංකාවේ පාකිස්තාන මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් සජාඩ් අලී මහතා (20) නාවික හමුදා මූලස්ථානයේදී නාවික හමුදාපති, වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා හමු විය.

පාකිස්තානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක, කර්නල් සජාඩ් අලී මහතා සිය වසර තුනක ධුර කාලය අවසන් කිරීම නිමිත්තෙන් නාවික හමුදා මූලස්ථානයේදී නාවික හමුදාපති, වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා හමු වී සුහද පිළිසඳරක නිරත වූ අතර, නාවික හමුදාපති තුමන් රාජකාරී කාල සීමාවේදී පාකිස්තාන ආරක්ෂක උපදේශකවරයා දුන් සහයෝගය සම්බන්ධයෙන් සිය කෘතවේදීත්වය පළ කරමින් ඔහුගේ ඉදිරි කටයුතුවලට සුභාශිංසන පිරිනැමීය. තවද, මෙම සුහද හමුව සනිටුහන් කරමින් සමරු තිළිණ හුවමාරුවක්ද සිදු කෙරුණි.



## මහ කන්නයට කිලිනොච්චියෙන් වී මෙට්‍රික් ටොන් 42,000ක්



**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

මෙවර මහ කන්නයේදී කිලිනොච්චියේ ගොවීන් වී මෙට්‍රික් ටොන් 42,000ක ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇතැයි කිලිනොච්චිය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ඒ. අත්පුදචන්ද්‍රන් මහතා පැවසීය.

කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂවරයා සඳහන් කළේ මේ වී ප්‍රමාණය ප්‍රදේශයේ කුඹුරු හෙක්ටයාර් 23,466ක ප්‍රමාණයක් වගා කිරීමෙන් ලැබුණු බවයි. එහෙයින් මෙවර බලාපොරොත්තු වූ වී අස්වැන්නක් මෙවර ලබා ගැනීමට නොහැකි වූ බවද හෙතෙම කීවේය.

කොරෝනා වසංගතය නිසාත්, ඒ කාලයේදී ඇඳිරි නීතිය පැනවීමත්, පොහොර හා කෘෂිරසායන ද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකිවීමත් නිසා වී අස්වැන්න අඩු වූ බවද අත්පුදචන්ද්‍රන් මහතා වැඩි දුරටත් කීය.

කිලිනොච්චියේ ගොවීන් මහ, මධ්‍යම හා සුළු වාරිමාර්ග ක්‍රමයන් උපයෝගී කරගෙන මෙවර කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ බව පැවසූ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා ඔවුන්ගේ වී නිෂ්පාදනයන්ගෙන් වැඩිම ප්‍රමාණයක වී ලැබී ඇත්තේ ඉරණමඩුකුලම්, වන්නේරිකුලම්, හා අක්කරායන්කුලම් යන ජලාශ යටතේ වගා කළ කුඹුරුවලින් බවද සඳහන් කළේය.

## රුසියානු තානාපති සෞඛ්‍ය ඇමැතිනී බැහැදකී

### කොවිඩ් මර්දන සැලසුම ඇගයුමට

ශ්‍රී ලංකාවේ රුසියානු තානාපති යූරි මතේරි (YURY B. MATERIY) මහතා සහ සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය අතර විශේෂ හමුවක් ඊයේ (21) පෙරවරුවේ සෞඛ්‍ය අමාත්‍යංශයේදී සිදු විය.

විශේෂයෙන් මෙහිදී කොවිඩ් 19 වයිරස් රෝගය මර්දනයේදී රජයක් ලෙස ශ්‍රී ලංකා රජය ගත් ක්‍රියා මාර්ග නිසා ශ්‍රී ලංකාවට එය සාර්ථකව මර්දනය කිරීමට හැකි වූ බව සිහිපත් කළ තානාපතිවරයා, ඒ වෙනුවෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ රජයටත්, නායකත්වය දුන් සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මියටත් රුසියානු රජයේ ප්‍රසංසාව පළ කර සිටියේය.

කොවිඩ් වයිරස ප්‍රතිකාර හා මර්දනය සඳහා රුසියාව නිපද වූ නව එන්නත පිළිබඳ ද තානාපතිවරයා අමාත්‍යවරිය දැනුවත් කළ අතර, එම එන්නත පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ අවශ්‍ය නිර්දේශ සහ අනුමැතිය ලැබුනු පසු ශ්‍රී ලංකාවේ කොවිඩ් මර්දනය හා ප්‍රතිකාර කටයුතු සඳහා එම ඒන්නත භාවිතා කිරීමට කටයුතු කරන බව අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය රුසියානු තානාපති යූරි මතේරි (YURY B.MATERIY) මහතා හට අවධාරණය කළාය.



ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් බිහි කිරීම සඳහා රුසියානු රජය ශිෂ්‍යත්ව ලබා දෙමින් විශාල මෙහෙයක්, සේවාවක් සිදු කළ බැවින් ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂ ස්තුතිය පළ කර සිටින බව මෙහිදී අමාත්‍යවරිය සඳහන් කළාය. මේ පිළිබඳ අදහස් දක්වමින් රුසියානු තානාපති යූරි මතේරි (YURY B.MATERIY) මහතා සඳහන් කළේ දෙරට අතර පවතින දීර්ඝ කාලීන මිතුදමේ ප්‍රතිඵලයක් ලෙස මෙරට වෛද්‍යවරුන් හා අනෙකුත් කාර්යය මණ්ඩලවලට වැඩිදුර අධ්‍යාපනය සඳහා රුසියාවේ ශිෂ්‍යත්ව ක්‍රමයක් කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරන බවයි. මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවේ රුසියානු තානාපති කාර්යාලයේ දේශපාලන කටයුතු පිළිබඳ ලේකම් Rostislav LENCHUK මහතා ද මෙම අවස්ථාවට ඒක්විය.

## තරුණ නව නිපැයුම්කරුවන්ට අලුත් වෙළෙඳපොළක්

### ජාතික තරුණ සේවා සභාවෙන් සැලැස්මක්

**ටී.කේ.මහින්ද - වැලිගම සමූහ**

තරුණ නව නිපැයුම්කරුවන් ව්‍යවසායකයන් බවට පත්කිරීමේ නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමින් ඔවුන්ට අවශ්‍ය වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට ජාතික තරුණ සේවා සභාවේ විශේෂ ව්‍යාපෘති අංශය පියවර ගෙන ඇත.

Startup Srilanka වැඩසටහනට සමගාමීව මෙම නිර්මාණකරුවන් අතර තරගයක් පැවැත්වීමට ද කටයුතු යොදා ඇත. දීප ව්‍යාප්තව විසිරී සිටින වයස අවුරුදු 15-35 අතර වයස් සීමාවේ සිටින නව නිපයුම්කරුවන් Online යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු මේ දිනවල සිදු කෙරේ. හඳුනා ගත් ක්ෂේත්‍ර දහයක් මේ සඳහා තෝරා ගෙන ඇති අතර, එවා නම් කෘෂි තාක්ෂණික උපකරණ, කෘෂිකර්මාන්තය මුල්කර ගත් අගය එකතු කළ නිෂ්පාදන, විද්‍යුත් උපකරණ, රොබෝ විද්‍යාව, ක්‍රීඩා, කෘතිම බුද්ධිය සහ අන්තර් ජාලික කරුණු, ඛනිජ රසායනික නිෂ්පාදන, තොරතුරු තාක්ෂණය පදනම්කර ගත් ජනතා කේන්ද්‍රිය සේවාවන්, වේගයෙන් අලෙවිවන පාරිභෝගික භාණ්ඩ, ඇඟලුම් ක්ෂේත්‍රය මීට අයත්වේ.

මේ පිළිබඳ ජාතික තරුණ සේවා සභාවේ දිස්ත්‍රික් කාර්යාල මගින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත තරුණ සේවා නිලධාරීන්ගෙන් ද තොරතුරු ලබා ගත හැකිය. තරුණ නිර්මාණකරුවන් හඳුනා ගනිමින් ඔවුන්ට නව ව්‍යවසායකයන් ලෙස නැඟී සිටින්න අවශ්‍ය පසුබිම නිර්මාණය කරදීමත්, මෙම නව නිර්මාණකරුවගෙන් බිහිවන සංකල්ප මත උපදින නිර්මාණ සමාජ ගත කිරීමට ඉඩප්‍රස්තාව ලබා දීමටත් ජාතික තරුණ සේවා සභාව පියවර ගන්නා බව ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සභාපති තෂාර ජයසිංහ මහතා පැවසීය.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව තරුණ සංවර්ධනය සඳහා ලබාදී ඇති ප්‍රමුඛත්වය සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක නව වැඩපිළිවළින් නව නිපයුම් රැසක් ජන සමාජය වෙත තාක්ෂණික මෙවලම් ලෙස හඳුන්වාදීමට අවස්ථාව ලැබෙ බවද සභාපතිවරයා පැවසීය. ඒ සඳහා අවශ්‍ය තොරතුරු මෙන්ම ලියාපදිංචිවීමේ අවස්ථාව ජාතික තරුණ සේවා සභාවේ www.nysc.lk වෙබ් අඩවියට පිවිසිමෙන් හෝ 0112850986 විශේෂ ව්‍යාපෘති අංශයට කතා කර මේ පිළිබඳ තොරතුරු ලබා ගත හැකිය.



## දහනවයෙන් තොරතුරු පනතේ ස්වාධීන කොමිසන් ක්‍රියාත්මක වුණා

### මන්ත්‍රී තුෂාර ඉඳුනිල්



**කෝට්ටේ මධ්‍යම සමූහ නන්ද ඒකනායක**

දහනව වැනි සංශෝධනය යටතේ රටේ ජනතාවට තොරතුරු දැන ගැනීමේ අයිතිය ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී තීන්දු තීරණ හා ස්වාධීන කොමිසන් සභා පත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් තිබූ බව කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී තුෂාර ඉඳුනිල් මහතා පැවසීය. සමඟි ජන බලවේගය ප්‍රධාන කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවකදී අදහස් දක්වමින් ඒ මහතා මෙසේ පැවසීය. එම මාධ්‍ය හමුව අමතා තවදුරටත් තුෂාර ඉඳුනිල් මහතා මෙසේ ද කීය.

18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා මේ රටේ ජනතාව එක අතකට ගෙන තිබෙන අතර, රටේ පොදු ජනතාව යටත් වැසියන් බවට පත් කරගෙන තිබුණා.

මන්ත්‍රීවරයකුගේ වසර පහක ධුර කාලය පවා මෙයින් අහෝසිකර, මාධ්‍ය ආයතන ගිනි තියන තීන්දු පවා ගැනීමට බලය මෙමගින් ලබාගත හැකි වනසේ කටයුතු කිරීමටත්, රාජ්‍ය සේවකයන් එක රැයෙන් දිවයිනේ ඕනෑම පළාතකට මාරු කිරීමේ යුගයක් ඇතිවීමට මෙමගින් ඉඩ ලැබෙනවා.

19 වැනි සංශෝධනයේ යම් යම් අඩුපාඩු තිබුණත්, ඒවා සංශෝධනය කරගන්න පුළුවන්කම තිබුණා. ව්‍යවස්ථා සංශෝධන රැල්ලක් ආවේ එක රටක් තුළ එක නීතියක් තිබිය යුතු නිසායි.

කුරුණෑගල නගර සභාවේ නගරාධිපතිවරයාගේ ක්‍රියාකලාපය පිළිබඳ අද නගරවාසීන් මෙන්ම අවට ප්‍රදේශවාසීන් ද කලකිරී සිටිනවා.

AROUND THE WORLD
ලොව වටා

# අමෙරිකා - මෙක්සිකෝ දේශ සීමා තාප්පෙන් හොරා කෑ

## ට්‍රම්ප්ගේ හිටපු උපදේශක ස්ටීව් බැනන් අත්අඩංගුවට



අමෙරිකා - මෙක්සිකෝ දේශ සීමා ඔස්සේ ඉදිකිරීමට යෝජිත තාප්පය වෙනුවෙන් ආධාර රැස්කිරීමේ ව්‍යාපාරයේ දී වංචා කළ බවට ට්‍රම්ප්ගේ හිටපු උපදේශක ස්ටීව් බැනන් අත්අඩංගුවට ගෙන ඇත.

"වී බිල්ඩ් ද වෝල්" ව්‍යාපරය වෙනුවෙන් ලක්ෂ ගණන් ආධාරකරුවන් ලබාදුන් ඩොලර් මිලියන 25ක අරමුදලෙන් වංචා කළ බවට බැනන්ට සහ තවත් තිදෙනකුට චෝදනා නැඟී ඇතැයි එක්සත් ජනපද අධිකරණ අමාත්‍යාංශය පවසයි.

බැනන්ට මේ අරමුදල සඳහා ඩොලර් මිලියන 1කට වැඩියෙන් ලැබී ඇති අතර, එයින් කොටසක් තමන්ගේ පෞද්ගලික පරිභෝජනයට ගෙන ඇතැයි චෝදනා නැගේ. උසාවියේ දී ඔහු නිවැරැදිකරු බව ප්‍රකාශ කළේය. ඇප පිට නිදහස ලැබූ බැනන් 2016 ජනාධිපතිවරණයේ දී ට්‍රම්ප්ගේ මැතිවරණ ව්‍යාපාරය සැලැසුම් කළ පුද්ගලයන් කිහිප දෙනාගෙන් අයෙකි.



# ට්‍රම්ප් පමණට වැඩි කාලයක් අමෙරිකාව අඳුරේ ගිල්ලුවා

## ඩිමොක්‍රටික් අපේක්ෂක ජෝ බිඩෙන්ගෙන් චෝදනා



## අඩුපාඩු හදාගෙන පරතරය අවම කර ගන්න

### විචාරකයන්ගෙන් ට්‍රම්ප්ට අවවාද

ඩොනල්ඩ් ට්‍රම්ප් පමණට වැඩි කාලයක් අමෙරිකාව අඳුරෙන් වසා තැබුවේ යැයි ඩිමොක්‍රටික් පක්ෂයේ ජනාධිපති ධූර අපේක්ෂක ජෝ බිඩෙන් චෝදනා කරයි.

ඔහු එසේ පැවැසුවේ ඩිමොක්‍රටික් පක්ෂයේ ජනාධිපති ධූරය නිල වශයෙන් භාරගත් අවස්ථාවේය. තමන්ගේ ප්‍රතිවාදියා පමණට වැඩියෙන් කෝපය, තරමට වැඩියෙන් බිය, තරමට වැඩියෙන් බෙදීම පැතිර වූ බව ද ඔහු කීවේය.

බිඩෙන්ගේ දශක පහකට වැඩි දේශපාලන දිවියේ ඉතාම වැදගත් සන්ධිස්ථානයකට මේ වන විට ඔහු පැමිණ ඇතැයි විචාරකයෝ කියති. ඔහු මැතිවරණයට පා තැබුවේ ම ජනමත විමසුම්වල දී පැහැදිලි ඉදිරියක් පෙන්නුම් කරමිනි. කෙසේ වෙතත් විචාරකයෝ පවසන්නේ මැතිවරණයට තවත් දින 75ක් තිබෙන බැවින් ඉදිරියේ තමන්ගේ අඩුපාඩු සකසා ගෙන පරතරය අවම කර ගැනීමට ට්‍රම්ප්ට ද අවස්ථාව ඇතැයි යනුවෙනි.

# බටහිර ඕස්ට්‍රේලියාවේ වරකුර්ණා ප්‍රජාවට

## ආදිවාසී නිලධාරීන්ගෙන් සමන්විත පොලීසියක්



බටහිර ඔස්ට්‍රේලියාවේ වරකුර්ණා ප්‍රජාවේ සම්පූර්ණයෙන්ම ආදිවාසී නිලධාරීන්ගෙන් සමන්විත පොලිස් ස්ථානයක් ස්ථාපිත කර තිබේ.

ජ්‍යෙෂ්ඨ කොස්තාපල් වෙන්ඩි කෙලීගේ මුලපිරීමෙන් ආරම්භ වූ මේ ආදිවාසී පොලීසිය බටහිර ඔස්ට්‍රේලියාවේ පළමු වැනි ආදිවාසී පොලීසියයි. නව පොලිසිය ස්ථාපිත කිරීමත් සමඟ ආදිවාසී ප්‍රජාව පාලනය කිරීම සම්බන්ධයෙන් සමාජ පරිවර්තනයක් සිදු වූ බවත්, සුබවාදී ලෙස හැඩගැසීමක් සිදු වුණු බවත් කෙලී මාධ්‍ය වෙත පැවැසුවාය.

# ප්‍රංසයේ කොරෝනා රෝගීන්ගේ වැඩිවීමක්

## එක් දිනක ආසාදිතයෝ 4,771ක්




ප්‍රංසයේ එක් දින කොරෝනා ආසාදන ප්‍රමාණය 4,771 ක් වාර්තා වී තිබේ.

එය කලින් දිනයට එනම් බදාදට වඩා එක් දහසක වැඩි වීමකි. මැයි මාසයෙන් පසුව එරට රෝගීන් 4000 ඉක්මවා ගියේ ප්‍රථම වතාවටය. එසේම ඉතාලිය, ස්පාඤ්ඤය සහ ජර්මනිය යන රටවල්වල ද අප්‍රේල් හෝ මැයි මාසවලට පසු මෙවර වැඩි කොවිඩ් රෝගීන් වාර්තා වී ඇත.

අගෝස්තු මැද භාගය වන තෙක් ප්‍රංසයේ නව කොරෝනා ආසාදන ප්‍රමාණය වර්ධනය වන්නට පටන්ගත්තේය. එරට රෝග පරීක්ෂා කිරීම් වැඩි කළ අතර ගෙවුණු සතියේ පරීක්ෂණ 664,000ක් සිදුකර ඇත. එහෙත් එරට ආසාදන ප්‍රමාණය ද වර්ධනය විය. නිලධාරීන් පවසන්නේ වයිරසය ප්‍රංසයේ ප්‍රධාන නගරවල තරුණයන් අතර, වැඩියෙන් සැරිසරන බවයි. ඔවුන්ගේ රෝග ලක්ෂණ වැඩි වශයෙන් පෙන්නුම් කරන්නේ නැති බවත්, රෝහල්වල රෝගීන් අඩු නොවීමට හේතුව එය බවත් පැවැසේ.





# ඩොලර් ලක්ෂ 31/2ක රන් කුට්ටි දෙකක් ඔස්ට්‍රේලියාවෙන් මතු වෙයි

ඔස්ට්‍රේලියානු ඩොලර් ලක්ෂ තුන හමාරක් වටිනා රන් කුට්ටි දෙකක් පොළොව යටින් අනාවරණය කර ගැනීමට එරට කැණීන්නන් දෙදෙනකුට වාසනාව පෑදී ඇත.

වික්ටෝරියා ප්‍රාන්තයේ රන් නිධි පිහිටි නගරයක් වන ටර්නගියුලාහිදී මේ වාසනාව පෑදී ඇත්තේ බ්‍රෙන්ට් ෂැනන් සහ ඊතන් වෙස්ට් නම් තරුණයන් දෙදෙනකුටය.

මේ අයගේ වාසනාව ගැන එරට ජනප්‍රිය රූපවාහිනී වැඩසටහනක් වන ඕසී ගෝල්ඩ් හන්ටර්හි ද ප්‍රදර්ශනය කර ඇත. මේ දෙදෙනා මෙටල් ඩිටෙක්ටර්ස් භාවිත කරමින් ප්‍රදේශයේ කැණීම් සිදුකර තිබේ. මෙය සාමාන්‍ය කැණීමකට වඩා වෙනස් බවත් එක් දිනක දී මෙතරම් රන් ප්‍රමාණයක් අඩංගු කුට්ටි දෙකක් හමුවීම අරුමයක් බවත් ඊතන් වෙස්ට් කීවේය. මේ රන් කුට්ටි දෙක කිලෝ 3.5ක පමණ බරකින් යුක්තය. මෙහි වටිනාකම ශ්‍රී ලංකා මුදලින් කෝටි 4.5ක් පමණ වේ.

# උතුරු කොරියා නායක කිම් ජොන් සිය බලතල සොහොයුරියට බෙදයි



උතුරු කොරියානු නායක කිම් ජොන් උන් තමන්ගේ බලතලවලින් කොටසක් තම සොහොයුරිය වන කිම් යෝ ජොන් ඇතුළු සමීපතම ආධාරකරුවන් වෙත බෙදා දී ඇතැයි දකුණු කොරියානු ඔත්තු සේවා ප්‍රකාශ කරයි. තවමත් අධිකාරී බලය තමා වෙත පවරා ගෙන සිටින කිම් තමන් වෙත පවතින ආතතිය මඟ ඇරවීමට මෙසේ බලතල බෙදා දී ඇතැයි විශ්වාස කෙරේ. කෙසේ වෙතත් උතුරු කොරියාව සම්බන්ධයෙන් සියොල් ඔත්තු සේවා කලින් පැවැසූ ඇතැම් කාරණා අසත්‍ය වූ අවස්ථා ද පැවැතිණි. මේ තොරතුරු සංවෘත්ත සාකච්ඡාවක දී ඉදිරිපත් කොට ඇති අතර පසුව මාධ්‍යවේදීන් වෙත රාජ්‍ය නිලධාරීන් ඉදිරිපත් කර ඇත.





# විෂ ශරීර ගත වූ රුසියාවේ විපක්ෂ නායක ඇලෙක්සි ගේන්න

## ගුවන් ගිලන් රථයක් සයිබීරියාවට



විස ශරීර ගත වූ රුසියාවේ විපක්ෂ නායක ඇලෙක්සි නවල්නි සයිබීරියාවේ සිට රැගෙන ඒමට ගුවන් ගිලන් රථයක් ජර්මනියේ සිට ගමන් අරඹා තිබේ.

එහෙත් ඔහුට ප්‍රතිකාර ලබාදෙන රෝහලේ ප්‍රධාන වෛද්‍යවරයා පවසන්නේ නවල්නි චලනය කිරීමට සුදුසු තත්ත්වයක නොසිටින බවයි.

විපක්ෂ නායකයාගේ මාධ්‍ය ප්‍රකාශිකාව පවසන්නේ වෛද්‍යවරයාගේ මේ තීරණය ඔහුගේ ජීවිතයට තර්ජනයක් බවයි. බ්‍රහස්පතින්දා ගුවන් යානයක දී රෝගාතුර වූ ඔහු දැන් සිහි විසඥ තත්ත්වයේ පසුවෙයි.



# ජපානයේ ජනප්‍රිය නින්ජා කෞතුකාගාරයක් හොරු බිඳලා

## කිලෝ 150ක සේප්පුව හොරු උස්සති

## මිලියනයක වැඩි මුදල් තිබිලා



ජපානයේ ජනප්‍රිය නින්ජා කෞතුකාගාරයකට සොරුන් පිරිසක් කඩා වැදී යෙන් මිලියනයක පමණ සොරකමක් සිදු කර ඇතැයි වාර්තා වේ.

මධ්‍යම ජපානයේ ප්‍රසිද්ධ ඉගා නින්ජා කණ්ඩායමේ ඉතිහාසය දැක්වෙන මේ කෞතුකාගාරය ඉගා රියු ලෙස හැඳින්වේ. එරට වේලාවෙන් උදෑසන 1.30ට කෞතුකාගාරයේ අනතුරු ඇඟවීමේ සීනුව නාද වී ඇති බැවින් පොලීසිය කැඳවා තිබේ.

අලවංගුවකින් එහි කාර්යාලයේ දොර කඩා කිලෝග්‍රෑම් 150ක් පමණ බර සේප්පුව ඔසවාගෙන ගොස් ඇත. කෞතුකාගාරය පවසන්නේ 1,100ක් පමණ වූ පිරිසකගේ ඇතුළත්වීමේ ගාස්තු මෙම සේප්පුවේ තිබූ බවයි.

# ගාලු කොටුවට රතු එළියක්



## ජල කානුවක් අහුරා වැසිකිළි වළක් හදලා

## අලුතින් කොන්ක්‍රීට් පඩි පෙළ දෙකක්

උකුසු ඇස

ukusuase@lakehouse.lk





## පැරණි ආයුධ ගබඩාවක් වැසිකිළියක් කරලා!

## කොටු පවුරට පහළින් අලුතින් මංතීරුවක්

## දකුණු පළාත් ආණ්ඩුකාරතුමනි මේ ඔබේ අවධානය පිණිසයි

කුරුණෑගල බුවනෙකභා රාජ සභා පුරා විද්‍යා ස්මාරකය කඩා දැමීමේ ආන්දෝලනාත්මක සිද්ධියේ උණුසුම නිවී යන්නටත් කලින් ලෝක උරුමයක් වන ගාල්ල කොටු පවුරද ලෝක උරුම ලැයිස්තුවෙන් ඉවත් කිරීමට පවා තුඩුදෙන අයුරුන් එය විනාශ කිරීමට පුරා විද්‍යාවෙ ඇත්තන්ම මේ දිනවල කටයුතු කරමින් ඇතැයි චෝදනා කරන ගාලු ජනතාව මේ පිළිබඳව ජනාධිපතිතුමාගේ දැඩි අවධානය යොමු වේවායි පතති.

පුරා විද්‍යා ස්මාරක විනාශ කරන්නේ දේශපාලකයින් හා ඔවුන්ගේ අනුගාමිකයින් යයි ප්‍රසිද්ධ වුවද සැබවින්ම මෙම ස්මාරකයන් විනාශ කිරීමේ වගකීම පුරා විද්‍යාව හා එයට අනු බද්ධිත ආයතන වගකිව යුතු බව ඔවුහු පෙන්නා දෙති

විවිධ හේතුන් මත පසුගිය කාලයේ මෙම ගාල්ල පුරා විද්‍යා ස්මාරකය ලෝක උරුම ලැයිස්තුවෙන් ඉවත් කිරීමට යද්දි දැඩි උත්සාහයන් නිසා ඒවා වැළකී ගියේය.

මෙවර මෙම අනුවේදනිය තත්වයන් ලෝක උරුම ගාලු කොටුවට සිදු කරමින් යන්නේ පුරා විද්‍යා දෙපාර්ත්තමේන්තුව නාගරික සංවර්දන අධිකාරිය හා මෙම උරුමය කළමනාකරනය කිරීම සදහාම ඇති ගාලු උරුම පදනම යන ආයතනන් බව පෙන්නා දෙනු කැමැත්තෙමු

මෙම ලෝක උරුමය සිංහල පෘතුගීසි ලංදේසි හා ඉංග්‍රීසි යන සිව් ජාතින්ගේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන් හා විවිධ වූ ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණයන් ඉතිරි වී ඇති දකුණු ආසියාවේ ඇති එකම පුරා විද්‍යා ස්මාරකයක් විම ඉතා සුවිශේෂිව පවති.

මෙවන් වටිනාකමකින් දෙස් විදෙස් සංචාරකයින්ගේ පුරා විද්‍යා ගවේෂකයින්ගේ හා ඉතිහාසඥයින්ගේ තක්ෂිලාවක් බදු වූ මෙම ලෝක උරුම ගාලු කොටු පවුර මෙවර විනාශ කරමින් එහි ඇති පුරා විද්‍යා වටිනාකම හා පුරා විද්‍යාත්මක පරිසරය අකා මාකා දමමින් සිටින්නේ මෙම කොටු පවුර සංරක්ෂණය කිරිම සදහා දැනට ක්‍රියාත්මක වෙමින් ඇති ලෝක බැංකු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම හරහාය.

රුපියල් බිලියන 700ක් පමන වන මෙම ව්‍යා පෘතිය ක්‍රියාත්මක කිරිමේ ආයතනය වන්නේ නාගරික සංවර්ධන අධිකාරියයි. මෙහි වැඩ කිරිම සදහා මේ වනවිට කොන්ත්‍රාත් සමාගම් දෙකක් ක්‍රියාත්මක වෙමින් පවති.

මෙහි අධික්ෂණ භාරව සිටින්නේ පුරා විද්‍යා ක්ෂේත්‍රයහි පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ හා මධ්‍යම පරිසර අධිකාරිවල සිටි අයකි. මෙහි කැණීම් බළධාරියා වන්නේ හිටපු පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂවරයකු වන පුරා විදඥ යකි.

මේවා හරිහැටි කරනවාද බැලිම සදහා පුරාවිද්‍යා දෙපාර්ථමේන්තුව විසින් පත්කර ඇත්තේ දකුනු පළාත් පුරා විද්‍යා කාර්යාලයයි

එහෙත් අද සිදුවි ඇත්තේ මහා විනාශයක් බව අප ජනාදිපතිතුමාටත් අගමැතිතුමාටත් දකුණු පළාත් ආණ්ඩුකාරතුමාටත් මෙසේ පෙන්නා දෙන්නේ මේ ජාතික උරුමය තව දුරටත් රැක ගැනිමේ උදාර චේතනාවෙන්මය.

අප දන්නා පරිදි පුරා විද්‍යා ස්මාරකයකට හානි කිරිම හෝ ඒවා නවිකරණය කිරිම හෝ අලුතින් කොටස් එකතු කිරිම වරදකි. එවන් වරදවල් සිදු කළ කොටුවේ සුළු නිවාස හිමියන් උසාවි ගානේ ගෙන ගොස් දඩ ගැසු වර අනන්තය.

ලෝක උරුමයක් තුළ ලෝකයේ බාලිකා විදුහලක් පිහිටා ඇති එකම සජීවි උරුම බිම මේ ගාලු කොටුවය. මෙහි ශිල්ප හදරන බාලිකාවන්ගේ සුරක්ෂිතතාව උදෙසා පුරා විද්‍යාවේද අනුමැතිය යටතේ ඉදිකළ කුඩා තාප්පයක උස නියමිත උසට වඩා අඟලක් වැඩි යයි පවසමින් එහි විදුහල්පතිනිය උසාවි ගෙන්වා සමස්ත තාප්පයම ගලවා දැමු මේ පුරාවිද්‍යා දෙපාර්ථමේන්තුව මේසා විශාල හානියක් සිදුකරමින් ඇති ලෝක උරුමය ගැන ඇස් ඇර බලන්නේ නැත්තේ මන්දැයි අපට මහත් ගැටලුවකි.

ගාල්ල ලෝක උරුම කොටු පවුරට මේ දිනවල අලුතින් කොන්ක්‍රිට් පඩි පෙලවල් දෙකක් යාකරමින් පවති. මෙය කොටුව හමුද කදවුර දකුණු පසින් ඇති අව්රෝව අසල සකස් කරමින් පවතින අතර එකම තැනක මෙවැනි පඩි පෙළවල් දෙකක් සකස් කරන්නේ මොන පුරා විද්‍යා පදනමකින්ද යන්නද ගැටලුවකි. එපමණක් නොව ඒ අසල ඇති පැරැණි ආයුධ ගබඩාවක් ගාලු උරුම පදනම විසින් වැසිකිළියක් බවට පත්කර ඇත. එහි වඩාත්ම අපරාධය වන්නේ මේ වැසිකිළිය සදහා වන වැසිකිළි වළ සකස්කර ඇත්තේ මෙම කොටුව ඇතුළතින් ඇති මුහුදට වැටෙන ජල කානුවක් අහුරා දමමින්විම හාස්‍ය ජනකය.

ඇස්හැර බලන්නකුට මෙම ඉපැරණි කානුවේ ජල බැස්ම මුහුදට වැටෙන තැන ඉතා පැහැදිලිව පෙනෙන්ට තිබිය දි මෙම කානුව සම්පූර්නයෙන්ම වැසෙන පරිදි සිදු කර ඇති වැසිකිළිවළ නිසා කොටුව තුළ ඇති ජලය බැස යෑම හිර වි ඇති අයුර මෙහි ඇති ජායා රූපයෙන් පෙනි යයි. මේ නිසා කොටු පවුර ගැලවි යැමේ තර්ජනයකට මුහුන දිමට පවා සිදුවිය හැකි බව පෙනි යයි.එපමණක් නොව වාස්තු විද්‍යඥයින් පවා විරුද්ධව කොටු පවුර පහලින් අලුතින් මංතිරුවක් කොටුව වටා ඉදිකරමින් යන අතර සමහර තැන්වල ඒ සදහා ඉඩ ලබා ගෙන ඇත්තේ පැරණි කොටුවේ කොටස් පවා කපා දමමිනි.

ඒ විතරක් නොව මෙම ලෝක උරුමයේ වඩාත් ම සුවිශේෂි ස්ථානය වන්නේ කළු කොටුවය. එහි සිදුකරන කිසියම් කැණිමක් සිදුවිය යුත්තේ පුරා විද්‍යාත්මක පදනමක් මත වුවද පසු දිනක මෙහි වැදගත්ම ස්ථානයක් මා යන විටද වැඩකරන සේවකයින් භාරනු දක්නට ලැබුවේ මහා නාරසනයන් (අලවංගු) වලිනි එහෙත් මෙහි සිටි එකද නිරික්ෂකයකු දකින්නට පවා නොලැබිණි.

ලෝක උරුම කොටු පවුරෙහි ඇති වාස්තු විද්‍යාත්මක ගතිය පුරා විද්‍යාත්මක හැඩ හුරුකම් මෙසේ පුරා විදෑඥයින් යයි කියා ගන්නා පිරිස්වලට වෙනස් කරන විට මෙහේ ඇති පුරා විද්‍යාත්මත පැවැත්ම රඳවා ගත හැකි වන්නේ දැයි අපි පුරා විද්‍යා කොමසාරිස්තුමා ගෙන් ප්‍රශ්න කර සිටින්නෙමු. එපමණක් නොවේ ලෝක උරුමය සංරක්ෂණය කරන්නේ යයි පවසමින් මේ සිදුකරන පුරා විද්‍යා සංහාරය ඔබ විසින් අනුමත කරන්නේ දැයි අපි ප්‍රශ්නකර සිටින්නෙමු

මේ සම්බන්ධයෙන් අප පුරා විද්‍යා දකුණු පළාත් අධ්‍යක්ෂක තුමිය ගෙන් විමසු විට ඇය කළේ මේ සම්බන්ධයෙන් ගොලුවත රැකිම ඔබ දකින ඔබ දැක්ක දේ ලියන්නයි කියා සිටියේය.

මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරයේ උසස් නිලධාරිමතකු ගෙන් කළ විමසිමකට පිළිතුරු ලබා ගැනිමද උගහට විය.

එහෙත් අප විසින් නිල නොවන මට්ටමින් සිදුකළ ගවේෂණයේ දි මේ සම්බන්ධයෙන් පුරා විද්‍යාවේ ඇත්තන් කිසියම් අනතුරු හැගවිම් කර ඇති බවක් හෙළිවි ගියේය

මෙම කොටුව කළමනාකරණය කරන ගාලු උරුම පදනම මේ වනවිට හුදෙක් දේශපාලන ආයතනයක් බවට පත් වි ඇති නිසා මේවා ගැන සොයාබලන බවෙක් ද නොපෙනි යයි.

මෙම ව්‍යාපෘතියේ සේවයේ යදි සිටින උසස් නිලධාරියකු පවසා සිටියේ කොටුව සංරක්ෂණ කරන මෙම ව්‍යාපෘතිය එක්තරා නිළධාරන් පිරිසක් මහා විශාල මුදල් ගසා කැමක් ඉතා සංවිධානාත්මකව සිදු කරන බවත් මෙහි අවසානය වන්නේ යුනෙස්කෝව විසින් මෙම ලෝක උරුමය ලෝක උරුම ලැයිස්තුවෙන් ඉවත් කිරිමකට මග පැදි ඇති බවත්ය.

මෙම තත්ත්වය පිළිබදව වහාම ජනාධිපතිතුමා විසින් විධිමත් පරික්ෂණයක් පවත්වන ලෙස ගාල්ලේ කොටුවේ වෙළද ව්‍යාපාරිකයෝ හා විද්වත් පිරිස් ඉල්ලා සිටිති.

**ගාල්ල දිසා සමුහ - නන්දසිරි වැලිගමගේ**



සතර දෙසින්

pronews@lakehouse.lk

ප්‍රාදේශීය පුවත්

## නොච්චිකුලම රක්ෂිතයෙන් කැපූ බුරුත කඳන් තොගයක් දැලේ

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

වවුනියාවේ නොච්චිකුලම රක්ෂිත වනයෙන් අනවසරයෙන් කපා ප්‍රවාහනය කරමින් තිබූ රුපියල් ලක්ෂ හතරක් පමණ වටිනා බුරුත කදන් තොගයක් හා සැකකරුවකු 21 ද අලුයම පුලියන්කුලම පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් විසින් අත් අඩංගුවට ගෙන තිබේ.

කැබ් රථයකින් ප්‍රවාහනය කරමින් තිබූ මෙම බුරුත කඳන් තොගය වවුනියාවේ පූන්තොට්ටම් ප්‍රදේශයේ පිහිටි වඩුමඩුවක් වෙත ප්‍රවාහනය කරමින් තිබියදී පොලිස් විශේෂ කාර්ය බලකායේ නිළධාරීන් විසින් අත් අඩංගුවට ගෙන ඇත්තේ ඔවුන්ට ලැබුණු තොරතුරක් මතයි.

අත් අඩංගුවට ගත් බුරුත කඳන් තොගය වාහනය හා සැකකරු ඉදිරි පරීක්ෂණ කටයුතු සදහා පුලියන්කුලම පොලීඉස්ය වෙත බාර දී අති අතර පොලීසිය සැකකරු වවුනියාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ.



## මීගම කුඹුරු අක්කර 53ක සාර්ථක වී වගාවක්

**කළුතර විශේෂ - සැම්සන් ප්‍රේමසිරි**

බෙන්තර ගඟ දකුණු ව්‍යාපාරයට අයත් වලගෙදර කෙට්ඨාසයට අයත් මීගම ප්‍රදේශයේ කුඹුරු අක්කර 53ක් මේ කන්නයේ සාර්ථක ලෙස වී වගා කර තිබේ.

බී ජී 450 සහ බී ඩබ්ලිව් 367 යන වී වර්ග මෙසේ වගා කර ඇති අතර බී ඩබ්ලිව් 367 වගා කිරීමෙන් අක්කරයකට වී බුසල් 82ක අස්වැන්නක්ද බි ජී 450 වගාකිරීමෙන් අක්කරයකට බුසල් 63ක අස්වැන්නක්ද ලබා ගැනීමට ගොවීන්ට හැකි වී ඇතැයි වලගෙදර කෘෂිකර්ම උපදේශිකා හෂිනි දිනූෂිකාද සිල්වා මෙණෙවිය දිනමිණට පැවසුවාය.

වසර 40ක් තිස්සේ පුරන්ව පැවති මේ වෙල්යායේ බිම් සකස් කිරීමේ කටයුතු සඳහා බස්නාහිර පළාත් සභාව මගින් රුපියන් පන්ලක්ෂයකට වැඩි මුදලක් ගොවීන්ට ලබා දි තිබේ. ඒ අනුව ගොවිහු ඒකරාශී වී මේ වෙල්යාය නැවත අසවැද්දිමට පටන්ගත් අතර එහි වී අස්වනු නෙළීමේ කටයුතු වරාය බඟාලුම් හා සැපයුම් රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. කරදිය ගැලීම හා නිසි ජලපාලන ක්‍රමයක් නොමැති නිසා මිගම වෙල්යායේ අක්කර විශාල ප්‍රමාණයක් පුරන් කුඹුරු බවට පත්ව තිබේ.

## බේරා නොගත් උකස් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**සීමාසහිත උඩිස්පත්තුව විවිධ සේවා සමුපකාර සමිතියේ,**

**උඩිස්පත්තුව, උඩබාගේ, රංගල, වෑගල**

යන ග්‍රාමීය බැංකු ශාඛාවල 2018.01.01 සිට 2018.12.31 දින දක්වා උකස් තබන ලද එහෙත් බේරා නොගත් රත් භාණ්ඩ 2020.08.29 හා 2020.08.30 වන දින පෙ.ව. 9.00 ට සීමාසහිත උඩිස්පත්තුව විවිධ සේවා සමුපකාර සමිතියේ රැස්වීම් ශාලාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**මෙයට - සමුපකාරික සාමාන්‍යාධිකාරී**
**සී/ස උඩිස්පත්තුව වි. සේ.ස. සමිතිය,**
**උඩිස්පත්තුව.**
2020.08.07

දු. අංකය : 081-2053740

---

215/C/3/10 ඇන්ඩර්සන් නිවාස, උද්‍යාන පාර කොළඹ 5 (757750988X) කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරුළ ග්‍රාම නිලධාරී වසමේ පදිංචි පිච්චෙයි **මුත්තු අනුසූයා දේවි** වන මම අද පටන් **අනුෂා දේවි පිච්චමුත්තු** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට, **අනුෂා දේවි පිච්චමුත්තු**

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව 2020 අගෝස්තු 14 දින කරන ලද පහත සඳහන් සංස්ථාගත කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : **සන්ජ් පෝල් එම්. (ප්‍රයිවට්) ලිමිටඩ්**
සමාගමේ අංකය : PV 00225905
ලියාපදිංචි ලිපිනය : නො. 415, වේල්ස් කුමාර මාවත, ග්‍රෑන්ඩ්පාස්, කොළඹ - 14.

**ජේසී සහ සමාගම**
**සමාගම් ලේකම්වරු**
**නො. 9/5, තම්බයියා ඇවනියු, කොළඹ - 7.**

---




සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

---

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

### මහා මාර්ග අමාත්‍යාංශය

## මාර්ග සංවර්ධන අධිකාරිය

### මහජනයා වෙත කෙරෙන නිවේදනයයි

### ලිදුල අග්‍රාකෙලවර මාර්ගයේ 14/6 දරන පාලම අලුත්වැඩියා කිරීම හේතුවෙන් වාහන ගමනාගමනය සඳහා මාර්ගය වසා තැබීම

ලිදුල අග්‍රාකෙළවර මාර්ගයේ 14/6 දරන පාලම අලුත්වැඩියා කිරීම හේතුවෙන් 2020.08.25 වනන දින සිට 2020.08.31 වන දින දක්වා වාහන ගමනාගමනය සඳහා මාර්ගය වසා තබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ත්‍රිරෝද රථ බයිසිකල් හා මහජනතාවට වැඩ බිම හරහා කඩින් කඩ යැවීමට කටයුතු කරන අතර, ඉහත මාර්ගයේ ලිඳුල සිට 14/6 දරන පාලම දක්වා ගමන් කිරීම සිදු කළ හැක. පාලමෙන් ඉදිරියට ඩයගම නගරය දක්වා ගමන් කිරීමට අවශ්‍ය වන්නේ නම් හැටන් දික්ඔය හරහා මන්රාසි නගරය වෙත ගමන් කර ඩයගම දක්වා ගමන් කිරීම සිදු කළ හැක.

**අධ්‍යක්ෂ ජනරාල්**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**

**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**"මගනැගුම මහමැදුර", 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

---

## නම වෙනස් කිරීමයි

ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 31/3 දෙහිමල්වත්ත පාර මීගමුව ලිපිනයේ පදිංචි **යොන් පල්ලියවත්තගේ මනාෂා කේතකී** නමින් හැඳින්වූ මා මෙතැන් පටන් **යොන්පල්ලිය වත්තගේ මනාෂා කේතකී** යන නමින් පෙනී සිටින බව ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.


මෙයට,
**යොන්පල්ලිය වත්තගේ**
**මනාෂා කේතකී**

---

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ න්න්නපුරාව දිවියාපොල පදිංචි **කෝනාර මුදියන්සේලාගේ විමලසේන** වන මම මෙතැන් සිට **දිසානායක මුදියන්සේලාගේ විමලසේන** යනුවෙන් භාවිත කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට හා මහජනතාව වෙත මෙයින් දන්වා සිටී.

මෙයට,
D.M. විමලසේන

---




---




---

### වැවිලි අමාත්‍යාංශය

## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

### මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) -MM 1.1 (II ශ්‍රේණිය)

**රැකියා විස්තරය** : ආයතනයේ සියලු සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳව වගකිව යුතු වේ.

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයන් හි පන්ති සාමාර්ථයක් සහිත උපාධිය සහ එම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව පිළිගත් රාජ්‍ය සංස්ථා/මණ්ඩල/රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පෞද්ගලික ආයතනයක සාමාන්‍ය පරිපාලනයට අදාළව අවම වශයෙන් වසර තුනක (03) සේවා පළපුරුද්ද,

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයන් හි විශේෂ උපාධිය සහ එම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව පිළිගත් රාජ්‍ය සංස්ථා/මණ්ඩල/රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පෞද්ගලික ආයතනයක සාමාන්‍ය පරිපාලනයට අදාළව අවම වශයෙන් වසර පහක (5) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

අදාළ ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකරණ (I ශ්‍රේණිය) තනතුරක වසර පහක (05) සේවා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : MM 1.1-2016, Rs.[53,175-10X1,375-15X1,910-95,575]
(ආරම්භයේ දී රු. 53,175/- හා රජයේ අනුමත අනෙකුත් දීමනා වලට හිමිකම් කියනු ලැබේ.)

**වයස් සීමා** : වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතුවූවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය** : වෘත්තියවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

පොදු කරුණු අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව හා පරිගණක සාක්ෂරතාවය තිබිය යුතුය.

### 02. නේවාසිකාගාර කළමනාකරු -JM 1.1 (II ශ්‍රේණිය)

**රැකියා විස්තරය**

: නේවාසිකාගාරයට අයත් සියලුම දේපල නඩත්තු කිරීම, නේවාසිකාගාර කාර්ය මණ්ඩලයට රාජකාරි පැවරීම හා අධීක්ෂණය කිරීම, ආහාරපානවල ගුණාත්මක භාවය තහවුරු කිරීම, නේවාසිකාගාරයේ භාණ්ඩ, උපකරණ හා කාමර නිසි පරිදි පවත්වා ගැනීම, අභ්‍යන්තර/බාහිර පුහුණු වැඩ සටහන් හා අධ්‍යයන පාඨමාලා සඳහා සහභාගිවන්නන්හට ආහාරපාන හා නවාතැන් පහසුකම් ලබා දීම, කළමනාකාරීත්වය විසින් පවරනු ලබන වෙනත් රාජකාරී කටයුතු සිදු කිරීම

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

පිළියගත් ආයතනයකින් ලබා ගත් හෝටල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව පිළිගත් හෝටලයක අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද

හෝ

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හෝ වෙනත් පිළිගත් හෝටල් පාසලකින් ලබා ගත් හෝටල් පාසල් ඩිප්ලෝමාව සමග අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම හා කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (I ශ්‍රේණිය) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද සමග මාස 03 ක හෝටල් පාලනය / කළමනාකරණය පිළිබඳ හෝ අදාළ වෙනත් පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

**වැටුප් පරිමාණය** : JM 1.1-2016, Rs. [42,600-10X755-18X1,135=70,580]
(ආරම්භයේ දී රු. 42,600/- හා රජයේ අනුමත අනෙකුත් දීමනා වලට හිමිකම් කියනු ලැබේ.)

**වයස් සීමා** : වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත තරගකාරී විභාගයක් සහ වෘත්තියවේදී සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු** : අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව හා පරිගණක සාක්ෂරතාවය තිබිය යුතුය.

**වෙනත් ප්‍රතිලාභ**

- සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් මූලික වැටුපෙන් 12% ක හා 3% ක දායකත්වයක් ආයතනය විසින් ලබා දෙනු ලැබේ.

  (සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය මූලික වැටුපෙන් 10% කි)
- සාමාජිකයා හා ඔහුගේ ළඟම පවුලේ සාමාජිකයින් සඳහා දායකත්ව සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- ආසන්නම නගර සඳහා ප්‍රවාහන පහසුකම් (කඩුවෙල/ කොට්ටාව)

**අයදුම් කරන පිළිවෙල**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත ඔබගේ සම්පූර්ණ ජීව දත්ත සටහන, **අදාළ සහතිකවල පිටපත් සහිතව** ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට **2020 සැප්තැම්බර්** මස 04 වන දින හෝ ඊට පෙර ලැබීමට සැළැස්විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානින් මගින් යොමු කළ යුතු වේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබා තනතුර සඳහන් කළ යුතුය. කිනම් තත්වයක් යටතේ වුව ද අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර නොගන්නා අතර, කිසිදු ආකාරයකින් බලපෑම් කිරීම හෝ ඊට තැත් කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය,**
**එම්.ඩී.එච්. ජයවර්ධන මාවත,**
**අතුරුගිරිය.**
**දුරකථනය : 011-2770232**

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### හෝමාගම අධිකරණ බල ප්‍රදේශයෙන් හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් කුලියට හෝ බද්දට ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම

**ගොඩනැගිලි පරිශ්‍රය,**

- වර්ග අඩි 15,000ක් පමණ විය යුතුය.
- කොට්ටාව, හෝමාගම, පිටිපන නගර ආශ්‍රිතව ප්‍රධාන මාර්ගයේ සිට පහසුවෙන් ළඟා විය හැකි කාර්යාලයකට සුදුසු පරිසරයක් තුළ පිහිටිය යුතුය.
- වෙන් වූ තෙකලා විදුලි පහසුකම් හා ජල පහසුකම් තිබිය යුතුය.

**ඊට අමතරව පහත පහසුකම් සඳහා ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.**

- වාහන සඳහා බාධාවකින් තොරව ප්‍රධාන පිවිසුම් දෙරටුව කාර්යාල පරිශ්‍රයකට ප්‍රමාණවත් පරිදි තිබිය යුතුය.
- කාර්යය මණ්ඩලයට සහ මහජනතාවට ප්‍රමාණවත් තරම් වැසිකිළි පහසුකම් තිබීම.
- පිවිසුම් මාර්ග වැසීමට හැකිවන සේ ගේට්ටුවක් තිබීම හා ගොඩනැගිල්ල පූර්ණ ආරක්ෂා සහිත වීම.
- අධිකරණ සංකීර්ණයට හා වානිජ බැංකුවලට ආසන්න වීම.
- ආරක්ෂිත නිලධාරීන්ට රැඳී සිටීමට ගොඩනැගිල්ලට පිටතින් කුටියක් සහ බාහිර වැසිකිළි පහසුකම් තිබීම හෝ පසුව ඉදිකර දීමේ හැකියාව.
- ආබාධිතයන්ට පැමිණීම සඳහා ප්‍රවේශ මාර්ගයක් තිබීම හෝ පසුව ඉදිකර දීමේ හැකියාව .
- මහල් ගොඩනැගිල්ලක් නම් බිම් මහල සහ පළමු මහල අයත් වීම, ඊට ඉහළ මහල් ගොඩනැගිල්ලක් නම් විදුලි සෝපාන සවිකර තිබීම අමතර සුදුසුකමක් වේ. එසේම සෑම මහලකටම වෙන්වූ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් තිබිය යුතුය.
- වාහන නැවැත්වීමට ප්‍රමාණවත් ඉඩකඩක් තිබීම (නවතා තැබිය හැකි වාහන ප්‍රමාණය සඳහන් කරන්න)
- ගොඩනැගිල්ල වායු සමීකරණය කර තිබීම අතිරේක සුදුසුකමකි.

ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැලැස්මක් සහ ගොඩනැගිල්ලේ හිමිකම පිළිබඳ තොරතුරුද ඇතුළත් ඔබගේ මිල ගණන් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුද්‍රා තබා 2020.09.14 දින ප.ව. 2.00ට පෙර **බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 234/ඒ3** හි පිහිටි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අතින් රැගෙනවිත් ඉහත වේලාවට පෙර මෙම දෙපාර්තමේන්තුවේ සැපයීම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ යුතුය. මිල ගණන් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට හෝ බද්දට ගැනීම - 2020"** යනුවෙන් සඳහන් කළ යුතුය.

2020. 09. 14 දින ප.ව. 2.00ට ලංසු විවෘත කරනු ලබන අතර, එකී වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**රෙජිස්ට්‍රාර් ජනරාල්,**
**ප්‍රසම්පාදන කමිටු සභාපති.**

---





# මාතලේ - විල්ගමුව ගොඩැල්පත රක්ෂිතය ගිනි ගනියි

**නාඋල සමූහ**

මාතලේ - විල්ගමුව ගොඩැල්පත රක්ෂිතයට කිසියම් පිරිසක් විසින් පසුගිය ද (20ද) දහවල් ගිනි තබා ඇති බව වන සංරක්ෂණ නිලධාරිහු කියා සිටිති.

සතුන් දඩයමේ ගිය පිරිසක් විසින් මෙම ගිනි තැබීම සිදු කරන්නට ඇති බවට වන සංරක්ෂණ නිලධාරිහු සැක පළ කරති.

ගින්න හේතුවෙන් මේ වන විට අක්කර 100ක් පමණ විනාශ වී ඇති බවද ඔවුහු කියා සිටිති.

ගින්න නිවීම සඳහා විල්ගමුව පොලිසියේ නිලධාරින් වන සංරක්ෂණ නිලධාරින් ඇතුළු ප්‍රදේශවාසින් මහත් පරිශ්‍රමයක් දරා ඇති අතර අධික සුළං තත්ත්වය නිසා ගිනි නිවීමේ කටයුතු වලට දැඩි බාධා එල්ල කළ බව වන සංරක්ෂණ නිලධාරිහු කියා සිටිති.

වසරක් පාසා විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මාතලේ සිදුවන වනාන්තර ගිනි තැබීම් සම්බන්ධයෙන් පසුගිය සමයේ ද වඩාත් කතා බහට ලක්වූ අතර ගිනිතබන්නන් අත් අඩංගුවට ගෙන අධිකරණ වලට ඉදිරිපත් කළ ද කලක් තිස්සේ සිදුවන වනාන්තර ගිනි තැබීම් හේතුවෙන් මාතලේ වන සම්පතට හා සත්ව සම්පතට දැඩි බලපෑම් එල් වී ඇති බව පරිසර සංවිධාන ද කියා සිටියි.

සතර දෙසින්
pronews@lakehouse.lk
ප්‍රාදේශීය පුවත්

# සත්ව ආහාර හදන්න ගත් සහල් කිලෝ 30000ක් වාරියපොළින් අල්ලයි

**බණ්ඩාර රත්නායක - කුරුණෑගල අතිරේක**

මිනිස් පරිභෝජනයට ඉතාම සුදුසු තත්ත්වයේ පවතින සහල් තොගයක් භාවිතා කරමින් සත්ව ආහාර නිෂ්පාදනය කරමින් තිබූ වාරියපොළ, බණ්ඩාර කොස්වත්ත ප්‍රදේශයේ පිහිටි සත්ව ආහාර නිෂ්පාදන ආයතනයක් පෙරේද (20 ද) වැටලූ පාරිභෝගික කටයුතු අධිකාරියේ නිලධාරීහු අදාළ සහල් තොගය සිය භාරයට ගත්හ.

කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා පිහිටි සත්ව ආහාර නිෂ්පාදන ආයතන පරීක්ෂා කිරීම පාරිභෝගික කටයුතු අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය විසින් මේ දිනවල සිදුකරමින් සිටින අතර, එලෙස කළ පරීක්ෂාවකදී මෙම සහල් තොගය ද සොයාගනු ලැබීය. කිලෝ 30000 කට ආසන්න සහල් ප්‍රමාණයක් මෙලෙස සොයාගනු ලැබීය. 2020 ජූලි 23 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව සත්ව ආහාර නිෂ්පාදනය කිරීම සඳහා සහල් යොදාගැනීම තහනම් කර ඇති අතර එම කොන්දේසි උල්ලංඝනය වන අයුරින් අදාළ ආයතනය කටයුතු කර ඇති බව පාරිභෝගික කටයුතු අධිකාරිය කියයි. සත්ව ආහාර නිෂ්පාදනය කිරීමට අමුද්‍රව්‍යයක් ලෙස බඩඉරිගු යොදාගැනීමට වඩා සහල් යොදාගැනීම වඩා ලාභදායී වන බැවින් සත්ව ආහාර නිෂ්පාදකයින් මෙලෙස සහල් වැඩි වශයෙන් යොදාගැනීමට කටයුතු කරමින් සිටින බවත්, මෙම තත්වය තුළ ඉදිරියේදී වෙළඳපොළ තුළ සහල් හිඟයක් මතු විය හැකි බවත් පාරිභෝගික කටයුතු අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් ප්‍රධානී අසංක නන්එදිරි මහතා පැවසීය. අත්අඩංගුවට ගත් සහල් තොගය මුද්‍රා තබා ඇති අතර ඒවායේ සාම්පල සහ අදල ආයතනයේ හිමිකරුවන් වාරියපොළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

පාරිභෝගික කටයුතු අධිකාරියේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක මහතාගේ උපදෙස් පරිදි, කුරුණෑගල දිස්ත්‍රික් ප්‍රධානී ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි අසංක නන්එදිරි මහතාගේ ප්‍රධානත්වයෙන්, එච්.එම්.ඩී.ඒ.හේරත්, එච්.එන්.සුනේත්‍රා, ඒ.එම්.එස්.යූ. කුමාරදාස, ඩබ්ලිව්.පී. ලියනගේ, ඩී.බී.ආර්.අමරසිරි, ආර්.ඩී.බී.ආරියසිංහ සහ ජේ.එම්.බී.ජයසුන්දර යන විමර්ශන නිලධාරිහු වැටලීම සිදුකළහ.



වැටලීම සිදුකළ නිලධාරි කණ්ඩායම



අත්අඩංගුවට ගත් සහල් තොගය

ඡායාරූප - කුරුණෑගල අතිරේක

# මව නිවෙසේ නැති වෙලේ පියා දියණිය කෙලෙසලා

**ඩබ්ලිව්. සී. බී. ප්‍රනාන්දු - පුත්තලම සමූහ**

වයස අවුරුදු හතරක ළාබාල වියේ පසුවන තමාගේම හුරතල් දියණිය අමානුෂික ලෙස දූෂණය කර ඇතැයි කියන නරුම පියෙක් උඩප්පුව පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

ඉහත චෝදනාව යටතේ මෙසේ පොලිස් අත්අඩංගුවට ගෙන ඇත්තේ කොට්ටන්තිව් සින්නපාඩුව ප්‍රදේශයේ පුද්ගලයකුය. තම දියණිය අසල්වැසි නිවෙසක රඳවා තබා දැරියගේ මව අවශ්‍යතාවක් සඳහා බැහැරකට ගිය අවස්ථාවේ දැරියගේ පියා පෙරේද (20) දහවල් දැරියව නිවෙසට ගෙන්වාගෙන බලහත්කාරයෙන් මෙම අපරාධය සිදුකර ඇති අතර නිවෙසට පැමිණි අවස්ථාවේ සිද්ධිය දැනගත් දැරියගේ මව වහාම මේ බව සඳහන් කරමින් උඩප්පුව පොලීසියට පැමිණිලි කර ඇත.

සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර දූෂණයට ලක් වූ දැරිය වෛද්‍ය පරීක්ෂණයක් සඳහා පුත්තලම රෝහලට ඇතුළු කර තිබේ. උඩප්පුව පොලීසිය සැකකාර පියා පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

# අලියකු ගසා අයෙක් මරුට

**සරත් වෙලගෙදර - ඇළහැර සමූහ**

බකමූණ ගිරිතලේ ප්‍රධාන මාර්ගයේ ගල්වානපාලම අසලදී පෙරේද (20) උදේ පාපැදියකින් ගමන්ගත් පුද්ගලයකුට අලියකු පහර දී මරා දමා ඇති බව දියබෙදුම පොලීසිය ප්‍රකාශ කළේය.

මෙසේ මිය ගොස් ඇත්තේ රදවිගේඔය ගම්මානයේ පදිංචිව සිටි ලියනආරච්චිලාගේ අරනෝලිස් නමැති 80 හැවිරදි පුද්ගලයකි. මෙම පුද්ගලයා පාපැදියෙන් මාර්ගයේ ගමන් ගනිද්දී අලියා පහර දී මරා දමා තිබේ. මරණ පරීක්ෂණය පෙරේද (20) දහවල් පැවැත්වීමට නියමිතව තිබිණි. දියබෙදුම පොලීසිය මරණය සඳහා පරීක්ෂණ පවත්වයි.

# අතුරලියට මහජන පුස්තකාලයක්





**විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ**

අතුරලිය ප්‍රාදේශීය සභාවට අයත් තිබ්බොටුවාව දෙමහල් වෙළෙඳ සංකීර්ණයේ උඩුමහලේ නව මහජන පුස්තකාලයක් ආරම්භ කෙරිණි. අතුරලිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සභාපති තිහාල් ද සිල්වා මහතාගේ ආරාධනයෙන් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් සේනක පල්ලියගුරුගේ සහ මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් දම්සිරි කරුණාජීව මහත්වරු නව පුස්තකාලය විවෘත කිරීමේ උත්සවයට සහභාගි වී සිටියහ.

# බොන්න ගෙනා කුඩුත් එක්ක පොලිස් දැලේ

**ඩබ්ලිව්.සී.බී. ප්‍රනාන්දු - පුත්තලම සමූහ**

හෙරොයින් භාවිතයට තදින් ඇබ්බැහි වී ඇති අයෙක් තම භාවිතය සඳහා ගෙනැවිත් තබාගෙන තිබූ හෙරොයින් මත්කුඩු ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 260ක් සමග මාරවිල පොලීසියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඔත්තුවකට අනුව ඉද්දමල්ගොඩදී හෙරොයින් සමග මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ එම ගම්මානයේ පදිංචි 23 හැවිරිදි වියේ පසුවෙන තරුණයකුවය. සැකකරු හෙරොයින්වලට තදින් ඇබ්බැහි වී ඇති අයෙක් බව පොලිස් පරීක්ෂණවලදී හෙළි වී ඇත. මාරවිල පොලීසියේ උප පොලිස් පරීක්ෂක මධුරංග මහතා ප්‍රමුඛ පොලිස් කණ්ඩායමක් විසින් හෙරෝයින් සමග අත්අඩංගුවට ගෙන ඇති මෙම සැකකරු එම මත්කුඩුත් සමග මාරවිල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබිණි.

# මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනයට නව ගොඩනැගිල්ලක්

**ඇම්.පී චන්ද්‍රපාල - ගල්ල විශේෂ**

මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීම මේ මස 26 වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ ඌරපොල නව දිගන්තය ප්‍රදේශයේදි සිදු කෙරේ.

මෙම ගොඩනැගිල්ලට මුල්ගල් තැබීම අත්තනගල්ල විහාරාධිපති පූජ්‍ය පන්නිල ආනන්ද හිමිපාණන් ඇතුලු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මේජර් කමල් ගුණරත්න මහතා අතින් සිදුවෙන අතර ගම්පහ දිස්ත්‍රික්කයේ මැති ඇමතිවරුන් කිප දෙනෙකුද මෙම අවස්ථාවට සහභාගි විමට නියමිතය.ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදේස් මත ඉදි කෙරෙන මෙම ගොඩනැගිල්ල ඉදිකිරිමෙන් පසු මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් 1000 කට ඉඩ පහසුකම් ඇත.

# උතුරේ උළුඳු කෑමවල ගණන් වැඩි වෙලා



**රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ**

උළුඳු කිලෝවක මිල රුපියල් දහසක් දක්වාත් පොල්තෙල් ලීටරයක මිල රුපියල් හයසීය දක්වාත් ඉහළ යෑම හේතුවෙන් උතුරේ ආපන ශාලාවල තෝසේ හා උළුඳු වඩේ මිල ගණන් සාමාන්‍ය ජනතාවට දැරිය නොහැකි අන්දමට ඉහළ ගොස් තිබේ.

මෙම මිල ගණන් ඉහළ යෑමට පෙර උළුඳු වඩයක් රුපියල් විස්සකට ද තෝසේ එකක් රුපියල් පහළොවකට ද අලෙවි වූ නමුත් මේ දිනවල උළුඳු වඩයක් රුපියල් පනහක් දක්වාත් තෝසේ එකක මිල රුපියල් හතළිහක් දක්වාත් ඉහළ ගොස් තිබේ.

උළුඳු වඩේ බැදීම සඳහා උළුඳු හා තෝසේ යන දෙකම අවශ්‍ය නිසා කලින් රුපියල් විස්සකට අලෙවි වූ උළුඳු වඩයක බාගයක් තරම්වත් මේ දිනවල අලෙවි වන උළුඳු වඩයක් විශාල නොවන බව ජනතාව කියා සිටිති.

උතුරේ ගොවීන්ගෙන් උළුඳු වගාව ඉවත් වී යෑමත් කොරෝනා වයිරස් රෝගයත් සමග ඉන්දියාවෙන් උළුඳු ආනයනය කිරීම සීමා වී ඇති නිසාත් වෙළෙඳපළේ උළුඳු මිල ගණන් ඉහළ ගොස් තිබේ.

# බදුල්ලේ බඩඉරිඟු යායක් සේනා දළඹු උවදුරින් විනාශයි



**සුනිමල් ශ්‍රියානන්ද - මහියංගණය සමූහ**
**උබයරත්න වනසිංහ - පස්සර සමූහ**
**ජයසේන විජේනායක - බදුල්ල දිසා සමූහ**

බදුල්ල පස්සර මැටිගහතැන්න ප්‍රදේශයේ අක්කර තිහක (30) පමණ වූ බඩඉරිඟු වගාවකට සේනා දළඹු වසංගතය පැතිර ගොස් ඇතැයි ගොවීහු පවසති. එම උවදුරින් ප්‍රදේශයේ බඩඉරිඟු වගාව මුළුමනින්ම විනාශ වී ගොස් ඇති බව මැටිගහතැන්න ගොවි සංවිධානය මඟින් බදුල්ල දිසාපති දමයන්ති පරණගම මහත්මිය වෙත ද දන්වා ඇත. බඩඉරිඟු වගාවට අමතරව බහුල වශයෙන්, උක් හා වී වගාව ද සිදු කෙරෙන ඇකිරිය, මැටිගහතැන්න හා කහටරුප්ප යන ප්‍රදේශවල ගොවීහු මෙම සේනා දළඹු වසංගතය තම වගාවන්ට ද බෝ වෙතැයි බිය පළ කරති.

වේගවත් වර්ධනයක් සහිතව සමූහ වශයෙන් පැතිර යන මෙම දළඹු විශේෂයෙන් බඩඉරිඟුවලට අමතරව සෝගම්, උක්, එළවළු, පලතුරු, අර්තාපල් හා රනිල බෝග වර්ගවලටද බරපතළ හානි පමුණුවන බව පවසන, අනුරාධපුර මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ නිශාන්ති ගුණවර්ධන මහත්මිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් මෙම ආපදාවෙන් තම වගාවන්ගේ හානිය අඩු කර ගැනීම සඳහා උපදෙස් රැසක් ගොවීන්ට දී ඇතැයි පැවසුවාය.

ඒ අතර මුළු වගා යායම එකවර වගා කිරීම, දළඹුවන් මතුවන මුල් අවස්ථාවේදීම දළඹුවන් සහ බිත්තර හඳුනාගෙන විනාශ කිරීම, වගාව මතට අළු, සිහින් වැලි හෝ පස් ඉසීම, කොහොඹ යුෂ/ තෙල් දස්පෙතියා මල් හා පත්‍ර යුෂ ඉසීම සහ සීනි ද්‍රාවණයක් එම වගාවේ පත්‍ර මතට එකතු කිරීම ඇතුළත්ය. එමගින් ආකර්ෂණය වන කුහුඹුවන් විසින් දළඹුවන් සහ බිත්තර ආහාරයට ගැනීම සිදු කෙරේ.



# හෙරොයින්වලට ඇල්លූ සැකකරුගෙන් සොරකමක් හෙළි වෙයි

**ඩබ්ලිව්. පී. ධර්මසේන - මාතර සමූහ**

නිවෙසකට ඇතුළු වී රුපියල් 46,600ක රන් ආභරණ සොරාගත් 'අලබුරියා' නමැති හෙරොයින් ජාවාරම්කරුවකු හොරොයින් ග්‍රෑම් 2 මිලිග්‍රෑම් 250ක් සමග කොටවිල පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු කඹුරුගමුව වැවඉහළ ප්‍රදේශයේ පදිංචි 26 හැවිරිදි අයෙකි. කඹුරුගමුව උතුර වසා තිබූ නිවෙසක පිටුපස දෙරේ අගුළු ගලවා පසුගියද (19) දහවල් කාලයේ ඇතුළු වී ඇති සැකකරු අල්මාරියේ තිබූ රුපියල් 31,000 ක් වටිනා පවුම් 1/ 2ක රන් මාලයක්, රුපියල් 15,000ක් වටිනා රන් සුර 2ක්, රුපියල් 600ක් වටිනා ඉමිටේෂන් වළලු 8ක් සොරාගෙන තිබිණි.

මෙම සොරකම සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ කොටවිල පොලීසිය පෙරේද (20) කඹුරුගමුව වැව අසලදී සැකකරු අත්අඩංගුවට ගෙන පරීක්ෂා කිරීමේදී ඔහුගේ සරමේ ගැටයේ සඟවාගෙන සිටි මෙම හොරයින් හමු වී ඇත. සැකකරුගෙන ප්‍රශ්න කිරීමේදී ඉහත සඳහන් රන්භා ණ්ඩ සඟවා තිබියදී පොලීසිය මඟින් සොයාගෙන ඇත. සැකකරු මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

# දොම්පෙ OICට අල්ලස් දෙන්න හැදූ සැකකරු අත්අඩංගුවට

**ගයාන් සංජය**

දෙම්පෙ පොලීසියේ ස්ථානාධිපතිවරයාට රුපියල් ලක්ෂ දෙකක අල්ලසක් දීමට උත්සාහ කළ සැකකරුවකු අල්ලස් කොමිසම මඟින් අත්අඩංගුවට ගෙන තිබේ.

ගංජා සමග අත්අඩංගුවට ගත් සැකකරුවකුගෙන් ප්‍රශ්න කිරීමේදී ගංජා ජාවාරමේ යෙදී සිටි දනුෂ්ක ලක්මාල් නමැත්තකු ගංජා ග්‍රෑම් 660ක් සමග අත්අඩංගුවට ගැනීමට පසුගියද (17) දෙම්පෙ පොලිස් නිලධාරීන් සමත් වී තිබේ. මෙම දනුෂ්ක ලක්මාල් නමැති සැකකරුගේ සහෝදරයකු විසින් තම මල්ලී නිදහස් කර දෙන මෙන් ඉල්ලා පසුගියද (18) දෙම්පෙ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සංජීව මහතාට රුපියල් ලක්ෂ දෙකක මුදලක් පොලිස් ස්ථානයටම පැමිණ දීමට උත්සාහ කර ඇත. එහිදී ස්ථානාධිපතිවරයා අල්ලස් කොමිසමට සිදුකළ පැමිණිල්ලකට අනුව අල්ලස් කොමිසමේ නිලධාරීන් මුදල් රැගෙන ආ සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත බස්නාහිර උතුර භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි iii චින්තක පීරිස් යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් දෙම්පෙ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සංජීව, උප පොලිස් පරීක්ෂකවරුන් වන කරුණාරත්න, එදිරිසිංහ, (24353) ලක්මාල්, (94466) තරිඳු හා අල්ලස් කොමිසමේ නිලධාරිහු පරීක්ෂණ සඳහා එක් වූහ.

# අලි ගමට දාලා අලිවැට ගහලා !

**සම්පත් ප්‍රියනන්දන - බළන්ගොඩ විශේෂ**

ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම සේවා වසම් හතකට වසර 10ක පමණ කාලයක් තිස්සේ පවතින වන අලි ගැටලුවට විසඳුම් වශයෙන් දැනට වසර තුනකට පෙර අලි වැටක් ඉදි කළද ගම් වැදී සිටි වන අලි කැලයට පලවා හැරීමකින් තොරව එම අලි වැට ඉදිකිරීම හේතුවෙන් වන අලි ගැටලුව දෙගුණ තෙගුණ වී ඇතැයි ජනතාව චෝදනා කරති.

අලි වැට ඉදි කිරීමට පෙර ප්‍රදේශයේ ගම්මාන කිහිපයකට පමණක් පැවති වන අලි ගැටලුව අලි වැට ඉදි කිරීමත් සමග ග්‍රාම සේවා වසම් හතකට වන අලින්ගෙන් කරදර සිදු වන බව ජනතාව කියා සිටිති. ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හල්පේ, මුත්තෙට්ටුගම, ඉත්තමළුව, උළුපිටිය, හතරභාගේ, කුඹල්ගම, පුවක්ගහවෙල යන ග්‍රාම සේවා වසම්වල පදිංචි ජනතාව මෙම වන අලි ගැටලුවෙන් වසර ගණනාවක සිට පීඩා විඳිති.



# වැල්ලවායේ පුස්තකාල පද්ධතියම අක්‍රිය වෙලා

**ජී. අයි. ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ**

වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මඟින් පාලනය කරනු ලබන පුස්තකාල පද්ධතියම මේ වන විට අක්‍රිය වී ඇතැයි ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආනන්ද නවරත්න (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ) මහතා පැවසීය.

වැල්ලවාය ප්‍රධාන මහජන පුස්තකාලයේ සංවර්ධන කටයුත්තක් සඳහා දැනට මාස හයකට අධික කාලයක සිට විවෘත නොකර ඇති බවත් පුස්තකාලය පරිහරණය කළ පාඨකයන් දහස් ගණනක් මේ හේතුව නිසා අසරණ වී ඇති බවත් පවසන ඒ මහතා සියඹලගුනේ ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති පුස්තකාලය මේ වන විට අක්‍රිය වීම හේතුවෙන් එම පුස්තකාලය පරිහරණය කළ දරු දැරියන් විශාල පිරිසක් ද අසරණ වී ඇතැයි කියා සිටියේය.

මේ සම්බන්ධයෙන් අප වැල්ලවා ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. ඩී. හරමානිස් මහතාගෙන් කළ විමසීමකදී ඒ මහතා කියා සිටියේ වැල්ලවාය මහජන පුස්තකාලය ප්‍රතිසංස්කරණ කටයුත්තක් සඳහා වහල ගලවා ඉවත් කර අලුතින් වහලක් සකස් කිරීම සඳහා පසුගිය කාලයේ වසා දැමූ බවත් එම ප්‍රධාන පුස්තකාලය ලබන සතියේ සිට පාඨකයන් සඳහා නැවත විවෘත කිරීමට අවස්ථාව ලැබෙන බවත්ය.

# හම්බන්තොට වැටලීමකින් 29 දෙනෙක් අත්අඩංගුවට

**ඇම්.පී චන්ද්‍රපාල - තංගල්ල විශේෂ**

මාතර හම්බන්තොට දිසා වැටලිම් පොලිස් ඒකකයේ නිලධාරින් ඉකුත් 1 වන දින සිට 15 වන දින දක්වා සති දෙක තුළ හම්බන්තොට පොලිස් අධිකාරි කොට්ඨාසය තුළ කරන ලද වැටලිම් වලදි සහ සෝදිසි කිරිම්වලදි හෙරෝයින් මත්ද්‍රව්‍ය සහ වියලි ගංජා ළග තබා ගෙන සිටි පුද්ගලයින් 29 දෙනෙකු පොලිස් අත් අඩංගුවට ගත් බව හම්බන්තොට දිසා වැටලිම් ඒකකය පවසයි.

දිසා වැටලිම් ඒකකයේ නිලධාරින්ට ලැබුණු තොරතුරු අනුව කරන ලද වැටලිම් වලදි හෙරෝයින් මත්ද්‍රව්‍ය ළග තබාගෙන සිටි පුද්ගලයින් 26 දෙනෙකු අත් අඩංගුවට ගෙන ඇත.මොවුන් අතර තිබි සොයා ගන්නා ලද මත්ද්‍රව්‍ය ප්‍රමාණය හෙරෝයින් මිලිග්‍රෑම් 13.035 කි.මිට අමතරව වියලි ගංජා ළග තබා ගත් පුද්ගලයන් තිදෙනෙකුද පොලිස් අත් අඩංගුවට ගෙන ඇත. මොවුන් ළග තිබි වියලි ගංජා මිලිග්‍රෑම් 3800ක්ද පොලිස් අත් අඩංගුවට ගත් බව පොලිස් වැටලිම් ඒකකය පවසයි.

## අන්තර් සමාජ පළමු පෙළ ක්‍රිකට්

# යොවුන් චෙස් ග්‍රෑන්ඩ් ප්‍රී සමස්ත ශූරතාව දිමුත්ට

පළමු ශ්‍රී ලංකා යොවුන් චෙස් ග්‍රෑන්ඩ් ප්‍රී ශූරතාව දිනා ගැනීමට ඩී.එස්. සේනානායක විද්‍යාලයේ දිමුත් ඉන්දීප සමරවීර සමත් වෙයි. ශ්‍රී ලංකා චෙස් සම්මේලන මූලස්ථානයේදී පසුගියදා නිමා වූ මේ තරගාවලියෙන් ශ්‍රී ලංකා චෙස් ඉතිහාසයේ නව පරිච්ඡේදයක් ආරම්භ විය. පළමු වටයේ සිටම ඉතා හොඳින් දස්කම් දැක්වූ දිමුත්ට සුපිරි අවසන් තරගයේදී තම පාසල් සගයා වන සෙනුක අහංගම ලකුණු 1 ½ – ½ පරාජය කිරීමට හැකි විය. එහිදී පළමු වටය ජය පරාජයෙන් තොරව අවසන් වූ අතර, දෙවැනි වටය ජය ගැනීමට දිමුත් ට හැකි විය. ඔහුට ශූරතා කුසලානය, රන් පදක්කම සහ රු. 25,000ක් හිමි විය. අවසන් පූර්ව තරගයේදී ද දිමුත් ඔහුගේ පාසල් සිසුවකු වූ පෙසදු ලියනගේ පරාජය කළේය. ඩී.එස්. සේනානායක විද්‍යාලයේ සෙනුක අහංගම රිදී පදක්කම හා රු. 15,000ක මුදල් ත්‍යාගය දිනා ගත්තේය.

තෙවැනි ස්ථානය සඳහා වන අවසන් මහා තරගයේදී විනුද ෂෙනාල් ගුණතිලක සමග පෙසදු ලියනගේ ජයග්‍රහණය කර තෙවැනි ස්ථානයට පත් වූ අතර, ඔහුට ලෝකඩ පදක්කම සමග රු. 10,000ක් හිමි විය.

චෙස් ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා චෙස් සම්මේලනය විසින් පවත්වන ලද මේ දක්ෂයන්ට පමණක් වෙන් වූ යොවුන් චෙස් ශූරතාවලියට අවුරුදු 14ට අඩු ඉහළම චෙස ක්‍රීඩකයන් 20 දෙනකු සහභාගී වූහ. ප්‍රථම ශ්‍රී ලංකා යොවුන් බාලිකා චෙස් ග්‍රෑන්ඩ් ප්‍රී තරගාවලිය මේ මස 29 වැනි දින ආරම්භ වේ.




ප්‍රථම ශ්‍රී ලංකා යොවුන් චෙස් ග්‍රෑන්ඩ් ප්‍රී ශූරතාව දිනාගත් දිමුත් ඉන්දීප සමරවීර, සෙනුක අහංගම, පෙසදු ලියනගේ හා විනුද ෂෙනාල් ගුණතිලක

# පළඟ ශූරයන් තෝරන තීරණාත්මක තරඟ අද සිට

**නිරෝෂාන් ප්‍රියංකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධාන කරන අන්තර් සමාජ පළමු පෙළ ක්‍රිකට් තරගාවලියේ පළඟ ශූරතා වටය යටතේ පැවැත්වෙන අවසන් තරග අද (22) ආරම්භ වෙයි.

තරගාවලියේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගන්නා කණ්ඩායමට ශූරතාව හිමි වන බැවින් අද ආරම්භ වන තරගවලදී මුවර්ස් ක්‍රීඩා සමාජය සහ මීගමුව ක්‍රීඩා සමාජය කෙරෙහි වැඩි අවධානයක් යොමුව තිබේ. ඒ මේ කණ්ඩායම් දෙක ප්‍රසාද ලකුණු සටහනේදී ලකුණු 3කට අඩු පරතරයක් පවත්වා ගෙන ඇති බැවිනි. මුවර්ස් ක්‍රීඩා සමාජය මේ වන විට ප්‍රසාද ලකුණු 48.89ක් ලබා පෙරමුණේ පසු වන අතර, මීගමුව පිල දෙවැනි ස්ථානයේ පසු වන්නේ ලකුණු 46.29ක් සමගිනි.

පසුගිය සතියේ පැවැති තරගයේදී ද්‍රවිඩ සංගම් පිල පරාජය කරමින් මුවර්ස් පළමු ස්ථානයට පිවිසි අතර, ඔවුන් අද එන්.සී.සී. පිටියේදී තරගාවලියේ සිව් වැනි ස්ථානයේ පසු වන ලන්කන් පිල (30.76) සමගින් තරග වැදීමට නියමිතය. මුවර්ස් පිල හමුවේ ලද පරාජය හේතුවෙන් ද්‍රවිඩ සංගම් පිල දෙවැනි ස්ථානයේ සිට තෙවැනි ස්ථානය දක්වා පහත වැටුණත් ඔවුන්ට ද පළඟ ශූරයන් වීමේ අවස්ථාව ඉතිරිව තිබේ. ද්‍රවිඩ සංගම් පිල අද කෝල්ට්ස් පිටියේදී තරග වදින්නේ දෙවැනි තැන පසු වන මීගමුව කණ්ඩායමට එරෙහිවය. එබැවින් මේ තරගය කෙරෙහි වැඩි දෙනාගේ අවධානය යොමු වනු ඇත.

ප්‍රසාද ලකුණු සටහනේ 5 වැනි තැන සිටින එස්.එස්.සී. සහ අවසන් ස්ථානයේ පසු වන බදුරලිය කණ්ඩායම් අද මොරටුව ද සොයිසා ක්‍රීඩාංගණයේදී තරග වැදීමට නියමිතය. මේ තරගයේ ප්‍රතිඵලය පළඟ ශූරතාවට බලපෑමක් නොවන අතර, අවසන් ස්ථානයට පත් වන කණ්ඩායමට ද මෙවර තරගාවලියෙන් ඉවත් වීමට සිදු නොවනු ඇත. ඒ කොරෝනා වසංගතයෙන් බාධා වීම හේතුවෙන් මෙවර තරගාවලියේදී කණ්ඩායම් උසස් කිරීම් හෝ පහත දැමීම් සිදු නොකිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් තීරණය කර ඇති බැවිනි. මේ තරගාවලියේ මූලික වටයේදී කණ්ඩායම් 14ක් 'ඒ' ශ්‍රේණිය යටතේ 'ඒ' හා 'බී' ලෙස කාණ්ඩ 2කින් තරග වැදුණු අතර, එම කාණ්ඩ දෙකෙහි ප්‍රසාද ලකුණු සටහනේ ඉදිරියෙන් සිටින කණ්ඩායම් 4 බැගින් 'සුපිරි 8' වටයට එක් විය. අනෙක් කණ්ඩායම් හය මේ 'පළඟ' ශූරතාව සඳහා තරග වැදුණි.

### සුපිරි අට

මේ අතර දෙවැනි දිනයට ක්‍රියාත්මක වූ සුපිරි අට වටයේ තරගවලදී ශතක වාර්තා කිරීමට චතුරංග ද සිල්වා (එන්.සී.සී.), රන්දිම විජේසූරිය (බී.ආර්.සී), ජනිත් ලියනගේ (රාගම) සහ රුමේෂ් බුද්ධික (හලාවත) සමත් වූහ.

චතුරංග ද සිල්වා සහ ලහිරු උදර දියත් කළ විශිෂ්ට ඉනිම හේතුවෙන් සී.සී.සී කණ්ඩායම සමග පී.සරා ඕවල් පිටියේ පැවැත්වෙන තරගයේ පළමු ඉනිම සඳහා ලකුණු 467ක් රැස් කිරීමට එන්.සී.සී ක්‍රීඩා සමාජය සමත් විය. සුපිරි අට වටයේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීම සඳහා පැවැත්වෙන මේ තීරණාත්මක තරගය අද නිමාවට පත්වීමට නියමිතය.

චතුරංග ද සිල්වා ඊයේ ලකුණු 159ක් රැස් කළේ සිය පළමු පෙළ තරග දිවියේ හොඳම ඉනිම සටහන් කරමිනි. 10 වැනි පළමු පෙළ ශතකය වූ මේ සඳහා පන්දු 229කදී හතරේ පහර 15ක් සහ හයේ පහරක් ඇතුළත් විය. ඊට පෙර පෙරේදා තරගයේ පළමු දිනයේ ලහිරු උදර ලකුණු 111ක් රැස් කළේ මේ තරගාවලියේ සිව් වැනි ශතකය ලෙසිනි.

සිය පළමු පෙළ තෙවැනි ශතකය වාර්තා කිරීමට 22 හැවිරිදි රන්දිම විජේසූරිය සමත් වූයේ සැරසන්ස් ක්‍රීඩා සමාජයට එරෙහිවය. පෙරේදා තරගය නතර කරන විට නොදැවී ලකුණු 64ක් ලබා සිටි ඔහු ඊයේ තවත් ලකුණු 45ක් එක් කර ගැනීමට සමත් විය. ඔහුට අනගි සහයක් ලබා දුන් ශානුක දුලාජ් ලකුණු 94ක් ඉනිමට එක් කළේය.

යුද හමුදා පිලට එරෙහිව සී.සී.සී පිටියේදී ප්‍රබල ඉනිමක් දියත් කළ රාගම ක්‍රීඩා සමාජය (511/9 ඉනිම අත්හිටුවන ලදි) වෙනුවෙන් ජනිත් ලියනගේ ශතකය වාර්තා කළ අතර, කෝල්ට්ස් පිල සමග එස්.එස්.සී පිටියේ පැවැත්වෙන තරගයේදී රුමේෂ් සිය ශතකය වාර්තා කළේය.



චතුරංග ද සිල්වා



# බංග්ලාදේශ ටෙස්ට් සංචිතය නම් කිරීම ශ්‍රී ලංකාවේදී

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සමග පැවැත්වෙන ටෙස්ට් තරගාවලිය සඳහා වන බංග්ලාදේශ සංචිතය නම් කිරීම පුහුණු තරගවලින් අනතුරුව සිදු කරන බව එරට ක්‍රිකට් තේරීම් කමිටුවේ ප්‍රධානී මින්හාජුල් අබේඩීන් මහතා පවසයි.

තරගාවලියට එක් වන මූලික සංචිතය ලබන මස 28 වැනිදා ශ්‍රී ලංකාවට පැමිණීමට බලාපොරොත්තු වන අතර, ඔවුන් මෙරටදී පුහුණු තරග පැවැත්වීමට සැලසුම් කර තිබේ.

කොරෝනා වසංගතය හේතුවෙන් මාස පහකට අධික කාලයක් තම ක්‍රීඩකයන් ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඉවත්ව සිටීම නිසා ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතාව පිළිබඳ තේරීම් කමිටුවට අවබෝධයක් නොමැති වීම අවසන් සංචිතය නම් කිරීමට බාධාවක් වී ඇති බව ද අබේඩීන් මහතා කියයි.

මේ සංචාරය සඳහා ක්‍රීඩකයන් 20-22ක් අතර, සංඛ්‍යාවක් තෝරා ගැනීමට නියමිත අතර, ඔවුන් සැප්තැම්බර් මස 21 වැනිදා සිට එරටදී සතියක පුහුණු කඳවුරට එක් වෙති.

"අප සිම්බාබ්වේදී ටෙස්ට් තරගාවලියක් ක්‍රීඩා කළත් ඉන් පසු කිසිම තරගයක් ක්‍රීඩා කර නැහැ. පුහුණුවීම් පවා කළේ නැහැ. ඒ නිසා ක්‍රීඩකයන් තෝරා ගනිද්දී අපට ඔවුන්ගේ අත්දැකීම්වලට වැඩි ඉඩක් ලබා දෙන්න වෙනවා" කී අබේඩීන් මහතා "දැනට අප ක්‍රීඩකයන් 20ත්, 22ත් අතර, ප්‍රමාණයක් එක්ක ශ්‍රී ලංකාවට යනවා. එහිදී පුහුණු තරග රැසකට සහභාගී වෙන්න සැලසුම් කරලා තියෙනවා. එම පුහුණු තරගවලින් පස්සේ අපගේ අවසන් සංචිතය නම් කරනවා. ඒ නිසා අප අපගේ ප්‍රධාන සංචිතය නම් කරන්නේ ලංකාවට ගියාට පස්සේ." යැයි ද කියා සිටියේය.

ශ්‍රී ලංකාවේදී පැවැත්වෙන පුහුණු තරග ඉතා වැදගත් බවත්, කොරෝනා වසංගතය හේතුවෙන් ලද විවේකය නිසා ක්‍රීඩකයන්ගේ මානසික මට්ටම මෙන්ම ඔවුන්ට සාමාන්‍ය ක්‍රීඩා රටාවට පැමිණීමට හැකි ද යන්න බැලිය යුතු බවත් ජාත්‍යන්තර තරග සඳහා එය වැදගත් බවත් ඔහු කියයි.

බංග්ලාදේශ ක්‍රිකට් ආයතනය එරටදී පැවැත්වීමට සැලසුම් කර ඇති පුහුණු සැසිය සඳහා ක්‍රීඩකයන් 38 දෙනෙකුගෙන් යුත් මූලික සංචිතයක් නම් කර ඇත.

මේ අතර, බංග්ලාදේශ කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර අදියර 3ක් යටතේ කොරෝනා පරීක්ෂණ සිදු කිරීමටත් එරට ක්‍රිකට් ආයතනය සැලසුම් කර තිබේ.

ඒ අනුව පළමු පරීක්ෂණය සැප්තැම්බර් 18 වැනිදා ක්‍රීඩකයන්ගේ නිවාස වෙත ගොස් සිදු කිරීමට සැලසුම් කර ඇති අතර, දෙවැනි පරීක්ෂණය 21 වැනිදා සිදු කෙරේ. අනතුරුව කණ්ඩායම ශ්‍රී ලංකාවට පිටත්වීමට පෙර අවසන් පරීක්ෂණය සිදු කෙරෙනු ඇත. පළමු කොරෝනා පරීක්ෂණයෙන් අනතුරුව සැප්තැම්බර් 20 වැනිදා වන විට සියලු ක්‍රීඩකයන් එක් හෝටලයට ගෙන්වා ගැනීමට නියමිතය. අනතුරුව 21 වැනිදා පුහුණු කඳවුර ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

කෙසේ වෙතත් මේ ක්‍රීඩකයන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව ද පීසීආර් පරීක්ෂණවලට ලක් කිරීමට නියමිතය.




## 42 වන ඔබ්සවර් - මොබිටෙල්

### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..........
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..........

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : ..........
ඔබේ නම : ..........
ලිපිනය : ..........
ජංගම දුරකථන අංකය : ..........

SUNDAY OBSERVER

**vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.**

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-08-22 **අංකය** 24




# ලොව අංක දෙකේ ක්‍රීඩිකාවත් අමෙරිකා නොයයි

ටෙනිස් පිටියේ ලෝක ශ්‍රේණිගත කිරීම්වල දෙවැනි ස්ථානයේ පසු වන රුමේනියාවේ සිමෝනා හැලෙප් ද මේ මස 31 වැනිදා අමෙරිකාවේ නිව්යෝක් නුවරදී ආරම්භ වීමට නියමිත අමෙරිකානු විවෘත ටෙනිස් ශූරතාවලියට එක් නොවීමට තීරණය කරයි.

"මම නිතරම මගේ සෞඛ්‍ය ගැන හිතනවා" ඇය පැවසුවාය. විම්බල්ඩන් ශූරී 28 හැවිරිදි හැලෙප් තවදුරටත් මෙසේ පැවැසීය. "ඊට සම්බන්ධ සියලු සාධක සහ අප ජීවත්වන සුවිශේෂී තත්ත්වයන් සැලකිල්ලට ගෙන, මම සංචාරය නොකිරීමට තීරණය කළා."

දෙවරක් ග්‍රෑන්ඩ් ස්ලෑම් ශූරතාව දිනා ගත් සිමෝනා පසුගිය ඉරිදා ප්‍රාග් විවෘත ශූරතාව ද දිනා ගත්තාය. ඇය පවසන්නේ ප්‍රංශ විවෘත තරගාවලිය ලබන මස 27 වැනිදා ආරම්භ වීමට නියමිත බැවින් යුරෝපයේ රැඳී සිටිමින් පුහුණු වීම් කටයුතු සිදු කරන බවයි. සිමෝනා කොරෝනා වසංගතයේ අවදානම හේතුවෙන් මේ අමෙරිකානු ග්‍රෑන්ඩ් ස්ලෑම් තරගාවලියෙන් ඉවත් වන හයවැනි ප්‍රධාන පෙළේ ක්‍රීඩිකාවයි.

ඇයට පෙර ලෝක ශ්‍රේණිගත කිරීම්වල මුල් 10 දෙනා අතර, පසු වන වත්මන් ශූරී බියන්කා ඇන්ඩ්‍රෙස්කු (6), ලොව අංක එකේ ක්‍රීඩිකාව වන අෂ්ලෙයි බාර්ටි, යුක්රේනයේ එලීනා ස්විටොලිනා (5), නෙදර්ලන්තයේ කිකි බර්ටෙන්ස් (7) සහ ස්විට්සර්ලන්තයේ බෙලින්ඩා බෙන්සික් (8) ද තරගාවලියට ක්‍රීඩා නොකිරීමට තීරණය කර තිබිණි.

2018 ශූරී ජපානයේ නයෝමි ඔසාකා, ඔස්ට්‍රේලියානු විවෘත ශූරී එක්සත් ජනපදයේ සොෆියා කෙනින් සහ සෙරීනා විලියම්ස් සමග චෙක් ජනරජයේ ලෝක අංක 3 ක්‍රීඩිකා කැරොලිනා ප්ලිස්කෝවා නිව්යෝක් නුවර ක්‍රීඩා කිරීමට කැමැත්ත පළ කර තිබේ.






මේ මස අගදී ශ්‍රී ලංකා රග්බි ආයතනයේ සභාපති ධූරයෙන් නික්ම යන ලසිත ගුණරත්න මහතා, රග්බි කණ්ඩායමේ ප්‍රධාන අනුග්‍රාහකයා ලෙස කටයුතු කරන ඩයලොග් ආසියාටා සමාගමට සිය කෘතවේදීත්වය පළ කරමින් සමරු තිළිණ පිරිනැමීම පසුගියදා ඩයලොග් ආයතනයේදී සිදු කෙරිණි. ලසිත ගුණරත්න මහතා රග්බි ආයතනයේ උප සභාපතිවරයා ලෙස කටයුතු කළ වසර 2012දී ඩයලොග් ආසියාටා සමාගම රග්බි කණ්ඩායමේ ප්‍රධාන අනුග්‍රාහකයා බවට පත් වූ අතර, ඔහු සභාපතිවරයා ලෙස කටයුතු කළ පසුගිය වසර දෙක තුළදී රග්බි ආයතනය සමග ඉතා සමීපව කටයුතු කිරීම වෙනුවෙන් ද, ක්‍රීඩාව වෙනුවෙන් දැක්වූ දායකත්වය අගයමින් ද මේ සමරු තිළිණ ප්‍රදානය සිදු කෙරිණි. ඩයලොග් ආසියාටා සමාගමේ සමූහ ප්‍රධාන විධායක නිලධාරී සුපුන් වීරසිංහ මහතාට සහ එම සමාගමේ සමූහ ප්‍රධාන අලෙවි නිලධාරිනී අමලී නානායක්කාර මහත්මියට සමරු තිළිණ පිරිනැමීම ලසිත ගුණරත්න මහතා අතින් සිදු කෙරිණි.

# නරේන් යළිත් ට්‍රිනිබෑගෝ දිනවයි

පිට පිට දෙවැනි අර්ධ ශතකය රැස් කරමින් සුනිල් නරේන් දැක්වූ දස්කම් හේතුවෙන් බටහිර ඉන්දීය කොදෙව්හිදී පැවැත්වෙන කැරිබියන් ප්‍රිමියර් ලීග් (සීපීඑල්) ක්‍රිකට් තරගාවලියේ දෙවැනි ජය අත් කර ගැනීමට ට්‍රිනිබෑගෝ නයිට් රයිඩර්ස් කණ්ඩායම සමත් විය.

තරගාවලියේ 6 වැනි තරගය ලෙස ට්‍රිනිඩෑඩ්හිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් ජැමෙයිකා ටලාවාස් පිල ලකුණු 135කට නතර කළ ට්‍රිනිබෑගෝ ක්‍රීඩකයෝ කඩුලු 7ක් දැවී තිබියදී ජය හිමිකර ගත්තේ පන්දු 11ක් ද ඉතිරි කර ගනිමිනි.

තරගයේ වීරයා වූ ට්‍රිනිබෑගෝ කණ්ඩායමේ ආරම්භක පිතිකරු සුනිල් නරේන් මේ තරගාවලියේ දෙවැනි අර්ධ ශතකය ලෙස ලකුණු 53ක් රැස් කළේය. හතරේ පහර 7ක් සහ හයේ පහර 2කින් ඉනිම වර්ණවත් කර ගත් ඔහු ඒ සඳහා වැය කළේ පන්දු 38ක් පමණි. කොලින් මුන්රෝ පන්දු 49කදී හතරේ පහර 5ක් සහ හයේ පහර 2ක් සමගින් නොදැවී ලකුණු 49ක් රැස් කළ අතර, දෙදෙනා එක්ව දෙවැනි කඩුල්ලට ගොඩනැගූ සබඳතාව ලකුණු 75කි.

ග්ලේන් පිලිප්ස් ලකුණු 58ක් රැස් කරමින් පළමුව පන්දුවට පහර දුන් ජැමෙයිකා පිලේ වැඩිම ලකුණුලාභියා විය. පන්දු 42කට මුහුණ දුන් ඔහු හතරේ පහර 5ක් සහ හයේ පහර 4ක් එල්ල කර තිබිණි.

# 'බලපිටිය ටී10' ක්‍රිකට් අද ඇරැඹේ

**කරන්දෙණිය සමූහ**
**අනුරාධ ප්‍රියදර්ශන**

බලපිටිය සුපර් ක්‍රීඩා සමාජය පළමු වරට සංවිධාන කරන 'බලපිටිය ටී10' සුපර් ලීග් විවෘත ක්‍රිකට් තරගාවලිය අද (22) බලපිටිය ගුරු විදුහල් ක්‍රීඩාංගණයේදී ආරම්භ වේ.

ලබන මස 6 වැනිදා දක්වා පැවැත්වෙන තරගාවලියට දිවයිනේ ක්‍රිකට් ක්‍රීඩා සමාජ 32ක කණ්ඩායම් සහභාගී වන අතර, මේ කණ්ඩායම් කාණ්ඩ අටක් යටතේ ලීග් ක්‍රමයට තරග වැදීමට නියමිතය.

මේ තරගාවලියේ එක් කණ්ඩායමකට ක්‍රීඩා කිරීමට ලැබෙන ඕවර සංඛ්‍යාව දහයකි. තරගාවලිය කොරෝනා මර්ධන නීතිරීති යටතේ පැවැත්වෙන බව බලපිටිය සුපර් ක්‍රීඩා සමාජය පවසයි.

තරගාවලියේ ශූරතාව දිනා ගන්නා කණ්ඩායමට අලගියාහන්දි මර්තින් ද සිල්වා සහ හක්කිනි මියුලින්නෝනා අනුස්මරණ ශූරතා කුසලානය සමග රුපියල් 200,000ක මුදල් ත්‍යාගයක් ද, අනු ශූරයන්ට හක්කිනි බේඩින් ද සිල්වා අනුස්මරණ කුසලානය සමග රුපියල් 100,000ක මුදලක්ද පිරිනැමෙන අතර, අවසන් තරගයේ වීරයා, තරගාවලියේ දක්ෂතම පිතිකරු, දක්ෂතම පන්දු යවන්නා සහ තරගාවලියේ වීරයාට රුපියල් 10,000 බැගින් පිරිනැමෙන බව තරගාවලිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා පසුගියදා බලපිටිය රිවර් ප්ලේස් හෝටලයේ පැවැති මාධ්‍ය හමුවේදී සංවිධායකයෝ පැවැසූහ.

ව්‍යාපාරික අලගියාහන්දි කුමාර රත්න මහතා තරගාවලියේ ප්‍රධාන අනුග්‍රාහකයා ලෙස කටයුතු කරයි. මේ අවස්ථාවට බලපිටිය සුපර් ක්‍රීඩා සමාජයේ සභාපති චමින්ද ගුණතිලක, ලේකම් ගයාන් ගුණවර්ධන, විධායක කමිටු සාමාජික හා බලපිටිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ මහවැලි, ප්‍රධාන අනුග්‍රාහක අලගියාහන්දි කුමාරරත්න, සහාය අනුග්‍රාහක චලන හෙට්ටියාහන්දි මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.



'බලපිටිය ටී10' සුපර් ලීග් ක්‍රිකට් තරගාවලියේ ශූරතා හා අනුශූරතා කුසලාන එළි දැක්වූ අවස්ථාව. ඡායාරූපය - කරන්දෙණිය සමූහ

වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 22 වැනිදා සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.